# වාර්ෂික වාර්තාව
# 2023



**සී/ස හලාවත වැවිලි සමාගම**
சிலாபம் பெருந்தோட்ட நிறுவனம்
CHILAW PLANTATIONS LTD

රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය
அரச பெருந்தோட்ட தொழில்முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரவை அந்தஸ்து அல்லாத அமைச்சு
NON CABINET MINISTRY OF STATE PLANTATION ENTERPRISE REFORMS

## අන්තර්ගතය


| | |
|---|---|
| දැක්ම සහ මෙහෙවර | 02 |
| මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා | 03 |
| සභාපතිතුමන්ගේ පණිවිඩය | 04 - 05 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 06 - 08 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 09 |
| කළමනාකරණ විමසුම | 10 - 20 |
| මූල්‍ය සමාලෝචනය | 21 - 25 |
| ආයතනික පාලන ප්‍රකාශය | 26 |
| අවධානම් කළමනාකරණය | 27 - 29 |
| විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව | 30 |


## මූල්‍ය වාර්තා


| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 31 - 34 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය | 35 |
| විගණකාධිපති වාර්තාව | 36 - 39 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 40 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 41 |
| ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 42 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 43 |
| ගිණුම්කරණ, ප්‍රතිපත්ති සහ සටහන් | 44 - 78 |
| දස වසරක සාරාංශය | 79 |
| වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය | 80 |
| පෙරකලාසි අයදුම් පත | 81 |
| ආයතනික විස්තරය | 82 |

## දැක්ම

පොල් කර්මාන්තයේ තිරසර
සංවර්ධනය මඟින්
ශ්‍රී ලංකා ආර්ථිකයට උපරිම
දායකත්වයක් ලබාදීම

## මෙහෙවර

පොල් පාදක කර්මාන්තයේ
තිරසාර සංවර්ධනය සඳහා
තමන් සතු සීමිත සම්පත්
ඵලදායී ලෙස හා කාර්යක්ෂම
ලෙස භාවිත කරමින් පිළිගත්
ප්‍රතිපත්ති මඟින් සේවකයන්ගේ
සහ මහජනතාවගේ ජීවන
තත්ත්වය නංවාලීම

## අගයන්

අවංක බව
අඛණ්ඩතාව
විනිවිදභාවය
නායකත්වය
කණ්ඩායම් හැඟීම
සවිබල ගැන්වීම
නව්‍යකරණය
වෘත්තීයභාවය
වගකීම සහ වගවීම

# මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා

| | 2023 | 2022 | වෙනස (%) |
|---|---|---|---|
| පොල් නිෂ්පාදනය ගෙඩි '000 | 11,729 | 15,172 | (22.69) |

| සාරාංශ ප්‍රතිඵල | රු.000 | රු.000 | % |
|---|---|---|---|
| අයභාරය | 899,694 | 975,106 | (8) |
| දළ ලාභය | 227,783 | 454,166 | (50) |
| පොලිය සහ බදු පෙර ලාභය | 126,873 | 421,700 | (70) |
| බදු පෙර ලාභය | 302,606 | 513,881 | (41) |
| බදු පසු ලාභය | 231,738 | 493,470 | (53) |
| මුළු විස්තීර්ණ ආදායම් | 209,549 | 513,971 | (59) |
| රඳවාගත් ලාභය | 2,179,602 | 2,155,053 | 1 |

| මූල්‍ය තත්වය | | | |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | 1,590,941 | 1,476,523 | 8 |
| මේරු/නොමේරු වගා | 1,100,977 | 1,039,764 | 6 |
| ජංගම වත්කම් | 1,456,651 | 1,413,509 | 3 |
| තොග | 148,934 | 195,288 | (24) |
| කෙටි කාලීන ආයෝජන (ස්ථාවර තැන්පතු) | 1,090,243 | 985,661 | 11 |
| මුළු වත්කම් | 3,047,593 | 2,890,032 | 5 |
| ජංගම වගකීම් | 408,540 | 362,575 | 13 |
| ජංගම නොවන වගකීම් | 259,450 | 172,404 | 50 |
| කොටස් ප්‍රග්ධනය | 200,000 | 200,000 | - |
| කොටස් කරුවන්ගේ අරමුදල් | 2,379,602 | 2,355,053 | 1 |

| මූලික දර්ශක | වාර/% | වාර/% | වෙනස/% |
|---|---|---|---|
| ජංගම අනුපාතය (වාර) | 3.57 | 3.90 | (9) |
| ක්ෂණික අනුපාතය (වාර) | 3.20 | 3.36 | (5) |
| දළ ලාභ අනුපාතය | 25.32 | 46.58 | (46) |
| කොටසක ඉපයීම රු. | 11.59 | 24.67 | (53) |
| සාමාන්‍ය ස්කන්ධයට ආපසු ලැබීම් (ROE) % | 9.79 | 23.08 | (58) |
| ප්‍රාග්ධන යෙදවීමට ආපසු ලැබීම් (ROCE) % | 4.81 | 16.68 | (71) |
| ණයගැති අනුපාතය | 0.22 | 0.19 | 18 |
| කොටස් කරුවන්ගේ අරමුදල් අනුපාතය % | 78.08 | 81.49 | (4) |
| පොලි ආවරණය වාර | 2.06 | 9.65 | (79) |

හලාවත වැවිලි සමාගම පසුගිය වසර තුන තුල අඛණ්ඩව ඉහලම ලාභයක් වාර්තා කල අතර 2023 වසර සමාගමට තවත් අභියෝගාත්මක වසරක් විය. 2023 වර්ෂය හලාවත වැවිලි සමාගමට අභියෝගාත්මක වසරක් වූයේ සමාගම පසුගිය වසර තුන තුල අඛණ්ඩව ඉහලම ලාභයක් වාර්තා කිරීමට සමත් වූ බැවිනි. මෙම පසුබිම තුල, 2023 මූල්‍ය වර්ෂයට අදාලව ආයතනයේ ප්‍රගතිය පිලිබඳ කෙටි ආවර්ජනයක් මේ සමග ඉදිරිපත් කරමු.

පසුගිය වසර තුන තුළ වැවිලි සමාගම ලබාගත් අඛණ්ඩ ප්‍රගතිය අභිබවායමින් මෙම වසර සාර්ථක කර ගැනීම අපගේ අපේක්ෂාව වූ අතර පැවති ආර්ථික හා සාමාජීය තත්ත්වයන් ද සැලකිල්ලට ගනිමින් එම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සමාගම මෙහෙය වීම අභියෝගාත්මක තත්ත්වයක් විය. රට ආර්ථික අර්බුදයෙන් ගොඩ එමින් සිටියද, රටේ ආර්ථික පරිසරය තුල නිරන්තර උච්චාවචනයන් පැවතීම හේතුවෙන් ආනයන සීමාකිරීම් සහ වෙළඳපල අස්ථාවරත්වයන් තවදුරටත් පැවතුනි. මෙම සියළු අභියෝග මධ්‍යයේ උවද 2023 වර්ෂය හලාවත වැවිලි සමාගමට හිතකර වසරක් බවට පත්කිරිමට හැකි වීම ප්‍රශංසනීය වේ.

### කෘෂිකාර්මික ප්‍රගතිය

**පොල් වගාව.**

වසර තුළ ඉපයූ සමස්ථ ආදායමින් රුපියල් මිලියන 756.6 ක් පොල් වගාව තුලින් උපයා ඇත. වැවිලි සමාගම මඟින් සිදුකරන ලද උපායශීලි කළමනාකරණ ක්‍රමෝපායන් හා හැකි සෑම අවස්ථාවකම සිදුකරන ලද යහපත් කෘෂිකාර්මික චත්පිළිවෙත් හේතු කොටගෙන පසුගිය වසර කිහිපය තුළදී පැවති දැඩි පොහොර හිඟය හේතුවෙන් පොහොර යෙදීම අවම වීම හා කාළගුණික විපර්යාසයන්ට මුහුණ දෙමින් වර්ෂය තුල ප්‍රසස්ථ ආදායමක් පොල් අස්වැන්න තුළින් උපයා ගත හැකි විය. පොල් වලින් ඉපැයූ දළ ලාභය රු. මිලියන 212.2 ක් වන අතර එය මුළු දළ ලාභයෙන් 93% පමණ වේ. මෙය සමාගම් ඉතිහාසය තුල තුන්වැනියට ඉපයූ ඉහලම ලාභය වේ.

දිවයින පුරා පැවති වසංගත තත්ත්වයක් වන සුදුමැස්සාගේ හානිය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය සියළු පියවරයන් කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ අතර උවදුර හඳුනා ගනිමින් අවශ්‍ය දැනුවත්කිරීම් හා පුහුණු සැසි ඉතා ඵලදායී ආකාරයෙන් සංවිධානය කෙරිණි. ඒ හේතුව නිසා හලාවත වැවිලි සමාගමෙහි සුදු මැස්සාගේ ක්‍රියාකාරිත්වය හේතුවෙන් ආර්ථිකමය වශයෙන් හානිදායක තත්ත්වයක් වසර තුළ ඇති නොවුණි.

යටි වගාවන් හා නව වගාවන් නඩත්තු කිරීම හා ස්ථාපනය කිරීම ප්‍රශස්ථ මට්ටමෙන් සිදු කරන ලද අතර වසර තුළ පැළ 9700 ක් පමණ සිටුවනු ලැබීය. එමෙන්ම නව /යටි වගාවන් අක්කර 158 ක් පමණ වර්ෂය තුළ සිදු කරන ලදි. රු. මිලියන 55.3 ක් පමණ ප්‍රාග්ධන වියදමක් වසර තුළ පොල් නව වගා හා යටි වගා ස්ථාපිත කිරීම හා පවතින නොමේරූ වගා නඩත්තු කටයුතු සඳහා වැය කර ඇත. වර්ෂය තුළ සමාගම නඩත්තු කරමින් පැවති මුළු නොමේරූ පොල් වගා භූමි ප්‍රමාණය අක්කර 928 කි. දිවයිනේ පොල් කර්මාන්තයේ උන්නතිය සඳහා මෙම වගාවන් ස්ථාපිත කිරීම තුලින් සමාගම දායක විය.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙතින් කිලිනොච්චි ප්‍රදේශයයේ පිහිටි හෙක්ටයාර් 269 ක ඉඩම් වසර 30 ක කාලයක් සඳහා කල්බදු පදනම යටතේ පවරා ගැනීමෙන් පසු උතුරු ප්‍රදේශයේ ක්‍රියාත්මක වන එකම ප්‍රාදේශීය වැවිලි සමාගම බවට හලාවත වැවිලි සමාගම පත් විය. මෙම අත්පත් කර ගැනීමත් සමඟ හලාවත වැවිලි සමාගමේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 5723 ක සිට හෙක්ටයාර් 5992 ක් දක්වා වර්ධනය වී ඇත.

### විශේෂ ව්‍යාපෘති

හලාවත වැවිලි සමගම සියලු විභවයන්ගෙන් උපරිම ඵලදායීතාවයන් අත්කර ගැනීමට කටයුතු ආරම්භ කර ඇති අතර ඒ යටතේ බද්ධ ව්‍යාපාරයක් ලෙස මෙගාවොට් 10 ක සූර්ය බල ව්‍යාපෘති දෙකක් ස්ථාපිත කිරීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජකයෙකු තෝරාගැනීමට හැකිවිය.

තවද, ජාත්‍යන්තර වෙළඳපොල කේන්ද්‍ර කරගනිමින් පෞද්ගලික අංශයේ ආයෝජකයෙකු සමග බද්ධ ව්‍යාපාරයක් ලෙස පොල් ආශ්‍රිත අගය එකතු කල ඒකාබද්ධ පොල් සැකසුම් කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.

### බිංදු ජල ව්‍යාපෘතිය

දැඩි වියලි කාළගුණයක් සහිත පුත්තලම දිස්ත්‍රික්කය තුළ වැඩිවශයෙන් වතු පිහිටා ඇති අප සමාගම මුහුණ දෙන ප්‍රධානම ගැටළුවක් ලෙස වගාව සඳහා ජල ඌනතාවය හඳුනාගෙන ඇත. එකී ජල ඌනතාවයට සාර්ථකව මුහුණදීම සඳහා ආරම්භයක් ලෙස සෑම වතු කලාපයකම අක්කර 25ක පමණ පොල් වගා භූමියේ බිංදු ජල සම්පාදන ක්‍රම ස්ථාපනය කිරීම ආරම්භ කර ඇත. 2022 වසරේ මංගලඑළිය හා තම්බපණ්ණි වතු කොට්ඨාශ තුළ එම යෝජිත බිංදු ජල ව්‍යාපෘතීන් ස්ථාපිත කරන ලද අතර 2023 වර්ෂයේදී පලුගස්වැව හා මාදම්පේ වතු කලාප වල බිංදු ජල ව්‍යපෘති ස්ථාපිත

කරන ලදී. මෙම කාර්යය සිදුකිරීමේදී අභියෝග රැසකට මුහුණදීමට සිදු වූ අතර අප පොල් වගාව සඳහා නිසි වාරි පද්ධතියක් නිර්මාණය කිරිමේ අරමුණ පෙරදැරිව මෙම කාර්යය ඉදිරි වසරේදි ද සිදුකිරීමට කටයුතු යොදා ඇත.

## අතුරු භෝග වගාව

පසුගිය වර්ෂයේ ඉපයූ රුපියල් මිලියන 10 ක ලාභයට සාපේක්ෂව 2023 වර්ෂයේදී සමාගම කජු වගා ව්‍යාපෘතිය තුලින් රුපියල් මිලියන 17 ක ලාභයක් වාර්තා කර ඇත. එයට අමතරව හලාවත වැවිලි සමාගම ප්‍රධාන අතුරු බෝග ලෙස ඩ්‍රැගන් ෆෘට්, කුරුඳු, රඹුටන්, ගම්මිරිස්, අඹ යන වගාවන් ස්ථාපිත කර ඇත. ඒ තුලින් සමාගම සැලකිය යුතු ලාභයක් උපායා ගනී.

## අනෙකුත් ව්‍යාපෘති

මී කිරි, යෝගට්, ගිතෙල් සහ අනෙකුත් කිරි ආශ්‍රිත අගය එකතු කල නිෂ්පාදනයන් සිදු කිරීම සඳහා පළුගස්වැව වතු කලාපය තුල මීගව ව්‍යපෘතිය ස්ථාපිත කර ඇත. පළුගස්වැව වතු කලාපය තුල ස්ථාපිත කර ඇති කජු සැකසුම් මාධ්‍යස්ථානය හා පොල්තෙල් නිෂ්පාදනාගාරය ද සාර්ථක ලෙස ක්‍රියාත්මකව ඇති අතර ඒ තුලින් පාරිභෝගිකයන් වෙත ඉහල ගුණත්වයෙන් යුතු නිෂ්පාදන ලබා දිය හැකි විය. තවද අපගේ නිෂ්පාදන අලෙවි නියෝජිතයන් සහ අපගේම අලෙවිසැල් හරහා සාමාන්‍ය ජනතාව අතර බෙදා දෙන ලදී.

## සේවක සුභසාධනය හා සමාජ සත්කාරය

වැවිලි සමාගම තුළ සේවය කරන සේවක ප්‍රජාව උදෙසා පසුගිය වසරවල ආරම්භ කරනු ලැබූ සේවක සුභසාධන වැඩපිළිවෙලවල් ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යනු ලැබූ අතර, සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාපනය හදාරණ පාසල් දරුවන්ගේ අධ්‍යාපන කුසලතා ඉහළ නැංවීම සඳහා පසුවිපරම් කිරීමත් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන්/අය හඳුනාගෙන ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැපයීම මගින් ඉදිරි අනාගතය සාර්ථක කර ගැනිම සඳහා අවශ්‍ය කටයුතු තවදුරටත් සිදුකරනු ලැබිණ.

හලාවත වැවිලි සමාගම විවිධ සමාජ සංවර්ධන අරමුණු ඉලක්ක කර ගනිමින් අතීතයේ දී මෙන් පහත සඳහන් සමාජ සුභසාධාන කටයුතු සිදුකරන ලදී.

- වැවිලි සමාගම සතු නිෂ්පාදන සහන මිලට මහජනතාවට ලබාදීම.
- භෝග වගා කිරිම සඳහා බදු පදනම මත වාර්ෂිකව ඉඩම් ලබාදීම.
- සියලු ආගම් නියෝජනය වන පරිදි ආගමික ස්ථාන සඳහා පොල් පැළ ආදිය ලබාදීම සිදුකරනු ලැබිණ.
- රටතුල පොල් ගස් ගහනය ඉහල නැංවීමේ අරමුණින් ජනතාව අතර පොල් පැල බෙදාදීම.

මෙසේ වගකිවයුතු රාජ්‍ය ආයතනයක් ලෙස ආයතනයේ දියුණුව, පොල් වගාවේ උන්නතිය, ප්‍රදේශයේ මහජනතාවගේ සුභසිද්ධිය හා සම්පත් වලින් උපරිම ඵලදායිතාවයක් ලබාගැනීම වැනි කරුණු වලට මූලිකත්වය ලබා දෙමින් රට ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටින අවස්ථාවක හා බොහෝ රාජ්‍ය ආයතන ආර්ථිකමය වශයෙන් හොදින් ක්‍රියාත්මක නොවන අවස්ථාවක හලාවත වැවිලි සමාගම නැවත වතාවක් අඛණ්ඩව ලාභ ලබාගැනීමට සමත්වීම අප ලද ජයග්‍රහණයක් සේ සලකමු.

ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය ආරම්භ කිරිමෙන් පසු ප්‍රථම වරට 2023 වාර්ෂික ගිණුම් වාර්තා සඳහා විගණකාධිපතිවරය වෙතින් සත්‍ය හා සධාරණ විගණන මතයක් ලබාගැනීමට සමාගමට හැකි විය.

## තුති පිදුම

සමාගමක් ලෙස අපගේ සාර්ථකත්වය උදෙසා නිරන්තර මගපෙන්වීම්, උපදෙස් හා සහයෝගය ලබාදීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාට මාගේ කෘතඥතාවය පුදකර සිටිමි.

තවද, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය එම්.එම්.එස්.එස්.බී. යාලේගම මැතිතුමාත් අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරීන්ගේ ද සහය මෙහිදි සිහිපත් කරනු ලබන අතර හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිවැරදි තීරණ ගැනිමේ ක්‍රියාවලියේ දී දැක්වූ අතිවිශේෂ සහයෝගය හා කැපවීම ඉතා අගය කොට සලකමු.

අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලද සහයෝගය විශිෂ්ඨ වූ බැවින් අප ආයතනයට මෙම ඉලක්ක කරා ළගාවීම පහසු වූ අතර එම කාර්යයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයන් දැක්වූ සහයෝගය හා සහභාගිත්වය ඉතාමත් කෘතඥපූර්වකව සිහිපත් කරමු.

තවද, වැවිලි සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයේ සියලුම නිලධාරි මහතුන්, වතු අධිකාරි මහතුන්, අනෙකුත් සෑම අංශයන්හි සේවක මණ්ඩල සාමාජික සාමාජිකාවන්, සැපයුම්කරුවන්, ගැණුම්කරුවන් ඇතුළු සියලු දෙනාගේ දායකත්වය හා සහයෝගය ආයතනයේ ප්‍රගතිය හා උන්නතිය සදහා ඉවහල් වූ බවත් ඒ වෙනුවෙන් මාගේ අවංක ආදරය හා හදපිරි ස්තූතිය පුදකර සිටිමි.



**ජූඩ් රුකාන්ත පෙරේරා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
හලාවත වැවිලි සමගම

## අධ්‍යක්ෂ මණ්ඩලය



**ගරු ජූඩ් රූකාන්ත පෙරේරා මහතා**
(B.A, M.A, H.S.D.)
සභාපති / ප්‍රධාන විධායක නිළධාරී

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ සභාපති/ ප්‍රධාන විධායක නිළධාරී ලෙස ගරු ජූඩ් රූකාන්ත පෙරේරා මහතා 2020 ජනවාරි 01 වන දින පත් කරන ලදී.

එතුමා ගෞරවනීය නීතිඥ පවුලකින් පැවත එන අතර, ඔහු කොළඹ විශ්වවිද්‍යාලය, ඇක්වයිනාස් විශ්ව විද්‍යාලය, සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ අතර ශාස්ත්‍රවේදී උපාධියක් මෙන්ම ශාස්ත්‍රපති උපාධියක්ද ලබා ඇත. එසේම ඔහු ඇමරිකානු ක්ෂේත්‍ර සේවාවල ශිෂ්‍යත්ව ජයග්‍රාහකයෙක් ද විය. ගරු ජූඩ් රූකාන්ත පෙරේරා මහතා කෑගල්ල හිටපු නගරාධිපතිවරයෙකු වූ අතර කෑගල්ල නගර සභාව ශ්‍රී ලංකාවේ හොඳම නගර සභාව ලෙස ඔසවා තැබීමට සමත් විය. පසුගිය වර්ෂ පුරාවට අමාත්‍යාංශ රැසක සම්බන්ධීකරණ ලේකම් සහ මාධ්‍ය ලේකම් ලෙස කටයුතු කර ඇති එතුමා රාජ්‍ය අංශයේ ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කර ඇත. 2009-2015 කාලසීමාව තුළ ඔහු කුරුණෑගල වැවිලි සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස සේවය කර ඇති අතර එහිදී ඉහළ ප්‍රමිතීන් කරා ළඟා වෙමින් කුරුණෑගල වැවිලි සමාගමේ ලාභ වාර්තා කරා ළඟා වීමට විශාල දායකත්වයක් ලබා දී ඇත. ඔහු කීර්තිමත් පෞද්ගලික සමාගමක ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සාමාජිකයෙක් ද විය. එබැවින් ජූඩ් මහතා රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම ආකර්ෂණීය කළමනාකාරිත්ව සහ නායකත්ව කුසලතා සමඟින් කැපී පෙනෙන දස්කම් දක්වා ඇත.

ඔහුගේ නායකත්වය යටතේ 2022 දෙසැම්බර් මස අවසන් වන විට හලාවත වැවිලි සමාගම ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම ලාභය වාර්තා කරමින් සමාගමේ වේගවත් ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. ඉදිරි වර්ෂය සඳහා අගය එකතු කරන ලද විවිධාංගීකරණය වූ නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොළට ව්‍යාප්ත කිරීම සඳහා එතුමා විසින් නව ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

එතුමා උගත්, වැවිලි ක්ෂේත්‍රය පිළිබඳ මනා දැනුමක් ඇති, විශිෂ්ට කළමනාකරණ සහ නායකත්ව හැකියාවන්ගෙන් යුත් මනා පළපුරුද්දක් ඇති පුද්ගලයෙකු ලෙස හඳුන්වා දිය හැකිය.



**පී.එච්. ආනන්ද එස්. විජයරත්න මහතා**
අධ්‍යක්ෂ

පී. එච්. ආනන්ද එස්. විජයරත්න මහතා 2023 දෙසැම්බර් 28 වන දින සීමාසහිත හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කරන ලද අතර, ඔහු 2021 නොවැම්බර් 01 වන දින මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස වැඩ භාර ගන්නා ලද්දේ ශ්‍රී ලංකාවේ සැලසුම් සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙසය. වසර 30 කට ආසන්න කාලයක් රාජ්‍ය සේවයේ විවිධ තනතුරු හෙබවූ එතුමා ඉන් වසර 25 ක් මහා භාණ්ඩාගාරයේ සේවය කර ඇත. ආනන්ද විජයරත්න මහතා සහකාර අධ්‍යක්ෂවරයකු ලෙස රාජ්‍ය සේවයට එක්වන්නේ 1994 වසරේදීය.

ආනන්ද විජයරත්න මහතා රුහුණු විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශේෂ ගෞරව උපාධියක් ලබා ඇත. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් ජාතික සංවර්ධන සැලසුම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, දකුණු කොරියාවේ කුං හී විශ්වවිද්‍යාලයෙන් ජාත්‍යන්තර ආර්ථික සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. ඔහු 1996 දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පළමු වෘත්තීය කොටස ද සම්පූර්ණ කර ඇත.

1994 දී ශ්‍රී ලංකා සැලසුම් සේවයට බැඳුණු එතුමා බදුල්ල දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කරන ලදී. 1999 දී විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට බැඳුණු ඔහු 2011 දී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයකු ලෙස අනුයුක්ත කරන ලදී. 2013 වසරේ මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු ලැබීමෙන් පසු 2020 වසරේ මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස උසස් කර දැනට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ එම තනතුරේ කටයුතු කරමින් සිටී.

ආනන්ද විජයරත්න මහතා රාජ්‍ය ආයතන රැසක අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරයකු ලෙස ද කටයුතු කර ඇත.



**ඩබ්.ඒ.එල්. වික්‍රම ආරච්චි මහතා**
අධ්‍යක්ෂ

ලීලනාත් වික්‍රම ආරච්චි මහතා 2024 අප්‍රේල් 09 වැනි දින හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදි. එතුමා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යාව පිලිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිධාරියෙකු වේ. රාජ්‍ය පරිපාලනය සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබා ගත් එතුමා, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂවරයා වේ. ඔහු වැවිලි කලාපය සඳහා නව ගම්මාන සංවර්ධන අධිකාරියේ (NEIDA) අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සේවය කරයි.



**එච්.ඩබ්.ඩබ්. රත්නපාල මහතා**
අධ්‍යක්ෂ

එච්. ඩබ්. ඩබ්. රත්නපාල මහතා 2024 මාර්තු 1 වන දින හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස එක් විය. ඔහු C4 CIDA ශ්‍රේණිගත සමාගමක් වන රත්වැලි ඉන්ජිනේරු හි හවුල්කරුවෙකි. ඔහු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ රෙදිපිළි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. එතුමා තම වෘත්තීය ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NIBM) විසින් පවත්වනු ලබන වත්කම් කළමනාකරණය සහ පාරිභෝගික සම්බන්ධතා ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණුව සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන මානව සම්පත් කළමනාකරණ පාඨමාලාව සම්පූර්ණ කර ඇත.



**කේ.එල්. විජේසිරි මහතා**
අධ්‍යක්ෂ

කේ. එල්. විජේසිරි මහතා 2024 මාර්තු 01 වන දින හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. විවිධ කුසලතා පරාසයක් ඇති එතුමා සීමාසහිත පැනරෝමා ආයෝජන සහ සේවා පෞද්ගලික සමාගම, සෙලී චොකෝ නිෂ්පාදන සහ සෙනුර එන්ටර්ප්‍රයිසස් යන ආයතනවල හිමිකරු වේ.

එතුමා මොරටුව ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ මෝටර් රථ තාක්ෂණ පාඨමාලාව සහ සීමාසහිත කොළඹ ඩොක්යාඩ් හි සමුද්‍ර ඉංජිනේරු පාඨමාලාව සාර්ථකව නිම කර ඇත.



**සංජීව අබේකෝන් මහතා**
අධ්‍යක්ෂ

හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සංජීව අබේකෝන් මහතා 2024 මාර්තු 01 දින පත් කරන ලදී. ඔහු වසර 30කට වැඩි පළපුරුද්දක් ඇති එක්සත් ජාතික පක්ෂයේ කැපවීමෙන් කටයුතු කරන දේශපාලනඥයෙකි. ඔහු දැනට යටියන්තොට දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායකවරයා ලෙස කටයුතු කරයි. පළපුරුදු දේශපාලන නායකයෙකු ලෙස, ඔහුගේ අවධානය සෞඛ්‍ය, අධ්‍යාපනය සහ යටිතල පහසුකම් වැනි වැදගත් ක්ෂේත්‍ර කෙරෙහි යොමු වී ඇති අතර, එහිදී ඔහු සාර්ථක ව්‍යාපෘති ආරම්භ කර අධීක්ෂණය කර ඇත.

ඔහු පළාත් පාලන මැතිවරණයේදී (2011-2016) විපක්ෂ නායක ලෙස තේරී පත් වූ අතර පාර්ලිමේන්තු මැතිවරණයේදී (2021) එක්සත් ජාතික පක්ෂයේ වැඩිම ඡන්ද ප්‍රතිශතය ලබා ගන්නා ලදී. සංජීව මහතා සමාජයේ අභිවෘද්ධිය සඳහා ධනාත්මක පරිවර්තනයන්ට ඔහුගේ පුළුල් දේශපාලන අත්දැකීම් උපයෝගී කර ගැනීමට උනන්දු වෙයි.



**කේ.ජී.එස්. විජේසිරි බණ්ඩාර මහතා**
අධ්‍යක්ෂ

කේ. ජී. එස්. විජේසිරි බණ්ඩාර මහතා 2024 මාර්තු 01 වැනි දින හලාවත වැව්ලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස එක්විය. ඔහු වසර 20කට අධික අත්දැකීම් ඇති බහුවිධ ව්‍යාපාරිකයෙකි.



**ඩබ්.ආර්.පී.එස්. ජයරත්න මහතා**
අධ්‍යක්ෂ

සීමාසහිත හලාවත වැව්ලි සමාගමට ඩබ්. ආර්. පී. එස්. ජයරත්න මහතා 2024 මාර්තු 01 වන දින පත් කරන ලද අතර එතැන් පටන් එතුමා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. ඔහු ව්‍යාපාරිකයෙකු වන අතර සබරගමුව පළාත් සහ වරකාපොල ප්‍රාදේශීය සභාවේ හිටපු පළාත් පාලන මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කරන ලදී.

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

**ප්‍රධාන කාර්යාලය**

01. ආර්.ඩබ්.එම්.ජේ.එස්.ආර්. පෙරේරා මහතා - සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
02. ඒ.ජී.ආර්.එම්.එම්. රණවීර මහතා - සාමාන්‍යාධිකාරී (2023 ඔක්තෝබර් 31 වන දින ඉල්ලා අස්වන ලදී)
03. බී. හෙට්ටිආරච්චි මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වැවිලි (වැඩබලන)
04. ආර්. එම්.ආර්.බී. රත්නායක මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය
05. එච්.පී.එම්.ඩබ්. හේමචන්ද්‍ර මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක
06. ඒ.එම්.ටී.එච්.බී. අතපත්තු මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - පාලන (වැඩබලන)
07. ඒ.ඒ. අශෝක ආනන්ද මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - වැවිලි/ව්‍යාපෘති
08. ඩබ්.කේ. ප්‍රදීප් මහතා - ජ්‍යෙෂ්ඨ කළමනාකාර (තාක්ෂණ/සංවර්ධන)
09. ඒ.එන්.ඒ.එස්. කරුණාතුංග මහතා - කළමනාකාර (අලෙවි)

**වතු අධිකාරිවරුන්**

10. එම්.ජී.සී. ඩයස් මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - වතු/වැවිලි (දිවුලපිටිය වතු කලාපය)
11. ජේ.එච්. ප්‍රනාන්දු මහතා - ජ්‍යේෂ්ඨ වතු අධිකාරී (පළුගස්වැව වතු කලාපය)
12. ඩී.එම්.ජී.ඒ. දිසානායක මහතා - වතු අධිකාරි (මාදම්පේ වතු කලාපය)
13. බී.එම්.යු.බී. බස්නායක මහතා - වතු අධිකාරි (හලාවත වතු කලාපය)
14. ඒ.එම්.ඩී. ගුණතිලක මහතා - වතු අධිකාරි (බිංගිරිය වතු කලාපය)
15. එච්.ටී.එස්. පෙරේරා මහතා - වතු අධිකාරි (තම්බපණ්ණි වතු කලාපය)
16. බී.ඒ.පී.ඩී. ධර්මසේන මහතා - වතු අධිකාරි (මංගලඑළිය වතු කලාපය)
17. කේ.ඒ.එන්.අයි. කරුණාරත්න මහතා - වතු අධිකාරි (නිකවැරටිය වතු කලාපය)

## කළමනාකරණ විශ්ලේෂණය

### භූමි පිහිටීම

වැවිලි සමාගම් අතුරින් හලාවත වැවිලි සමාගම පොල් නිෂ්පාදනයේ ප්‍රමුඛයා වේ. පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන දිස්ත්‍රික්කයන් ත්‍රිත්වයෙහි සමාගමට අයත් ඉඩම් ප්‍රධානවම පැතිරී පවති. පාදක වර්ෂය තුළදී ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් කළමනාකරණය කරමින් පැවති කිලිනොච්චිය දිස්ත්‍රික්කයට අයත් පලෛයි වතු ඒකක 04 ක් වසර 30 ක කල් බදු පදනම මත ලබා ගනිමින් පලෛයි වතු කලාපය ඇති කිරීමත් සමඟ හලාවත වැවිලි සමාගම විසින් කළමනාකරණය කරන ඉඩම් උතුරු පළාත දක්වා ව්‍යාප්ත වන ලදී. ඒ අනුව සමාගමට අයත් මුළු ඉඩම් ප්‍රමාණය 5,992.74 ක් වන අතර, වැඩිම භූමි ප්‍රමාණයක් පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. එය මුළු භූමි ප්‍රමාණයෙන් 54% කි. කුරුණෑගල, ගම්පහ සහ කිලිනොච්චිය දිස්ත්‍රික්කයන් හි මුළු ඉඩම් ප්‍රමාණයෙන් පිළිවෙලින් 35% ක්, 7% ක් සහ 4% වශයෙන් පිහිටා ඇත. එම පිහිටි ඉඩම් ප්‍රධාන වතු කලාපයන් 9 ක් යටතේ වතු ඒකක 89 ක් ලෙසින් පිහිටා ඇත.






## අපේ වතු

| වතු කලාපය | වතු ඒකක සංඛ්‍යාව | භූමි ප්‍රමාණය (හෙක්.) | ප්‍රධාන භෝග (හෙක්.) | | | ප්‍රා.ලේ. කොට්ඨාශ | ප්‍රධාන නගරය |
|---|---|---|---|---|---|---|---|
| | | | පොල් | කජු | අනෙකුත් භෝග | | |
| බිංගිරිය | 11 | 1,109.74 | 706.95 | 20.00 | 0.81 | බිංගිරිය, කොබෙයිගනේ | වීරපොකුණ |
| හලාවත | 12 | 645.57 | 485.36 | 49.96 | 9.26 | පල්ලම, ආරච්චිකට්ටුව, රස්නායකපුර | පල්ලම |
| දිවුලපිටිය | 14 | 414.37 | 403.74 | - | 46.47 | දිවුලපිටිය, කටාන, දංකොටුව | බඩල්ගම |
| මාදම්පේ | 12 | 655.86 | 603.65 | 6.07 | 5.24 | නාත්තන්ඩිය, හලාවත, බිංගිරිය, උඩුබද්දාව, මාදම්පේ | උඩුබද්දාව |
| මංගලඑළිය | 11 | 816.64 | 299.79 | 315.64 | - | පුත්තලම, මූන්දලම, මහකුඹුක්කඩවල | මූන්දලම |
| නිකවැරටිය | 14 | 399.92 | 332.87 | 18.20 | - | කොබෙයිගනේ, පඩුවස්නුවර | කොබෙයිගනේ |
| පළුගස්වැව | 1 | 672.22 | 619.16 | - | 0.5 | ආරච්චිකට්ටුව | ආරච්චිකට්ටුව |
| තම්බපණ්ණි | 10 | 1,008.79 | 393.34 | 405.25 | - | පුත්තලම, වනාතවිල්ලුව, කල්පිටිය | පුත්තලම |
| පලෙයි | 4 | 269.63 | 37.25 | - | - | කිලිනොච්චිය | කිලිනොච්චිය |
| **එකතුව** | **89** | **5,992.74** | **3,882.11** | **815.12** | **62.28** | | |

කෘෂි දේශගුණික කලාප අනුව වගා ඉඩම් පහතරට අතරමැදි (IL) සහ වියළි දේශගුණික (DL) කලාපයන්ට අනුව පිහිටා ඇත.

කෘෂි දේශගුණික කලාපයන් හි ලක්ෂණ අනුව ඉඩම් භාවිත සැලස්ම සකසමින් භූමි ඒකක නිෂ්පාදනය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස භෝග විවිධාංගීකරණය කර ඇත. කජු, TJC අඹ, රඹුටන්, ඩ්‍රැගන් ෆෘට් වැනි පළතුරු භෝග සහ කුළුබඩු වශයෙන් කුරුඳු සහ ගම්මිරිස් දීර්ඝ කාලීන අතුරු භෝග වගාව සිදුකරමින් පවතී. භෝග වගාවට අමතරව බොහොමයක් වතුවල සත්ව පාලන කටයුතුවලද නිරත වේ.

### වතු අනුව පොල් නිෂ්පාදන දත්ත








2000
1000
0
60
40
20
0
2018 2019 2020 2021 2022 2023
දිවුලපිටිය වතු කලාපයේ පොල් නිෂ්පාදනය (ගෙඩි 1,000)
ගසකට ගෙඩි




3000
2000
1000
0
60
40
20
0
2018 2019 2020 2021 2022 2023
මාදම්පේ වතු කලාපයේ පොල් නිෂ්පාදනය (ගෙඩි 1,000)
ගසකට ගෙඩි




1500
1000
500
0
60
40
20
0
2018 2019 2020 2021 2022 2023
නිකවැරටිය වතු කලාපයේ පොල් නිෂ්පාදනය (ගෙඩි 1,000)
ගසකට ගෙඩි




6000
4000
2000
0
100
50
0
2018 2019 2020 2021 2022 2023
පලුගස්වැව වතු කලාපයේ පොල් නිෂ්පාදනය (ගෙඩි 1,000)
ගසකට ගෙඩි




1000
500
0
100
50
0
2018 2019 2020 2021 2022 2023
මංගලඑලිය වතු කලාපයේ පොල් නිෂ්පාදනය (ගෙඩි 1,000)
ගසකට ගෙඩි




1500
1000
500
0
100
50
0
2018 2019 2020 2021 2022 2023
තම්බපණ්ණි වතු කලාපයේ පොල් නිෂ්පාදනය (ගෙඩි 1,000)
ගසකට ගෙඩි




40
20
-
15
10
5
-
2018 2019 2020 2021 2022 2023
පලෙයි වතු කලාපයේ පොල් නිෂ්පාදනය (ගෙඩි 1,000)
ගසකට ගෙඩි

### පස් අවුරුදු පොල් නිෂ්පාදන ප්‍රගතිය

| වර්ෂය | පොල් අස්වැන්න (ගෙඩි) | වෙනස | ඵලදරන ගස් සංඛ්‍යාව | පොල් ගසක සාමාන්‍ය ගෙඩි ගණන | ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය (මිලියන) | (මිලියන) වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| 2018 | 8,132,121 | -30% | 262,517 | 31 | 2,737 | +10% |
| 2019 | 14,993,952 | 84% | 259,808 | 58 | 3,106 | +13% |
| 2020 | 11,943,494 | -20% | 273,429 | 44 | 2,818 | -9% |
| 2021 | 14,715,763 | 23% | 275,267 | 53 | 3,383 | -17% |
| 2022 | 15,172,334 | 03% | 277,190 | 55 | 3,351 | -1% |
| 2023 | 11,697,511 | -23% | 271,411 | 43 | 2,944 | -12% |

### තිරසර කෘෂිකාර්මික සැලැස්ම

හලාවත වැවිලි සමාගමෙහි කෘෂිකාර්මික කටයුතු තිරසර සැලැස්මකට අනුව ක්‍රියාත්මක වේ. එම සැලැස්මට අනුව වතුවල යටිතල පහසුකම් මෙන්ම කෘෂිකාර්මික සංවර්ධන කටයුතු ද සිදුකරනු ලැබීය. පොල් වගාවේ මෙන්ම අනෙකුත් බෝගයන්හි වාර්ෂික අස්වනු ප්‍රමාණය ඉහළ නැංවීම නව තාක්ෂණික ක්‍රමෝපායන් හඳුනාගනිමින් ක්‍රියාත්මක කරනු ලැබීය.

**තිරසර කෘෂි සංවර්ධන ක්‍රමෝපායන්**

1. පොල් යටි සහ නව වගාවන් සිදු කිරීම,
2. අතුරු බෝග වගා කිරීම,
3. පොල් වගාවට ජල සම්පාදන ව්‍යාපෘති කිරීම
4. නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම,
5. නව නිෂ්පාදන හඳුන්වාදීම දැක්විය හැකිය.

**1. නව පොල් යටි වගාවන් ආරම්භ කිරීම**

වතුවල පොල් පැළ යටි වගාවක් වශයෙන් ආරම්භ කිරීමට වඩාත් උචිත ස්ථාන හඳුනාගනිමින් එම ස්ථානවල පොල් පැළ යටි වගාවන් ද, වගාවන් නොපවතින පොල් වගාවට හිතකර භූමි හඳුනාගනිමින් නව පොල් වගාවන් ආරම්භ කිරීම පාදක වර්ෂය තුලදීද සිදු කරනු ලැබීය.

| වතු කලාපය | පාදක වර්ෂයේ සිටවූ පොල් පැළ ප්‍රමාණය | වර්ෂ අවසානයේ පැවැති පොල් පැළ වගා ප්‍රමාණය (හෙක්.) | වර්ෂ අවසානයේ පැවැති පොල් පැල ප්‍රමාණය | පැල වගාව මුළු වගාවේ ප්‍රතිශතයක් (%) ලෙසට |
|---|---|---|---|---|
| බිංගිරිය | 200 | 94.00 | 12,834 | 13 % |
| හලාවත | - | 17.68 | 2,614 | 4% |
| දිවුලපිටිය | 640 | 21.50 | 3,741 | 5 % |
| මාදම්පේ | 4550 | 60.00 | 9,162 | 10 % |
| මංගලඑළිය | 410 | 43.50 | 3,706 | 17 % |
| නිකවැරටිය | - | 27.02 | 2,918 | 8 % |
| පළුගස්වැව | 1,500 | 55.00 | 6,767 | 9 % |
| තම්බපණ්ණි | 2,400 | 20.50 | 7,718 | 12 % |
| **එකතුව** | **9,700** | **375.70** | **49,640** | **10%** |

**2. දීර්ඝ කාලීන සහ කෙටි කාලීන බෝග වගාවන් සිදු කිරීම**

පාංශු යෝග්‍යතාවය හඳුනාගනිමින් ඌන භාවිත ඉඩම් බෝග වගාවට යොදා ගැනීම සහ තවදුරටත් බෝග විවිධාංගීකරණය කළ හැකි ඉඩම් තුළ ප්‍රධාන බෝගය වන පොල් වගාවට අමතරව අතුරු බෝග වගා කිරීම කරනු ලැබීය. එහිදී ඒකක ඵලදායිතාවය ඉහළ නැංවීමට හඳුනාගන්නා ලද යෝග්‍ය ඉඩම් නැවත සංවර්ධනය තුළින් කෙටි කාලීන බෝග වගා කටයුතු කිරීම කරනු ලැබීය.

සමාගම විසින් ආරම්භ කරන ලද අතුරු බෝග වගා ව්‍යාපෘතීන්ට අමතරව වාර්ෂිකව පෞද්ගලික ව්‍යවසායකයින් එක්ව සමාගම සතු ඌන භාවිත ඉඩම්වල අතුරු බෝග වගාවන් සිදු කිරීමට ද සමත්විය.

වැවිලි ක්ෂේත්‍රයේ ක්ෂේත්‍ර මට්ටමින් ඇති මානව සම්පත් හිඟය සහ භෞතික සම්පත් කළමනාකරණයේ පවතින දුෂ්කරතාවයන් මත හලාවත වැවිලි සමාගම සතුව ඇති ඌණ භාවිත ඉඩම් සඳහා සහ අතුරු බෝග වගාවක් තවදුරටත් සිදුකළ හැකි ඉඩම් වෙත නැවත පුනර්ජීවයක් ලබාදීමට බාහිර ව්‍යවසායකයින් හට කෙටි කාලීන අතුරු බෝග වගාවට පහසුකම් සැපයීමේ ක්‍රියාවලි අඛණ්ඩව ඉදිරියටත් ක්‍රියාත්මක වේ. ඒ අනුව 2023 වර්ෂය වෙනුවෙන් පෙර ලබාදී තිබූ අක්කර 1,005ට අමතරව අක්කර 917 ක් අතුරු බෝග වගාවට පෞද්ගලික ව්‍යවසායකයින්ට වාර්ෂික බදු පදනම මත ලබා දුනි.

පෞද්ගලික ව්‍යවසායකයින් හට පොල් ඉඩම් තුළ සහ ආන්ත්‍රික ඉඩම් තුළ අතුරු බෝග වගා කිරීමට අවස්ථාව ලබාදීමත් සමඟ එහි පොල් යටි වගාවන් රෝපනය කිරීම සහ එහි රැකබලා ගැනීමේ යම් වගකීමක් එම පාර්ශවයට දීම තුළ අපට එරෙහිව වර්ධනය වන ශ්‍රම හිඟයට පිළියමක් එතුළින් ලබාදී ඇත.

**දීර්ඝ කාලීන අතුරුබෝග පිළිබඳ දත්ත**

| වත්ත | කජු (හෙක්.) | ගම්මිරිස් (හෙක්.) | රඹුටන් (හෙක්.) | ඩ්‍රැගන් ෆෘට් (හෙක්.) | කුරුඳු (හෙක්.) | අඹ (හෙක්.) |
|---|---|---|---|---|---|---|
| තම්බපණ්නි | 405.25 | - | - | - | - | - |
| මංගලඑළිය | 316.04 | - | - | - | - | - |
| බිංගිරිය | 20.00 | - | - | - | 0.81 | - |
| නිකවැරටිය | 18.20 | - | - | - | - | - |
| හලාවත | 49.96 | - | - | - | 1.60 | 6.87 |
| මාදම්පේ | 6.07 | - | - | 3.64 | - | 1.6 |
| දිවුලපිටිය | - | 16.06 | 20.00 | - | 9.61 | - |
| පළුගස්වැව | - | - | - | 0.5 | - | - |
| **එකතුව** | **815.52** | **16.06** | **20.00** | **4.14** | **12.02** | **8.47** |

### 3. පොල් වගාවට ජල සම්පාදන ව්‍යාපෘති කිරීම

පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රිකයන් තුළ පිහිටි බොහොමයක් වතු කොට්ඨාශයන් සඳහා 1750 mm අඩු වාර්ෂික වර්ෂාපතනයක් ලැබෙන අතර, සමහර වර්ෂයන්හිදී වාර්ෂික වර්ෂාපතනය 1000 mm ට අඩු වාර්ෂික වර්ෂාපතනයක් ලැබෙන වතු ද පුත්තලම දිස්ත්‍රික්කයට අයත්ව පිහිටා ඇත. අඛණ්ඩ වර්ධනයට සහ ඵල නිෂ්පාදනයට සීමා සාධකයක් ලෙසට ජලය ක්‍රියාකරන බැවින් වතුවල පොල් නිෂ්පාදනය ඒකාකාරීව පවත්වා ගැනීමට සහ ක්‍රමිකව නිෂ්පාදන ධාරිතාවය වැඩිකිරීමෙහිලා නව තාක්ෂණයට අනුව පොල් වගාව සඳහා ජල සම්පාදන ක්‍රමෝපායන් ආරම්භ කිරීමට හලාවත වැවිලි සමාගම කටයුතු කරන ලදී.

2022 වර්ෂයේදී පොල් වගාවේ අක්කර 25 බැගින් ආවරණය වන පරිදි මංගලඑළිය වතු කලාපයේ රෙජිනා, තම්බපණ්ණි වතු කලාපයේ ජසින්තා සහ පළුගස්වැව වත්තේ ක්ෂේත්‍ර අංක 4 හි බිංදු ජල සම්පාදන පද්ධතීන් 03 ක් ස්ථාපිත කරන ලදී. පාදක වර්ෂයේදී එය තවදුරටත් ව්‍යාප්ත කරමින් සූර්ය විදුලිය උපයෝගි කරමින් අක්කර 25 ක බිංදු ජල සම්පාදන ව්‍යාපෘතියක් මාදම්පේ වතු කලාපයේ ගල්වාගාර වතු කොටස තුල ආරම්භ කරන ලදී.



## 4. නිෂ්පාදනවලට අගය එකතු කිරීම

ගුණාත්මයෙන් යුතු නිමි නිෂ්පාදනයක් පාරිභෝගිකයා වෙත ලබාදීමේ අරමුණින් හලාවත වැවිලි සමාගම තම නිෂ්පාදනවලට අගය එකතු කරමින් වටිනාකම් වැඩිකිරීමේ ක්‍රියාවලියට එක්වේ,

- නැබුල් පොල් තෙල් නිෂ්පාදනය
- පොල් පැණි නිෂ්පාදනය,
- මී කිරි නිෂ්පාදනය,
- මී කිරි යෝගට් නිෂ්පාදනය,
- එළකිරි යෝගට් නිෂ්පාදනය,
- පිරි සැකසුම් කළ කාබනික කජු නිෂ්පාදනය,
- බීජ පොල් නිෂ්පාදනය



ප්‍රධාන අගය එකතු කරන ලද නිෂ්පාදනයන් පළුගස්වැව වත්ත මූලික කරමින් නිෂ්පාදනය වේ. පොල් තෙල්, කජු සැකසුම, මී කිරි සහ යෝගට් නිෂ්පාදන කටයුතු පළුගස්වැව වත්තෙහි සිදුකරනු ලැබේ. පොල් තෙල් නිෂ්පාදනයේදී ඉහළම ගුණාත්මයෙන් යුතු සුදු කොප්පරා පමණක් යොදා ගනී. මී කිරි සහ යෝගට් නිෂ්පාදනයට අවශ්‍ය කිරි පළුගස්වැව වත්තේ ක්‍රියාත්මක මී ගව ව්‍යාපෘතිය තුළින් ද, එළකිරි නිෂ්පාදන කටයුතු වත්ත ඇතුලත සිටින අවට ගොවීන්ගේ සහ කම්කරුවන් විසින් පාලනය කරන එළ ගවයින්ගෙන් ලබා ගනී. මෙම නිෂ්පාදනවලදී කෘතීම රසකාරක භාවිතා නොකරමින් වඩාත් සෞඛ්‍ය ආරක්ෂිතව නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබයි.

පොල් පැණි නිෂ්පාදනයේදී ජලය හෝ සීනි භාවිතයෙන් තොරව මී රා පමණක් භාවිතයෙන් නිෂ්පාදනයන් කිරීම විශේෂත්වයි. ගුණාත්මක පොල් පැණි නිෂ්පාදනය බිංගිරිය, මාදම්පේ, හලාවත යන වතු කලාපයන් හි කරනු ලැබේ.

## කජු සඳහා කාබනික සහතිකය දිනාගත් අපි



CERTIFICATE

Requirements for Sri Lanka Organic Agriculture Production and Processing

Chilaw Plantations Limited

SLS 1324:2018

Valid until 23rd March 2024

CERTIFICATE

Chilaw Plantations Ltd.

SRI LANKA

ව්‍යාපෘතියක් ලෙස කජු වගාව 2002 වර්ෂයේ ආරම්භ කල අතර, සමාගම සතුව හෙක්ටයාර් 800ක පමණ කජු වගාවක් දැනට පවතී. එකී වගාව තුළින් 2020 වර්ෂයේ වාර්තාගත අස්වැන්නක් ලබාගනිමින් හලාවත වැවිලි සමාගම ශ්‍රී ලංකාවේ කජු නිෂ්පාදනයේ ප්‍රමුඛයා ද විය.

පසු කාලීනව වාර්ෂිකව කජු නිෂ්පාදනය සහ ඊට සමගාමීව කජු ආදායම පහත වැටීම මත හලාවත වැවිලි සමාගම එතෙක් කජු අස්වනු නෙලීමට භාවිතාකල ක්‍රමවේදය වෙනස් කරමින් කජු එලදාව රැකබලා ගැනීමේ කාර්යයේ සිට කජු අස්වනු නෙලීමේ කටයුතු දක්වා කජු වාරයට කජු ගස් බදු දීමේ ක්‍රියාවලියක් පාදක වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. එහිදී සමාගම විසින් පූර්ව නියම කරන ලද අවම මිලක් යටතේ කජු ගස් බදු දීම සිදු කරනු ලැබීය. මෙම බදුදීමේ ක්‍රියාවලිය සඳහා සුදුසු ගැනුම්කරුවන් පුවත්පත් දැන්වීමක් පලකිරීම තුළින් තෝරා ගන්නා ලදී. එය ඉතාමත් සාර්ථක ක්‍රමවේදයක් ලෙසින් ක්‍රියාත්මක විය.

හලාවත වැවිලි සමාගම දීර්ඝ කාලීනව වගා කොට ඇති හෙක්ටයාර් 800 ක කජු වගාව කාබනික වගාවක් වශයෙන් වතු ඒකක 30 ක පවත්වාගෙන යනු ලැබේ. එතුලින් 2021 වර්ෂයේදී විශාලතම වතු ඒකක 06 ක කජු වගාව සඳහා ''කාබනික'' සන්නාමය හිමිකරගන්නා ලදී. පසුව වාර්ෂිකව එම වගාවන් ගුණාත්මකව පාලනය කරමින් සෑම වර්ෂයකදීම ''කාබනික'' සහතිකය ලබා ගැනීමට සමත් විය.



**පශු සම්පත**

- මී ගව පාලනය,
- බැටළු පාලනය,
- එළු පාලනය,




පොල් ඉඩම් ඇතුලත වගාවට හානියක් නොවන පරිදි එහි භූමිය උපරිම ලෙසින් ප්‍රයෝජනයට ගැනීම වස් හලාවත වැවිලි සමාගම ආරම්භක අවස්ථාවේ සිටම සත්ව පාලනයට ප්‍රවිශ්ඨ වී තිබුණි. ඒ අනුව ඉහත සත්ව පාලන ව්‍යාපෘති හරහා වාර්ෂිකව අමතර ආදායමක් ලැබීම මෙන්ම ඉඩම් හි වල් පාලනයට සහ වත්තට අවශ්‍ය කාබනික පොහොර ප්‍රමාණයෙන් යම් ප්‍රමාණයක අවශ්‍යතාවය සපුරා ගැනීමට සහ එතුළින් පසෙහි කාබන් /නයිට්‍රජන් අනුපාතය ප්‍රශස්ත මට්ටමෙන් පවත්වා ගැනීමට දායකත්වයක් ද ලබා ගනී.

**නිෂ්පාදන අලෙවිකරණය**

පොල් වගාව මූලික කරගත් වැවිලි සමාගමක් වශයෙන් හලාවත වැවිලි සමාගම බෝග වගාව මෙන්ම නිෂ්පාදන විවිධාංගීකරණය මඟින් පොල් වගාව ආශ්‍රිත නිෂ්පාදනයන් ඇතුලත් නිෂ්පාදන රැසක් වෙළඳපලට ඉදිරිපත් කරයි.

- **පොල් වගාව ආශ්‍රිත කිෂ්පාදන**

පොල්, කොප්පරා, පොල් පැණි, පොල් තෙල්, පොල් පැල සහ පොල් ආශ්‍රිත වෙනත් නිෂ්පාදන

- **කජු වගාව ආශ්‍රිත නිෂ්පාදන**

පිරිසැකසුම් කරන ලද කජු, ලෙලි කජු, කජු නිෂ්පාදන ආශ්‍රිත අනෙකුත් අතුරු නිෂ්පාදන

- **කිරි ආශ්‍රිත නිෂ්පාදන**

මුදවපු කිරි, යෝගට්, ගිතෙල් සහ අනෙකුත් නිෂ්පාදන

- **වෙනත් වගා ආශ්‍රිත නිෂ්පාදන**

වට්නා දැව, කුරුඳු, ගම්මිරිස්, රඹුටන්, ඩ්‍රැගන්ෆෘට් ඇතුළු අනෙකුත් අතුරු බෝග

- **වෙනත් නිෂ්පාදිත සහ සේවාවන්**








ආයතනයේ ප්‍රධානතම අස්වැන්න ලෙස පොල් සහ ඒ ආශ්‍රිතව නිෂ්පාදනය කරනු ලබන කොප්පරා වර්ෂය පුරාම අලෙවියට ඉදිරිපත් කරන අතර, එය ප්‍රධාන වශයෙන් පොල් පොල ටෙන්ඩර් පටිපාටිය තුළින් අලෙවි කෙරේ. ඒ අනුව සතියේ සඳුදා සිට බ්‍රහස්පතින්දා දක්වා දිනකට වතු කලාප 02 බැගින් සහ සිකුරාදා දින ප්‍රධාන කාර්යාලීය පොල් පොල ටෙන්ඩර් පටිපාටිය තුලින් පොල් අලෙවි කරනු ලබන අතර, ඒ තුලින් ඕනෑම අවශ්‍යතාවයකට අනුව සුදුසු පොල් ප්‍රමාණවත් පරිදි ගැණුම්කරුවන් හට ලබා දීමේ අලෙවි යාන්ත්‍රණයක් පවතී.

ලෙලි කජු , වට්නා දැව, පොල් ලෙලි ඇතුළු අනෙකුත් නිෂ්පාදන ප්‍රධාන වශයෙන් ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් අලෙවි කරනු ලබන අතර අලෙවි කරනු ලබන නිෂ්පාදිතවල වටිනාකම අනුව ටෙන්ඩර් ක්‍රියාදාමය තීරණය කෙරේ.

හලාවත වැවිලි සමාගම විසින් දිවයිනේ බොහෝ ප්‍රදේශ ආවරණය වන පරිදි තෝරාපත් කරගෙන ඇති අලෙවි නියෝජිතවරු මාර්ගයෙන් සහ අප සමාගමේ හලාවත, රාජකදළුව සහ කොළඹ පිහිටි අලෙවිසැල් හරහා ප්‍රධාන වශයෙන් අපගේ අගය එකතු කල නිෂ්පාදිත පාරිභෝගික ජනතාව වෙත අලෙවි කිරීම සිදුකරනු ලබයි. එම අලෙවි මාර්ගයන් හරහා අපගේ නිෂ්පාදිත දිවයිනේ බොහෝ ප්‍රදේශ තුල ප්‍රචලිත කිරීම සහ අලෙවි ප්‍රවර්ධනය සිදුකරනු ලබයි.

බොහෝ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල සුභ සාධක සංගම් සම්බන්ධීකරණය කර ගනිමින් අපගේ

අගය එකතු කල නිෂ්පාදිත අලෙවි කිරීමේ ක්‍රියාදාමයන් අලෙවි අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ක්‍රියාදාමයන් තුලින් අපගේ නිෂ්පාදිත පාරිභෝගික ජනතාවට සෘජුවම මිලදී ගැනීමේ හැකියාව පවතී.

රාජ්‍ය සහ පෞද්ගලික ආයතන මඟින් දිවයින පුරා සංවිධානය කරන අලෙවි ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ සහ විවිධ උත්සවයන් සඳහා හලාවත වැවිලි සමාගම නියෝජනය කරමින් අලෙවි අංශය විසින් කැපී පෙනෙන වෙළඳ කුටි ඉදිරිපත් කරමින් හලාවත වැවිලි සමාගමේ නිෂ්පාදිත ප්‍රවර්ධනය කිරීම, අලෙවි කිරීම සහ දැයේ දූ දරුවන් හට නිෂ්පාදිත සහ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව තොරතුරු දැනුවත් කිරීමද සිදු කරයි.

ඉහත අලෙවිකරණ ක්‍රියාදාමයන් තුලින් හලාවත වැවිලි සමාගමේ සියළු නිෂ්පාදනයන් සඳහා වෙළඳපල තුල ඉහළ වටිනාකමක් ලබා ගැනීමේ අරමුණ පෙරදැරිව සිදු කරන අතර, තරගකාරී වෙළඳපල තුල අපගේ ස්ථාවරත්වය පවත්වාගෙන යෑම අපේක්ෂා කෙරේ.

### පාරිසරික සාධක වල බලපෑම්

### වාර්ෂික වර්ෂාපතන රටාව

හලාවත වැවිලි සමාගම සතු ඉඩම් වැඩි ප්‍රමාණයක් වියලි දේශගුණික කලාපය ඇතුලත පිහිටා තිබේ. වියලි කලාපයට නිරිත දිග මෝසම මගින් ලැබෙන වර්ෂාපතනය වගාවක සශ්‍රිකත්වය පවත්වා ගැනීමට ප්‍රමාණවත් නොවන අතර, ඊසාන දිග මෝසම් වර්ෂා කාලයේදී ලැබෙන වර්ෂාව යම් ප්‍රමාණයකට වගාවට වැදගත් වේ. අන්තර් මෝසම් මගින් වාර්ෂාව ලැබීම විචල්‍ය වේ. සමහර අවස්තාවන්හිදී වර්ෂය මුළුල්ලේ වියලි දේශගුණික තත්වයක් පැවතී පසුව ඇතිවන මෝසම් වර්ෂාව දැඩි තීව්‍රතාවකින් පතිත වන විට එම කාල සීමාවට අධික වර්ෂාවක් ලැබේ. නමුත් පොල් ගස වර්ෂය මුළුල්ලේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කිරීම මත කෙටි කාලසීමාවකදී ලැබෙන වර්ෂාපතනයේ තීව්‍රතාවයට වඩා වර්ෂාපතනයේ පැතිරීම පාංශු තෙතමනය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීමට ඉවහල් වේ. විශේෂයෙන් පුත්තලම දිස්ත්‍රික්කය ඇතුලත සහ ඊට මායිම්ව පිහිටි වතුවලට ලැබෙන වාර්ෂාපතනයේ ව්‍යාප්තිය අඩුකම මත වර්ෂයේ වැඩි කාලයක් වගාව ජල ඌණතාවයකින් පෙළෙයි. එවිට ඊට සමගාමීව ගස්වල නිෂ්පාදනය ද සීමා වේ.

### ජානමය උසස් බීජ පොල් නිෂ්පාදනය

පොල් පර්යේෂණ ආයතනයේ තාක්ෂණික සහයෝගය ඇතිව වර්ෂ 2012 දී පළුගස්වැව වත්තේ අත් පරාගනය මගින් CRISL 98 යන වැඩිදියුණු කරන ලද පොල් ප්‍රභේදය නිපදවීමේ කටයුතු ආරම්භ කරනු ලැබූහ. එම බීජ පොල් නිෂ්පාදන කටයුතු පාදක වර්ෂය තුළදී ද සිදු කරනු ලැබීය.

වර්ෂ 2013 පොල් පර්යේෂණ ආයතනය සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමක් මඟින් ''කප්රුවන'' පොල් ප්‍රබේදය නිපදවීම අරභයා බිංගිරිය වතු කලාපයේ කිණියම වත්ත ඇතුලත හෙක්ටයාර් 58 ක විශාලත්වයකින් යුතු බීජ පොල් උයන ස්ථාපිත කරන ලදී. කොළ කුන්දිරා සහ සැන්රාමන් යන ප්‍රභේදයන් එකට මුහුම් කරමින් ''කප්රුවන'' පොල් ප්‍රභේදය නිපදවීම කරනු ලබයි. පාදක වර්ෂය තුළදී ''කප්රුවන'' බීජ පොල් පැළ නිෂ්පාදනය අරභයා කොළ කුන්දිරා ගස් 300 ක් පමණ තෝරා ගනිමින් ඒ තුල අත්පරාගන කටයුතු නැවත ආරම්භ කරනු ලැබීය. අත්පරාගන ක්‍රියාවලිය තුළින් බීජ පොල් අස්වනු නෙලීම පාදක වර්ෂයේ අග භාගයේදී ආරම්භ කරනු ලැබීය. පොල් පැළ නිකුත් කිරීම 2024 වර්ෂයේ ආරම්භයේදී සිදු කිරීමට අපේක්ෂිතය.

### පාරිසරික උෂ්ණත්වය

පාරිසරික උෂ්ණත්වය පොල් මලෙහි නිෂ්පාදනය කරන පරාගවල ජීවී ගුණය පවත්වා ගැනීමට ඉතාමත් වැදගත් පරිසර සාධකයක් වේ. පොල් ශාකයේ ක්‍රියාකාරිත්වයට ප්‍රශස්ත උෂ්ණත්වය 29 $C^{O}$ වන අතර පරිසර උෂ්ණත්වය ක්‍රමිකව ඉහළ යනවිට පොල් මලෙහි හටගන්නා පරාගවල ජීවී ගුණය අඩු වේ. එම අජීවී හෝ මද වශයෙන් සක්‍රීය පරාග, පරාගන ක්‍රියාවලියට භාජනය වූව ද ඵල හට ගැනීමට දැඩි අහිතකර බලපෑමක් ඇතිකරයි.

දැඩි වියලි දේශගුණික තත්ත්වයේ දී ශාකවලින් වාෂ්පී-උත්ස්වේදනය මඟින් ජලය ඉවත්වීම නිසා පොල් ගස්වල ප්‍රකෘති තත්වය බිඳ වැටීමකට ලක් වේ. ඒ හේතුකොට ගෙන පුත්තලම් දිස්ත්‍රික්කය සහ ඊට ආසන්නව පිහිටි වතුවල දැඩි වියලි දේශගුණික තත්වයේදී බැට්ටා වැටීම මෙන්ම ගස් හි පොල් අතු කඩා වැටීමට ද වගාවට අහිතකර ලෙසින් බලපායි.

**වාර්ෂික වර්ෂාපතනය 2018 සිට 2023 දක්වා**




| | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| බිංගිරිය | 1,393.34 | 920.00 | 1,226.74 | 1,980.12 | 1,068.42 | 1,661.86 |
| හලාවත | 1,724.50 | 1,633.93 | 1,357.39 | 1,963.45 | 646.59 | 2,044.68 |
| දිවුලපිටිය | 2,470.67 | 1,597.50 | 1,921.33 | 2,708.33 | 1,576.33 | 2,769.67 |
| මාදම්පේ | 2,011.67 | 1,934.67 | 1,436.33 | 1,991.33 | 1,697.00 | 1,685.00 |
| මංගලඑළිය | 650.20 | 1,404.83 | 872.60 | 1,918.40 | 1,125.60 | 1,573.33 |
| නිකවැරටිය | 1,690.00 | 1,423.00 | 1,273.00 | 2,306.00 | 1,278.00 | 1,825.00 |
| පළුගස්වැව | 1,786.50 | 1,569.20 | 1,371.00 | 2,108.10 | 1,278.92 | 2,256.60 |
| තම්බපණ්ණි | 1,517.79 | 1,785.14 | 903.82 | 2,268.56 | 1,420.56 | 2,111.40 |

**පස**

පුත්තලම සහ කිලිනොච්චිය දිස්ත්‍රික්කයන් ඇතුලත පිහිටි බොහොමයක් ඉඩම් මුහුදු බඩ සීමාවට මායිම් ව පිහිටා තිබේ. මේ හේතුවෙන් එම පසෙහි අඩංගු වැලි ප්‍රමාණය ප්‍රතිශතාත්මකව අනෙකුත් දිස්ත්‍රික්කයන් හි දක්නට ලැබෙන පසට සාපේක්ෂව වැඩි අගයක් ගනී. එය ද ඉක්මනින් පස වියලීමට හේතුකාරකයක් වේ. කෙසේ නමුත් එම වැලිමය පස පොල් වගාවට වඩාත් උචිත වේ.

කුරුණෑගල සහ ගම්පහ යන දිස්ත්‍රික්කයන් ඇතුලත පිහිටි වතුවල පස වැලිමය ලොම් පස් බාණ්ඩයේ සිට රෙඩ් යෙලෝ පොඩ්සොලික් පස් බාණ්ඩය දක්වා ව්‍යාප්තව ඇත.

**අපගේ විශේෂ අවස්ථාවන්**




















### අපගේ සමාජීය වගකීම්

රාජ්‍ය සම්පත් නිසි ලෙස භාවිතා කරමින් ආර්ථිකමය වශයෙන් ප්‍රගතියක් අත්පත් කර ගැනීමට අප සමත්වීම සුවිශේෂී වේ. රටෙහි විවිධ ආර්ථික පසුබෑම් පැවතිය ද සමාගම සතු සම්පත් ඵලදායිව උපයෝගී කරගනිමින් හා එම සම්පත් මනාව කළමනාකරණය කර ගැනීම ප්‍රගතියට හේතු සාධක වේ. සමාගම විසින් අත්පත්කරගත් ආර්ථික ප්‍රතිලාභ සමස්ථ සේවකයින් හට ද නොඅඩුව ලබාදීමට හැකිවීම ද සුවිශේෂී අවස්ථාවක් ලෙසට සනිටුහන් කළ හැකිය.

හලාවත වැවිලි සමාගම වාර්ෂිකව අත්කරගන්නා භෞතික සහ මූල්‍යමය වර්ධනය තුළ ලැබෙන්නා වූ ප්‍රතිලාභ සෘජු සහ වක්‍ර ලෙසින් රටෙහි පාරිභෝගිකයාට ද භුක්තිවිඳිමටත් එතුළින් ඔවුන්ගේ ජීවන බරට යම් සහනයක් ලබාදීමට අපගේ ගුණාත්මක නිෂ්පාදන හරහා අවස්ථාව ලැබීම ද අපට භාග්‍යයක් වේ.

### තිරසර කෘෂිකර්මාන්තය

හලාවත වැවිලි සමාගම විසින් කළමනාකරණය කරන වතු ඒකකවල වත්තට හානියක් නොවන පරිදි සත්ව පාලන කටයුතු කරගෙන යාමට වතු කම්කරුවන්හට

සහ බාහිර කිරි ගොවීන්ට අවස්ථාවක් ලබාදී ඇත. එතුළින් සමාගමට සෘජු මූල්‍යමය ලාභයක් නොලැබුන ද, වල් මර්ධන කටයුතු යම්තාක් දුරට ගවයින් මඟින් නිරායාසයෙන් සිදුවීම, පසට නිරන්තරයෙන් ගොම සහ ගව මුත්‍රා එකතුවීම වැනි කටයුතු තුළින් පසෙහි පෝෂක මට්ටම සහ පසෙහි කාබනික මට්ටම ඉහළ යාම පසේ සාරත්වයට හේතු සාධක වේ. එය චක්‍රාකාර ප්‍රතිලාභයක් ලෙස දැක්විය හැකිය.

මීට අමතරව පොල් වගාවට සෘජුව කාබනික පොහොර යෙදීම, රසායනික වල් නාශක භාවිතය අවම කිරීම, නයිට්‍රජන් තිරකාරක ජෛව වැටවල් පවත්වා ගැනීම, පොල් ශාකයෙන් ඉවත්ව පොල් අතු මඟින් වසුන් පවත්වා ගැනීම, පොල් ලෙලි ගස් වටා වැලලීම සහ පියුරේරියා වැනි ජෛවීය ආවරණ බෝග වගාව වැනි කරුණු පසෙහි ජෛවීය ගුණය ඉහළ යාමට හේතුපාදක වී ඇත.

**ජෛව පද්ධති සංරක්ෂණය සහ ''වන වගා'' කළමනාකරණය**

හලාවත වැවිලි සමාගම විසින් වගා කටයුතු වෙනුවෙන් යොදා නොගන්නා ස්වාභාවිකව ඇති වූ ස්ථාන දෙකක් සංරක්ෂිත වන ලැහැබ වශයෙන් පවත්වාගෙන යනු ලබයි. මෙහි ඉහළ ජෛව විවිධත්වයක් ද පවතී.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනුමත පස් අවුරුදු ''වන කළමනාකරණ'' සැලැස්මට අනුව වාර්ෂිකව තෝරා ගන්නා ලද වතු කොට්ඨාශයන් හි දැව ගස් හෙලීම සිදු කරනු ලැබේ. දැව ගස් හෙලීමේදී සැලැස්මෙහි අනුමත වටප්‍රමාණය 90 cm වූව ද, ප්‍රායෝගිකව වටප්‍රමාණය 120 cm ඉක්මවා ඇති දැවගස් වරණීය හෙලීමක් සිදු කරනු ලැබේ. 2019 වර්ෂයේදී අග භාගයේදී අනුමත වූ ''වන කළමනාකරණ'' සැලැස්ම 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක අතර, ඒ අතරතුර කාලයේදී දැව ගස් සහ සංරක්ෂිත ගස් හෙලීම් කරන ලද ප්‍රමාණය මෙන් පස් ගුණයක පැළ සිටුවා ක්ෂේත්‍රෙය් නඩත්තු වෙමින් පැවතුනි.



**සේවක ප්‍රතිලාභ**

සමාගමෙහි ප්‍රගමනය වෙනුවෙන් මානව සම්පත, භෞතික සම්පත සහ ජෛව සම්පත් කළමනාකරණය බෙහෙවින් උපකාරි වී තිබේ. එමෙන්ම සේවකයින්ගේ කැපවීම සහ ආකල්පමය දියුණු වීම ඊට බෙහෙවින් උපකාරී වී ඇත. වාර්ෂිකව සේවකයින්ගේ කාර්ය සාධනය මත සේවක දිරි දීමනා පිරිනැමීමත්, පොල් අස්වනු එකතු කිරීමේදී දෙනු ලබන අමතර දීමනාව අඛණ්ඩව ලබාදීමත් විදිමත් අළෙවි යාන්ත්‍රනයට වතු නිලධාරීන් ද ප්‍රවේශ කරමින් පොල් අලෙවිය පදනම්ව වතු නිලධාරීන්ට සහ වතු සේවකයින් වෙත මාසිකව 02% ක දිරි දීමනාවක් ද ලබාදීම සහ වර්ෂ අවසානයේදී සියළුම ස්ථිර සේවකයින් සඳහා ලාභාංශ ලබාදීම හලාවත වැවිලි සමාගම විසින් සිදු කරනු ලැබේ.

වාර්ෂිකව සෑම මසකම සහනදායී මිලකට පොල් නිකුත් කිරීම, වතු කම්කරු ප්‍රජාව ද ඇතුළුව සියළුම සේවකයින් රක්ෂණය කිරීම හා රක්ෂණ වන්දි ගෙවීම, අඩුපොළී අනුපාත යටතේ ආපදා ණය ලබාදීම, වතු සේවකයින්ගේ වාර්ෂික විනෝද චාරිකව සඳහා අනුග්‍රහය ලබා අනෙකුත් සුභ සාධක ක්‍රියාකාරකම් ලෙස දැක්විය හැකිය. මෙය මානව සම්පත් කළමනාකරණ උපයාමාර්ග සේවක අභිප්‍රේරණය සඳහා විශාල වශයෙන් දායක වී ඇති අතර, සමාගමේ ඵලදායිතාවය ඉහළ නැංවීම හා සමාගම කෙරෙහි ඇති බැඳියාව වර්ධනය වීමට අදාල කරුණු හේතු පාදක වී ඇත.

**ප්‍රජාවෙහි ජීවන තත්වය ඉහළ නැංවීම**

හලාවත වැවිලි සමාගම නිරන්තරයෙන් බාහිර ප්‍රජාව සමඟ සහජීවන සම්බන්ධතා ගොඩනගමින් තම ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබයි. වාර්ෂිකව වෙහෙර විහාර, සිද්ධස්ථාන මගින් ඉල්ලීමක් කරනු ලබන බොහෝ පහසුකම් අප සම්පාදනය කරන අතර, දුප්පත් සහ අසරණ පවුල් සඳහා තම නිවෙස් පිළිසකර කර ගැනීමේදී යම් සීමාවන්ට අනුව පොල් ගස් ලබාදීම, ආගමික උත්සව සඳහා විශේෂයෙන් පෙරහැරවල් වෙනුවෙන් කොප්පරා ලබා දීම තුළින් අවට ප්‍රජාවට ක්‍රියාකාරීව සහන සැලසීම වෙනුවෙන් කටයුතු කරනු ලබයි.

වැවිලි සමාගමක් ලෙස අප පාරිසරික සමාජීයව හා ආර්ථික සංතුලනය තුලින් තිරසර සංවර්ධනයක් අත්කර ගැනීම, ආර්ථිකමය ඵලදායි කෘෂිකාර්මික කටයුතු වල නියැලෙමින් සමස්ත සේවකයින්ගේ අභිප්‍රායන් ඉෂ්ඨ කරමින් රටෙහි සංවර්ධනයේ කොටස්කරුවෙකු වශයෙන් දායක වීමට හලාවත වැවිලි සමාගම කෘෂි ව්‍යාපාර සමාගමක් ලෙස ඉදිරියට ගමන් කිරීම අපගේ ඒකායන අපේක්ෂාව වේ.

## මූල්‍ය සමාලෝචනය

වාර්ෂික වාර්තාවේම කොටසක් වන මූල්‍ය ප්‍රකාශන මඟින් සමාගමේ මූල්‍ය තත්ත්වය හා මූල්‍ය ප්‍රගතිය පිළිබිඹු කරයි. මූල්‍ය සමාලෝචනය මඟින් සමාගමේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව දළ විශ්ලේෂණයක් සාකච්ඡාවට භාජනය කරනු ලබයි.

බාහිර පාරිසරික සාධක වල අහිතකර බලපෑම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂය හලාවත වැවිලි සමාගමට තවත් අභියෝගාත්මක වර්ෂයක් විය. පොල් වගා ක්ෂේත්‍රයේ ඉහළ නිෂ්පාදන පිරිවැයක් වාර්තා වීම හා කෘෂිකාර්මික කටයුතු කෙරෙහි අහිතකර පාරිසරික සාධකයන්ගේ බලපෑම් ඇතිවීම ඒ අතර විය. එවැනි අහිතකර බලපෑම් මධ්‍යයේ වුව ද 2023 වර්ෂය තුල දී යහපත් මූල්‍ය තත්වයක් අත්කර ගැනීමට සමාගමට හැකි විය.

### සමාගමේ මූල්‍ය ප්‍රගතිය ලුහුඩින්

රු.මිලි.

| | 2023 | 2022 | වෙනස රු.මිලි. | % | ප්‍රධාන සාධක |
|---|---|---|---|---|---|
| පොල් ගෙඩි (මිලි.) | 11.7 | 15.1 | (3.4) | (23%) | පසුගිය වසරේ පැවති වියළි හා අසාමාන්‍ය කාලගුණික තත්ත්වයන්. |
| සාමාන්‍ය පොල් ගෙඩියක ශුද්ධ විකුණුම් මිල (NSA) (රු.මිලි.) | 64.20 | 57.61 | 6.59 | 11% | |
| නිෂ්පාදන පිරිවැය (ගෙඩියකට) (රු.මිලි) | 45.67 | 29.22 | 16.45 | 56% | පොල් නිෂ්පාදනය අඩුවීම සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම. |
| අයභාරය (රු.මිලි.) | 900 | 975 | (75) | (8%) | ප්‍රධාන වශයෙන් පොල් නිෂ්පාදනය අඩුවීම. |
| විකුණුම් පිරිවැය (රු.මිලි.) | 672 | 512 | 151 | 29% | නිෂ්පාදන පිරිවැය වැඩිවීම, ඉහළ ආරම්භක තොග සහ අඩු අවසන් තොග නිෂ්පාදන පිරිවැයට ගැලපීම |
| අනෙකුත් ආදායම් (රු.මිලි.) | 94 | 181 | (87) | (48%) | වෙනත් ආදායම් අඩුවීම (සටහන් අංක 21) |
| පරිපාලන හා පොදු වියදම් (රු.මිලි.) | 205 | 229 | (24) | (10%) | කාර්ය සාධන දිරි දීමනා ගෙවීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන අඩු වීම. |
| මූල්‍ය ආදායම් (රු.මිලි.) | 237 | 136 | 101 | 74% | ස්ථාවර තැන්පතු ශේෂය සහ පොලී අනුපාතය ඉහළ යාම. |
| මූල්‍ය පිරිවැය (රු.මිලි.) | 62 | 44 | 18 | 41% | වාර්ෂික දල දේශීය නිෂ්පාදන අවධමනකය 48% ක වර්ධනය පදනම්ව රජයේ කල්බදු කුලිය හා පොලිය වර්ධනය වීම. |

### අයභාරය

සමාගම ප්‍රවර්තන වර්ෂය තුල දී රුපියල් මිලි. 899.6 ක අයභාරයක් වාර්තා කර ඇති අතර පසුගිය වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලි. 975.1 ට සාපේක්ෂව රුපියල් මිලි. 75.5 ක අඩුවීමක් පෙන්නුම් කරයි. පොල් අස්වැන්නේ අඩුවීම මත පොල් වලින් ලද අයභාරය පහත වැටීම මෙම අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත.

2023 වර්ෂයේ පොල් අස්වැන්න පොල් ගෙඩි 11,728,576 ක් විය. එය 2022 වර්ෂයේ වාර්තා වූ පොල් ගෙඩි 15,172,334 ට සාපේක්ෂව 23% ක පහත වැටීමකි. පසුගිය කාලය තුල පැවති වියළි හා අහිතකර කාලගුණික තත්වය මෙම අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

පොල් පර්යේෂණ ආයතනය විසින් නිකුත් කර ඇති වාර්තා වලට අනුව 2023 වර්ෂයේ දී ජාතික පොල් නිෂ්පාදනය 12% කින් පහත වැටී ඇත.

හලාවත වැවිලි සමාගමට අයත් බොහෝ පොල් වතු වියළි කෘෂි දේශගුණික කළාපය තුල පිහිටා ඇත. වැවිලි ක්ෂේත්‍රය මුහුණ දෙනු ලබන ප්‍රධාන හා අනපේක්ෂිත අවධානමක් වන්නේ නියගයයි. නියං තත්වයේ බලපෑම අවම කර ගැනීමට සඳහාත්, පාංශු තෙතමනය ආරක්ෂා කර ගැනීම සඳහාත් හැකිතාක් දුරට වැසි ජලය වතු කළාප තුල එක් රැස් කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. යටි වගා, නොමේරූ වගා වලට අවශ්‍ය ජලය සම්පාදනය කර ගැනීම සඳහා මෙම ජලය යොදා ගන්නා අතර අවශ්‍ය අවස්ථා වල දී මේරූ වගාවන් සඳහා ද මෙම ජලය භාවිතයට ගැනේ. එයට අමතරව අපගේ වතු කළාප තුල බිංදු ජල සම්පාදන ව්‍යාපෘති ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

මුළු ආදායම තුල වැඩිම දායකත්වය පොල් වලින් ලැබී ඇති අතර එය මුළු අයභාරයෙන් 84.1% කි. පසුගිය වර්ෂයේ පොල් වලින් ලද රුපියල් මිලි. 882.2 ක අයභාරයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂය තුල පොල් වලින් ඉපැයූ අයභාරය රුපියල් මිලි. 756.6 කි. අයභාරය තුල දෙවන වැඩිම ආදායම් ප්‍රභවය කජු අලෙවි ආදායම යි. එම මුළු අයභාරයෙන් 7.1% ක් නියෝජනය කරන අතර ඒ තුලින් උපයන ලද ආදායම රුපියල් මිලි. 64 කි. තවාන් ආදායම, පශු සම්පත්, අනෙකුත් බහු වාර්ෂික බෝග හා ව්‍යාපෘති වලින් උපයන ලද අයභාරය රුපියල් මිලි. 79 ක් වන අතර එය මුළු අයභාරයෙන් 8.8% ක් වේ.




## විකුණුම් පිරිවැය

පසුගිය වර්ෂයේ පැවති රුපියල් මිලි. 520.9 ට සාපේක්ෂ සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය රුපියල් මිලි. 671.9 ක් විය. පෙර වර්ෂයට සාපේක්ෂව එය රුපියල් මිලි. 151 ක වර්ධනයකි. විකුණුම් පිරිවැයෙහි සංයුතිය පහත පරිදි වේ.

### විකුණුම් පිරිවැයෙහි සංයුතිය

| | 2023 රු.මිලි. | 2022 රු.මිලි. | වැඩිවීම/ (අඩුවීම) රු.මිලි. |
|---|---|---|---|
| පොල් සහ කොප්පරා | 544.4 | 462.2 | 82.2 |
| කජු | 47.2 | 5.9 | 41.3 |
| පශු සම්පත් | 14.9 | 11.8 | 3.1 |
| තවාන් | 26.3 | 10.0 | 16.3 |
| පොල් තෙල් නිෂ්පාදන | 17.0 | 13.6 | 3.4 |
| කජු පිරිසැකසුම් | 13.3 | 9.8 | 3.5 |
| වෙනත් | 8.8 | 7.6 | 1.3 |
| **එකතුව** | **671.9** | **520.9** | **151** |

විකුණුම් පිරිවැය ඉහළ යාමට බලපෑ ප්‍රධාන හේතු පහත පරිදි දැක්විය හැක.

- **පොල් වගාවේ විකුණුම් පිරිවැය ඉහළ යාමට බලපෑ හේතු.**

- 2023 වර්ෂයේ පොල් නිෂ්පාදන පිරිවැය රුපියල් මිලි. 536 ක් වූ අතර 2022 වර්ෂයේ දී එය රුපියල් මිලි. 443ක් වූ අතර රුපියල් මිලි. 93 ක වර්ධනයක් පෙන්වයි. කෙසේ වෙතත් නිෂ්පාදන පිරිවැයට ආරම්භක හා අවසන් තොග ගැලපීමෙන් පසු විකුණුම් පිරිවැය රුපියල් මිලි. 544 ක් විය. එය පහත පරිදි වේ.

රු.මිලි.

| | 2023 | 2022 |
|---|---|---|
| නිෂ්පාදන පිරිවැය | 536 | 443 |
| ආරම්භක තොග ගැළපීම | 51 | 70 |
| අවසාන තොග ගැළපීම | (43) | (51) |
| විකුණුම් පිරිවැය | 544 | 462 |

පොල් නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට බලපෑ හේතු පහත පරිදි දැක්විය හැක.

- 2022 වර්ෂයේ රුපියල් මිලි. 285.9 ක් ව පැවති පොදු කාර්ය පිරිවැය 2023 වර්ෂයේ දී රුපියල් මිලි. 321.5 ක් දක්වා රුපියල් මිලි. 35.6 කින් ඉහළ යාම. පොදු කාර්ය පිරිවැයෙහි මෙම වැඩිවීම සඳහා බලපෑ සාධක, පහත පරිදි වේ.

- නව සාමුහික ගිවිසුම් අනුව වතු කළාප විධායක නොවන කාර්ය මණ්ඩල වැටුප් ඉහළ යාම හා කළමනාකරණ සේවා චක්‍රලේඛණ අනුව වතු විධායක නිළධාරීන් හට වාර්ෂික වැටුප් වර්ධක ලබා දීම මත වැටුප් ඉහළ යාම හේතුවෙන් වතු කළාප සේවක වැටුප් රුපියල් මිලි. 3.2 කින් ඉහළ යාම.

- ඉන්ධන මිල ඉහළ යාම, මෝටර් රථ අමතර කොටස් මිල ඉහළ යාම වැනි සාධක හේතුවෙන් වතු කළාප අධීක්ෂණ මෝටර් රථ පිරිවැය 2022 පැවති රුපියල් මිලි. 19.1 ක සිට රුපියල් මිලි. 22.7 ක් දක්වා වර්ධනය වී ඇත.

- විදුලි ගාස්තු ඉහළ යාම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල විදුලි වියදම රුපියල් මිලි. 5.8 කින් වැඩි වී ඇත.

- සේවක සුභසාධනය, ජල සැපයුම, තැපැල් සහ ලිපි ද්‍රව්‍ය, රක්ෂණය, ආරක්ෂක සේවා, වෛද්‍යාධාර වැනි වියදම් වෙනුවෙන් දැරූ පිරිවැය රුපියල් මිලි. 7.9 කින් වර්ධනය වී ඇත.

- අනිත් මිලදී ගත් වත්කම් වලට අදාල ක්ෂය වෙන් කිරීම හේතුවෙන් වර්ෂයට අදාල ක්ෂය වෙන් කිරීම් පිරිවැය රුපියල් මිලි. 6.1 කින් වැඩි වී ඇත.

- 2022 වර්ෂයේ ඵල දරන වගාවන් වෙනුවෙන් පොහොර යෙදීමට වැයකල රුපියල් මිලි. 6.1 ක පිරිවැය 2023 වර්ෂයේ දී රුපියල් මිලි. 57 ක් දක්වා වැඩි වී ඇත. රටතුල පැවති පොහොර හිඟය හේතුවෙන් 2022 වර්ෂයේ දී අඩු වගා ප්‍රදේශයකට පමණක් පෙහොර යෙදීම 2022 වර්ෂයේ පොහොර පිරිවැය අඩුවීමට හේතුවිය.

- අස්වැන්න නෙලීමේ ගාස්තු හා ප්‍රවාහන ගාස්තු වැඩිවීම හේතුවෙන් 2022 වර්ෂයේ රුපියල් මිලි. 82.9 ක් වූ අස්වනු නෙලීමේ පිරිවැය රුපියල් මිලි. 87.8 ක් දක්වා වැඩි වී ඇත.

- **කජු විකුණුම් පිරිවැය**

සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදිත පිරිවැයට ඉහළ වටිනාකමකින් යුත් ආරම්භක තොගයක් හා අඩු අවසාන තොගයක් ගැළපීම හේතුවෙන් කජු විකුණුම් පිරිවැය පසුගිය වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලි. 41.3 කින් ඉහළ ගොස් ඇත. එය පහත පරිදි විස්තර කෙරේ.

රු.මිලි.

| | 2023 | 2022 |
|---|---|---|
| නිෂ්පාදන පිරිවැය | 18.6 | 26.3 |
| ආරම්භක තොග ගැළපීම | 29 | 8.6 |
| අවසාන තොග ගැළපීම | (.4) | (29) |
| විකුණුම් පිරිවැය | 47.2 | 5.9 |

- වර්ෂය තුල පොල් පැළ තවාන් වල වගාවට නුසුදුසු හා වැඩියෙන් වැඩුණු පොල් පැළ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පොල් පැළ තවාන් හී විකුණුම් පිරිවැය රුපියල් මිලි. 16.3 කින් ඉහළ ගොස් ඇත.

### දල ලාභය

2022 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලි. 454.1 ක දල ලාභයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ දල ලාභය රුපියල් මිලි. 227.8 කි. පොල් අස්වැන්නේ අඩුවීම මත පොල් ඇස්වැන්න තුලින් උපයන ලද දල ලාභය අඩුවීම හා වගාවට නුසුදුසු පොල් පැල වල වටිනාකම පොත් වලින් ලියා හැරීම හේතුවෙන් පොල් තවාන් වලින් උපයන ලද දල ලාභය පහත වැටීම වර්ෂයේ දල ලාභය අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

### අනෙකුත් මෙහෙයුම් ආදායම

2022 වර්ෂයේ උපයන ලද රුපියල් මිලි. 181.5 ට සාපේක්ෂව 2023 වර්ෂයේ දී අනෙකුත් මෙහෙයුම් ආදායම් රුපියල් මිලි. 94 ක් දක්වා 48% කින් අඩු වී ඇත. පොල් ලෙලි සහ පොල් කටු ආදායම රුපියල් මිලි. 1.2 කින් පහත වැටීම පොල් ගස් අලෙවි ආදායම රුපියල් මිලි. 10.2 කින් පහත වැටීම, දැවගස් අලෙවි ආදායම රුපියල් මිලි. 13 කින් පහත වැටීම, වගාවන් වෙනුවෙන් ලබා දුන් ඉඩම් බදු කුලී ආදායම රුපියල් මිලි. 4.8 කින් පහත වැටීම හා වැව් පතස් පුළුල් කිරීම තුලින් උපයන ලද ආදායම රුපියල් මිලි. 64.2 කින් පහත වැටීම යන සාධක පසුගිය වර්ෂයට සාපේක්ෂව අනෙකුත් ආදායම් හී අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

අනෙකුත් ආදායම් මූලාශ්‍ර පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 21 යටතේ ඉදිරිපත් කර ඇත.

### පරිපාලන හා පොදු වියදම්

2023 වර්ෂයේ පරිපාලන වියදම් රුපියල් මිලි. 205 ක් වන අතර 2022 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලි. 229 ට සාපේක්ෂව රුපියල් මිලි. 24 ක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2023 වර්ෂයේ පැවති ලාභ මට්ටම අනුව සේවක දිරි දීමනා ගෙවීම් කිරීම සඳහා කරන ලද වෙන්කිරීම් අඩුවීමයි.

### මූල්‍ය ආදායම

මූල්‍ය ආදායම ප්‍රධාන වශයෙන් කෙටිකාලීන බැංකු තැම්පත් පොළී ආදායම හා සේවක ණය පොළී ආදායම මගින් නියෝජනය කරනු ලබයි.

2022 වර්ෂය හා සැසඳීමේ දී මූල්‍ය ආදායම රුපියල් මිලි. 135.8 ක සිට රුපියල් මිලි. 237.3 ක් දක්වා 75% කින් වර්ධනය වී ඇත. කෙටිකාලීන තැම්පත් ප්‍රමාණය ඉහළ යාම හා පොළී අනුපාතය ඉහළ යාම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

### මූල්‍ය පිරිවැය

මූල්‍ය පිරිවැය ප්‍රධාන වශයෙන් ජනවසම කල්බදු වත්කම් පොළී ගෙවීම් වලින් හා අසම්භාව්‍ය කල්බදු කුලියෙන් සමන්විත වේ. 2023 වර්ෂයේ ජනවසම කල්බදු පොළිය හා අසම්භාව්‍ය කල්බදු කුලිය රුපියල් මිලි. 55.7 කි. එය පසුගිය වර්ෂයේ පැවති රුපියල් මිලි. 41.8 ට සාපේක්ෂව 33% ක වැඩිවීමකි. මෙම වැඩිවීම වාර්ෂික දල දේශීය නිෂ්පාදන අවධමනකය (GDP Deflator) පදනම් කර ගනිමින් සිදු වී ඇත.

(2022 වර්ෂයේ වාර්තා වූ 7.9% ට සාපේක්ෂව 2023 වර්ෂයේ දී දල දේශීය නිෂ්පාදන අවධමනකය 48% ක් ලෙස වාර්තා වී ඇත).

ඊට අමතරව ජනවසම වෙතින් කල්බදු පදනම යටතේ ලබාගෙන ඇති පලෙයි වතු කලාපයට අදාලව ගෙවන ලද රුපියල් මිලි. 3 ක් වූ කල්බදු පොළිය ද මූල්‍ය පිරිවැය තුල අන්තර්ගත වේ.

### බදු පෙර ලාභය

පෙර වර්ෂයේ ලාභය වූ රුපියල් මිලි. 513.8 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුල සමාගම රුපියල් මිලි. 302.6 ක බදුපෙර ලාභයක් වාර්තා කර ඇත. වර්ෂය තුල පොල් අස්වැන්න 23% කින් පහත වැටීම, තවාන් වලින් උපයන ලද ලාභය අඩුවීම, අනෙකුත් ආදායම් අඩුවීම බදුපෙර ලාභයෙහි අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත.




## බදු

පසුගිය වර්ෂයේ රුපියල් මිලි. 20.4 ට සාපේක්ෂව සමාගම සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලි. 70.8 ක් බදු සඳහා වෙන්කර ඇත. (බදු ගණනය ගිණුම්කරන සටහන් අංක 24 යටතේ දක්වා ඇත).

## ලාභාංශ

2008 මැයි මස හලාවත වැවිලි සමාගමෙහි කළමනාකාරිත්වය යලි රජයට පවරා ගැනීමෙන් පසු හලාවත වැවිලි සමාගම විසින් රුපියල් මිලි. 630 ක මුළු ලාභාංශ මුදලක් මහා භාණ්ඩාගාරය/ ස්වර්ණමය කොටස් හිමිකරු වෙත ගෙවීම් කර ඇත. 2008 වර්ෂයේ සිට 2023 වර්ෂය අතර කාලය තුල උපයන ලද ලාභයට සාපේක්ෂව එය සැලකිය යුතු ඉහළ අගයකි.

එමෙන්ම 1992 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගත් කල හලාවත වැවිලි සමාගම විසින් මහා භාණ්ඩාගාරය වෙත ලබා දෙන ලද මුළු ලාභාංශ ප්‍රමාණය රුපියල් මිලි. 792 කි.

## මානව සම්පත් සේවාව ඇගයීම

මානව සම්පත ආයතනයක වඩාත් වැදගත් වත්කමක් බවට දැඩි විශ්වාසය හේතුවෙන් සමාගම සේවකයන් දිරිමත් කිරීම සඳහා 2023 වර්ෂයේ දී සේවක කාර්ය සාධක දිරිදීමනා ලෙස රුපියල් මිලි. 29.5 ක් සේවකයින් වෙත ගෙවා ඇත. මෙය සේවකයින්ට වඩා හොඳ කාර්ය සාධනයක් සඳහා දිරි ගැන්වීමක් වේ. එයට අමතරව 2023 වර්ෂයේ දී රුපියල් මිලි. 12.9 ක් රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක PED 4/2023 ට අනුව ප්‍රසාද දීමනා ලෙස සේවකයින් වෙත ගෙවා ඇත.

## කොටසක ඉපයීම

පෙර වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලි. 24.67 ක කොටසක ඉපයීමට සාපේක්ෂව මූල්‍ය වර්ෂය තුල සමාගම කොටසක් සඳහා රුපියල් මිලි. 11.59 ක ලාභයක් උපයා ඇත.

## ජංගම අනුපාතය

පෙර වර්ෂයේ වාර්තා වූ වාර 3.9 ට සාපේක්ෂව 2023 වර්ෂයේ ජංගම අනුපාතය වාර 3.57 කි. ජංගම අනුපාතය වාර 3.57 ක් ලෙස පැවතීම සමාගමට කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට හැකි ප්‍රශස්ත මට්ටමක් පෙන්නුම් කරයි.




## ස්කන්ධය

ස්කන්ධය කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලි. 200 කින් හා සංචිත රුපියල් මිලි. 2,179.6 කින් සමන්විත වේ. සංචිතයන්හි සංයුතිය පහත දක්වා ඇත.

රු. මිලි.

| | 2023 | 2022 |
|---|---|---|
| නොබෙදූ ලාභ | 1,844.7 | 1833.5 |
| දැව සංචිත හා මෝටර් රථ ප්‍රත්‍යාගණන සංචිත | 334.9 | 321.5 |
| **මුළු සංචිත** | **2,179.6** | **2,155.0** |

රු. මිලි.

| ද්‍රවශීලතා මට්ටම | 2023 | 2022 |
|---|---|---|
| මුළු ජංගම වත්කම් | 1,457 | 1,414 |
| මුළු ජංගම වගකීම් | 409 | 363 |
| ශුද්ධ කාරක ප්‍රාග්ධනය | 1,048 | 1,051 |
| ජංගම අනුපාතය | 3.57 | 3.9 |

පසුගිය වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලි. 1,051 ට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ කාරක ප්‍රාග්ධනය රුපියල් මිලි. 1,048 කි.

## කොටස් හිමියන්ගේ අරමුදල් අනුපාතය

ප්‍රාග්ධන ව්‍යුහය තුල කොටස් හිමියන්ගේ අරමුදල් 2022 වර්ෂයේ පැවති රුපියල් මිලි. 2,355 ක සිට 2,380 ක් දක්වා 2023 වර්ෂයේ දී 1% කින් වර්ධනය වී ඇත.

සමාලෝචිත වර්ෂයේ කොටස් හිමියන්ගේ අරමුදල් මුළු වත්කම් වලින් 78% කට සමාන වේ.

## පසුගිය වසර 5 තුළ කොටස් හිමියන්ගේ අරමුදල්






### ජංගම නොවන වත්කම් වල ආයෝජනය

2023 වර්ෂය තුල සමාගම නව වගා/ යටි වගා හා නොමේරූ වගා නඩත්තු කිරීම් වෙනුවෙන් රුපියල් මිලි. 59.3 (2022 - රුපියල් මිලි. 54.5) ක් ද, දේපළ, පිරියත හා උපකරණ වෙනුවෙන් රුපියල් මිලි. 45.5 (2022 - රුපියල් මිලි. 70.8) ක් ද ආයෝජනය කර ඇත.

2023 ශේෂපත්‍ර දිනට ජංගම නොවන වත්කම් (දේපළ පිරියත හා උපකරණ, කල්බදු වත්කම්, ජෛව වත්කම් හා කල්බදු වත්කම් සංවර්ධනය කිරීම් වැනි) වල ශුද්ධ පොත් අගය රුපියල් මිලි. 1,590.9 කි (2022 රුපියල් මිලි. 1,476.5).

### මුදල් ප්‍රවාහ

### ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය

2023 වර්ෂයේ සමාගම එහි මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් රුපියල් මිලි. 311.8 ක ශුද්ධ මුදල් ප්‍රවාහයක් වාර්තා කර ඇත. පෙර වර්ෂයේ එය රුපියල් මිලි. 431.6 ක් විය. සමාගම වර්ෂය තුල අත්පත් කර ගත් ඉහළ කාර්ය සාධනය ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහයේ ධනාත්මක අගයක් වාර්තා වීමට හේතු විය.

### ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදුවූ මුදල් ප්‍රවාහය

පසුගිය වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලි. 201.7 ට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂය තුල ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් ශුද්ධ මුදල් ගලායාම් රුපියල් මිලි. 107.7 ක් ලෙස වාර්තා වී ඇත. සමාලෝචිත වර්ෂය තුල සමාගම ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු වෙනුවෙන් රුපියල් මිලි. 69.3 ක් ආයෝජනය කර ඇති අතර රුපියල් මිලි. 45.5 ක් දේපළ පිරියත උපකරණ වෙනුවෙන් ආයෝජනය කර ඇත. එය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ශුද්ධ මුදල් ගලායාම් සඳහා ප්‍රධාන වශයෙන් හේතු සාධක වී ඇත.

### මූල්‍ය ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ රුපියල් මිලි. 138.2 ක ශුද්ධ මුදල් ප්‍රවාහයක් නිරූපනය කරයි. මහා භාණ්ඩාගාරය වෙත රුපියල් මිලි. 130 ක ලාභාංශ ගෙවීම, රුපියල් මිලි. 9 ක හිඟ කල්බදු වාරික ගෙවීම යන කරුණු මූල්‍ය ක්‍රියාකාරකම් තුල ශුද්ධ මුදල් ගලායාම් සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

### කෙටිකාලීන තැම්පතු හා බැංකු ශේෂයන්

සමාලෝචිත වර්ෂය අවසනට බැංකු වල කෙටිකාලීන තැම්පතු, මුදල් හා මුදල් සමාන දෑ රුපියල් මිලි. 1,134 ක් වූ අතර එය 2022 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලි. 1,053 ට සාපේක්ෂව 8% ක වර්ධනයකි.

## ආයතනික පාලන ප්‍රකාශනය

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකත්වය, ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හා වගකීම් සහගත බව යන ප්‍රතිපත්ති තුල ක්‍රියාකරනු ලබයි. මෙය සමාගම සහ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස් සමඟ ප්‍රබල සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා හේතු වී ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් සහ ආයතනික ස්ථායිතාව මෙන්ම ව්‍යාපාරික වටිනාකම වැඩිවන අයුරින් සකස් කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියා පටිපාටින්, ක්‍රියා පිළිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරීම සඳහා හේතු වී ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යය සාධනය සඳහා වගකීව යුතු වන්නාසේම අවසාන වශයෙන් ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටින්නේය.

### වගකීම්

මූලික ප්‍රතිපත්තීන් හා උපායශීලි අරමුණ සකස් කිරීමටත් ඒවා ක්‍රියාවට නැංවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. සමාගමේ මූල්‍ය තොරතුරු වල විශ්වාසනීයත්වය සහ අභ්‍යන්තරික පාලන ක්‍රමවේදයන්ගේ සාර්ථකත්වය සඳහා ද අවසාන වගකීම් දරන්නා වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

### සංයුතිය

සභාපති/ප්‍රධාන විධායක නිළධාරි ඇතුළුව 2023 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් සත්දෙනෙකුගෙන් සමන්විත වේ.

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබයි. සමාගමේ උපායශීලී ක්‍රමෝපායන්, වාර්ෂික අයවැය, සියළු කාර්යයන් වල ප්‍රගතිය, ප්‍රාග්ධන හා ප්‍රවර්ථන වියදම් සමාලෝචනයට ලක් කිරීම මෙම රැස්වීමේදී සිදුවේ. සෑම රැස්වීමක් පැවැත්වීමටම සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් හට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

2023 වර්ෂය තුලදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 ක් පවත්වා ඇත.

### විගණන කමිටුව

සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන එච්. ජී. සුමනසිංහ මහතා විගණන කමිටුවේ සභාපතිත්වය උසුලන අතර වර්ෂය තුල ඇගයීම් 3 ක් සිදුකර ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරියකු නිරීක්ෂකයෙකු වශයෙන් විගණන කමිටු රැස්වීම් වලට සහභාගි වි ඇත.

සමාගමේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරි, විධායක අධ්‍යක්ෂ, සහකාර සමාන්‍යාධිකාරි වැවිලි, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි විමසීම් කරන අවස්ථා වලදී මෙම කමිටු රැස්වීම් වලට සහභාගි වේ.

### නීතිමය අවශ්‍යතාවලට අනුකූලවීම

සාංඝමික සංස්ථා පත්‍රය, සාංඝමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා බලපවත් වන අනෙකුත් නීති රීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය හැකි සෑම උත්සාහයක්ම ගනු ලබන බවට සහතික වේ. එමෙන්ම සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි පිළියෙල කරන බවටත් 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරනු ලබයි.

## අවදානම් කළමනාකරණය

විශේෂයෙන් කෘෂි ක්ෂේත්‍රයේ පවතින සමාගමක් ලෙස පරිසරය තුල විකාශය වීම හා විවිධ මට්ටමේ අවදානම් කෙරෙහි නිරාවරණය වී ඇති අතර කාලගුණ රටාව හා වෙළඳපළ උච්චාවචනයන් කෙරෙහි ඉහළ සංවේදී බවක් දක්වයි. අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුලින් දැනුවත්ව හා දූරදර්ශීභාවයෙන් අවදානම් දැරීම කෙරෙහි සහතික වීම බලාපොරොත්තු වේ.

**අවදානම් පාලන ක්‍රමෝපායන්**

| අවදානම් සාධකය | අවදානම් ඇගයීම | අවදානම් පාලන ක්‍රමෝපායන් |
|---|---|---|
| දේශගුණික වෙනස්වීම් | මාස ගණනක් අඛණ්ඩව පවතින අනපේක්ෂිත නියඟ වැනි අයහපත් කාලගුණික තත්වයන් නිසා පොල්, කජු සහ අනෙකුත් බහු වාර්ෂික බෝග වල අස්වැන්න උච්චාවචනය.<br><br>වැසි කාලය තුල ලැබෙන අධික වර්ෂාපතනය හේතුවෙන් ගංවතුර ඇතිවීම මත කෘෂිකාර්මික පිලිවෙත් වලට හා අස්වනු නෙලීම් වලට තර්ජනයක් වීම. | වගාවේ පස් අතර වර්ෂා ජලය රඳවා තබා ගැනීම සඳහා වලවල් කපා පොල් ලෙලි වළලා පසේ තෙතමනය වැඩිකර ගැනීමට කටයුතු කිරීම හා ගිනිසීරියා, පියුරේරියා වැනි ආවරණ බෝග වැවීම.<br><br>පසු කාලීනව වාරි සම්පාදනය සඳහා භාවිතා කිරීමට හා පාංශු තෙතමනය ආරක්ෂා කිරීම තුලින් මුල් මඟින් ශාක වලට අවශ්‍ය ජලය සැපයීම සඳහා වර්ෂා ජලය එක් රැස් කර ගැනීමට වැව් වැඩි සංඛ්‍යාවක් පිළිසකර කිරීම.<br><br>පැල හා ශාඛ වල ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා නල මඟින් වාරි ක්‍රම ස්ථාපිත කිරීම.<br><br>අවශ්‍ය අවස්ථාවලදී රක්ෂණ ආවරණ ලබා ගැනීම. |
| නිෂ්පාදනය අඩුවීම | වයස අවුරුදු 50 ට වැඩි මේරූ ගස් ඉහළ ප්‍රතිශතයක් පැවතීම නිසා එම ගස් වියපත්, ඵල නොදරන තත්වයට පත්වීම.<br><br>ඊට අමතරව, අනපේක්ෂිත රෝග හා ස්වාභාවික හේතු ශාක වලට සහ වගාවට බලපෑම. | වයස් ගත ශාක ගහණය වෙනුවට යටි වගා හා නව වගා ඇති කිරීම.<br><br>මයිටා මර්ධනය සඳහා රසායනාගාර 02 ක් පළුගස්වැව වතුයායේ සහ දිවුලපිටිය වතුයායේ ස්ථාපිත කිරීම.<br><br>ඒකාබද්ධ පලිබෝධ කළමනාකරණ උපාය මාර්ග ඇති කිරීම.<br><br>කාර්ය මණ්ඩලය වෙත පලිබෝධ හා රෝග කළමනාකරණය පිළිබඳව නිරන්තර පුහුණුවක් ලබා දීම. |
| භාණ්ඩ වෙළඳ චක්‍රය | ආහාර සඳහා ගනු ලබන පොල් හා ආශ්‍රිත නිෂ්පාදන වෙනුවට ආදේශක භාණ්ඩ පැවතීම තුලින් පාරිභෝගික ඉල්ලීම අඩු වීමෙන් මිල පහත වැටීම සහ අස්ථාවර අලෙවිය නිසා විශාල පොල් ගෙඩි ප්‍රමාණයක් වතුයායන් තුල ගොඩ ගැසී තිබීම හා විකල්ප ක්‍රියා මාර්ග නොගතහොත් නරක් වීමට හා විනාශ වීමට ඉඩ තිබීම.<br><br>පාම් තෙල් වැනි තරඟකාරී ආදේශක භාණ්ඩ වල මිල අඩුවීම නිසා වැඩි පාරිභෝගික ආකර්ෂණයකට ලක් වීම තුලින් පොල් මිල හා ඉල්ලුම කෙරෙහි බලපෑම. | වතු කලාප මට්ටමින් පවත්න පොල් වෙන්දේසියට අමතරව එහිදී අලෙවි නොවන පොල් ප්‍රධාන කාර්යාලයේ සෑම සති දෙකකට වරක් පවත්වනු ලබන ''පොල් පොළේ'' දී අලෙවි කිරීම.<br><br>සමාගම විසින් ප්‍රජාවට පොල් අලෙවි කිරීම සඳහා දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන් හඳුන්වා දී ඇති අතර අගය එකතු කල නිෂ්පාදන සඳහා යොමු වීම.<br><br>වෙන්දේසියේ දී අලෙවි නොවන පොල් මගින් කොප්පරා නිෂ්පාදනය කර කොටසක් කොප්පරා ලෙස වෙන්දේසියේ දී අලෙවි කිරීම හා ඉතිරිය පලුස්වැව වතුයායේ ස්ථාපිත කර ඇති තෙල් මෝලේ දී පිරිසිදු පොල්තෙල් නිෂ්පාදනය කිරීම. |

| අවදානම් සාධකය | අවදානම් ඇගයීම | අවදානම් පාලන ක්‍රමෝපායන් |
|---|---|---|
| | | අලෙවිසැල් හරහා පාරිභෝගිකයින් වෙත සෘජුවම පොල් ලබා දිමටත් රාජ්‍ය ආයතනවල සේවක මණ්ඩල වෙත විශේෂයෙන් පොල් බෙදා හැරිමටත් කටයුතු යොදා ඇත. |
| ණය අවදානම | නීති රෙගුලාසි වලින් බැඳීමට අපොහොසත් වීම මත ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් ගෙවීමට ප්‍රමාද වීමේ ඉඩකඩ තිබීම. | සමීප ගෙවීම් සුපරීක්ෂණ ක්‍රමවේද මගින් ගැනුම්කරුවන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම පිළිබඳ සහතික කිරීම.<br><br>ගෙවීම් කල්ගත වී ඇති හෝ ප්‍රතිචාර නොදක්වන ගැනුම්කරුවන්ගෙන් මුදල් පියවා ගැනීම සඳහා නීතිමය මැදිහත් වීම ලබා ගැනීම.<br><br>රජයේ කල්බදු ගෙවීම සුපරික්ෂාකාරීව සොයා බලා ප්‍රමාදයකින් තොරව ගෙවා දැමීම.<br><br>සමාගම ගැණුම්කරුවන් වෙතින් අයවිය යුතු ශේෂයන් අයකර ගැනිම සඳහා නීති රීති හඳුන්වා දීම. |
| සේවක කළමනාකරණය | අඩු ඵලදායීතාවයක් හා නිමැවුමක් ඇති වීමට හේතු වන රැකියාව පිළිබඳ දැනුම හා අභිප්‍රේරණය නොමැතිකම.<br><br>වැඩි වැටුප් හා ඉහළ තනතුරු අපේක්ෂාවෙන් සේවකයන් වෙනත් ක්ෂේත්‍රයන් හෝ සමාගම් වෙත යාම. | වැඩමුළු හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br><br>මූල්‍ය දිරිදීමනා හා සුභසාධන ක්‍රියාමාර්ග මගින් සේවක ප්‍රතිලාභ වැඩි කිරීම.<br><br>නිතිපතා සංවාද මගින් සේවක වෘත්තීය සංගම් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.<br><br>සේවකයින්ට අදාල වන ප්‍රතිලාභ වලට අදාලව පාලන අවශ්‍යතා සියල්ලම ඇති කිරීමට කටයුතු කිරීම.<br><br>වෘත්තීයමය යෝග්‍යතාවය අනුව ජ්‍යෙෂ්ඨ තනතුරු සඳහා හැකිතරම් දුරට අභ්‍යන්තරිකව රැකියා උසස්වීම් ලබා දීමට ක්‍රියාකිරීම. |
| වත්කම් අවදානම | ගිනි, සොරකිය සහ යන්ත්‍රෝපකරණ ක්‍රියා විරහිත වීමේ අවදානම.<br><br>කෘමීන්, සතුන්ගෙන් වන හානි සහ අකුණුසැර, ගංවතුර වැනි ස්වාභාවික ආපදා.<br><br>විවිධ පාර්ශවයන් විසින් ඉඩම් අත්පත් කර ගැනිමට උත්සාහ කිරිම. | සියළු ස්පෘශ්‍ය වත්කම් සඳහා රක්ෂණ ආවරණ ලබා ගැනීම.<br><br>එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට වත්කම් රැගෙන යාමේ දී දැඩි පාලන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.<br><br>ගිනි බාධක ඇති කිරීම මගින් පිටත සිට ආයතනයේ වතු වලට ගින්න පැතිරිම වලක්වා ගැනිම හා අනෙකුත් පූර්ව ආරක්ෂක ක්‍රියාමාර්ග ගැනීම.<br><br>හානි වළක්වා ගැනීමේ නඩත්තු වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාවට නැංවීම.<br><br>යහපත් කෘෂිකාර්මික ක්‍රමවේද අනුගමනය කිරිම.<br><br>සියළු ඉඩම් සඳහා මිනින්දෝරු සැලැස්ම සකස් කරමින් පවතින අතර නීති විරෝධි අත්පත් කර ගැනීම්වලට එරෙහිව නීත්‍යානුකූල පියවර ගැනීම. |

| අවදානම් සාධකය | අවදානම් ඇගයීම | අවදානම් පාලන ක්‍රමෝපායන් |
| --- | --- | --- |
| ප්‍රාග්ධන ආයෝජන අවදානම | අපේක්ෂිත ලාභ නොලැබීමේ අවදානම සහ ආයෝජන වලින් අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම. | ආයෝජන මට්ටම් අනුව හා අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීම් කාලය පදනම් කර ගනිමින් ප්‍රාග්ධන වියදම් අනුමත කිරීම සඳහා දැඩි පාලන ක්‍රමවේද අනුගමනය කිරීම |
| කීර්තිනාම අවදානම | ආයතනය පිළිබඳව හා වෙළඳාම, සේවා නියුක්තිය, කාර්ය පටිපාටියට අදාල මූලධර්ම, ක්‍රියාපටිපාටින්, ප්‍රමිතීන්, නීති හා රෙගුලාසි පිළිබඳ ප්‍රමානවත් අවබෝධයක් නොමැති වීම.<br>පාරිභෝගික හෝ වෙළෙඳපොල අවශ්‍යතා හා ප්‍රමිති වලට නොගැලපෙන නිෂ්පාදන.<br>කාර්ය සාධනය, ඉලක්ක හා ප්‍රමිති පිළිබඳ දැනුම නොමැතිකම. | කාර්ය මණ්ඩලය, බැංකුකරුවන්, පාරිභෝගිකයන් වැනි විවිධ උනන්දුවක් දක්වන පාර්ශව සමඟ එලදායී සන්නිවේදනයක් ඇති කිරීම.<br>නිෂ්පාදන ප්‍රමිතිය, නිෂ්පාදන ක්‍රමවේදය ප්‍රමිතිගත මට්ටමින් පවත්වාගෙන යාම.<br>අයවැය ක්‍රියාවලියේ හා අයවැය පාලන ක්‍රමවේදයක් මාසිකව අනුගමනය කිරීම මඟින් සමාගමේ කාර්යසාධනය එහි ඉලක්ක සමඟ අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කිරීම.<br>භාණ්ඩ හා සේවා වල ගුණාත්මක භාවය පිළිබඳ පාරිභෝගික ප්‍රතිචාර ලබා ගැනිම. |
| යෙදවුම් අමුද්‍රව්‍ය අවධානම | රටේ පවතින වර්ථමාන තත්ත්වය හේතුවෙන් පොහොර, ඉන්ධන වැනි අත්‍යවශ්‍ය යෙදවුම් හිඟවීම සහ නොමැති වීම. | කාබනික පොහොර වැනි ආදේශක යෙදවුම් වලට අනුවර්ථනය වීම<br>යෙදවුම් භාවිතය පිළිබඳව සමීප සුපරික්ෂණය. |
| ආහාර ආරක්ෂණ අවධානම සේවක/ ප්‍රජාව අතර | රටේ පවතින තත්ත්වය මත අහාර හිඟයක් ඇතිවීමේ හැකියාවක් පැමිණීම | සේවකයන් වෙත කෙටිකාලීන බෝග වගාකිරීම සඳහා ඉඩම් කොටස් හා බීජ ලබාදීම.<br>බාහිර පාර්ශවයන් වෙත වගා කටයුතු සඳහා බදු පදනම මත ඉඩම් ලබා දීම. |

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ විගණන කමිටුව එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ කටයුතු සඳහා වැදගත් කාර්යය භාරයක් ඉටු කරයි. විගණන කමිටුව අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු වන භාණ්ඩාගාර නියෝජිතයාද ඇතුළුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර කමිටුවේ සභාපති මූල්‍ය කළමනාකරණ කුසලතාවයන්ගෙන් සමන්විත වීම වඩාත් සුදුසුය.

කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක්වත් රැස්විය යුතු අතර ප්‍රධාන අභ්‍යන්තර විගණක රැස්වීමේ කැඳවුම්කරු ලෙස කටයුතු කරන අතර කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ඉදිරිපත් කළ යුතුය.

2023 වර්ෂයේ හලාවත වැවිලි සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර කමිටුවේ සභාපති ලෙස භාණ්ඩාගාරයේ නියෝජිතයාද සෙසු සාමාජිකයින් ලෙස වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරියක සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකුගෙන් සමන්විත විය. විගණන කමිටුවේ ආරාධනය පරිදි හලාවත වැවිලි සමාගමේ සභාපති / ප්‍රධාන විධායක නිලධාරී, සාමාන්‍යාධිකාරී සහ අංශ ප්‍රධානීන් ද ජාතික විගණන කොමිසම වෙනුවෙන් විගණන අධිකාරිවරයෙක්ද රැස්වීමට සහභාගී විය. රැස්වීම් වාර්තා සකස් කරන ලද්දේ හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසිනි.

පහත වගකීම් ඉටු කිරීම උදෙසා සමාගමේ විගණන කමිටුව එහි අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය ලබා දෙයි.

- **අරමුණ**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශය සකස් කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම කර තිබේදැයි යන්න.

සමාගමේ මූල්‍ය වාර්තා, සමාගම් පනතේ නියමයන්, අනෙකුත් රෙගුලාසි සහ අවශ්‍යතාවන්ට අනුකූලව සකස්කර තිබේදැයි යන්න.

ජාත්‍යන්තර මෙන්ම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව ශක්තිමත්, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පිළිවෙත් සමාගමේ කළමනාකාරිත්වය හඳුන්වා දී තිබේද, අවදානම් කළමනාකරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ගෙන තිබේද යන්න.

- **විගණන කමිටු රැස්වීම්**

සමාගමේ විගණන කමිටුව, ජාතික විගණන කොමිසමේ විගණන අධිකාරිවරයෙකුගේද සහභාගිත්වයෙන් 2023 වර්ෂයේ රැස්වීම් තුනක් පවත්වන ලදී. එහිදී සමාගමේ අභ්‍යන්තර විගණන වාර්තා සහ විගණන කොමිසම විසින් හලාවත වැවිලි සමාගමට අදාලව නිකුත් කර තිබූ විගණන වාර්තා, ඊට ලබා දී තිබූ පිළිතුරු සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග සම්බන්ධව සාකච්ඡා කරන ලදී. කමිටු රැස්වීම් පැවැත්වූ දිනයන් සහ ඊට සහභාගී වූ කමිටු සාමාජිකයින්ට අදාල තොරතුරු පහත පරිදි වේ.

| **කමිටු සාමාජිකයාගේ නම** | **රැස්වූ දිනයන් සහ ඊට සහභාගිවීම්** | | |
|---|---|---|---|
| | **13.06.2023** | **15.11.2023** | **18.12.2023** |
| එච්.ජී සුමනසිංහ මහතා<br>(කමිටු සභාපති / භාණ්ඩාගාර නියෝජිත) | √ | √ | √ |
| අරුණි එස් රණසිංහ මිය<br>(වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්) | √ | √ | √ |
| එන්.රාජසිංහ මහතා<br>(ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි) | √ | √ | √ |

- **සංයුතිය**

2023 වර්ෂය තුළ පවත්වන ලද විගණන කමිටු රැස්වීම් විධායක නොවන අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර, හලාවත වැවිලි සමාගමේ සභාපති / ප්‍රධාන විධායක නිලධාරී, සාමාන්‍යාධිකාරී සහ අංශ ප්‍රධානීන්ද කමිටුවේ ඉල්ලීම මත රැස්වීම් සඳහා සහභාගී විය.

- **විගණන කමිටුවේ විෂය පථය**

කමිටු සාමාජිකයින් මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර විගණනය, අවදානම් කළමනාකරණය, බාහිර විගණකවරුන් සමග සබඳතා, අනුකූලතා පරීක්ෂා, වාර්තා කිරීමේ වගකීම්, සම්බන්ධ පාර්ශවයන් අතර ගනුදෙනු සිදුකර ඇත්දැයි යනාදී ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.



**එච්.ජී. සුමනසිංහ**
සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව
හලාවත වැවිලි සමාගම

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා විගණකාධිපති වාර්තාව ඇතුලත් වාර්ෂික වාර්තාව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

### නෛතික තත්ත්වය

සීමාසහිත හලාවත වැවිලි සමාගම 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ (සමාගම 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කරන ලදි.) සහ 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හා ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කල වගකීමක් සහිත සීමාසහිත සමාගමක් වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම් පාර, අංක 165 යන ලිපිනයේ පිහිටා ඇති අතර කොළඹ කාර්යාලය කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 55/75, යන ලිපිනයෙහි පිහිටා ඇත. වතුයායන් පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්ක වල පිහිටා ඇත.

පහත සඳහන් ආකාරයට වතු කලාප 08 ක් යටතේ පාලනය කෙරේ.

- පලුගස්වැව වත්ත
- හලාවත වතු කලාපය
- තම්බපණ්ණි වතු කලාපය
- මංගලඑළිය වතු කලාපය
- දිවුලපිටිය වතු කලාපය
- මාදම්පේ වතු කලාපය
- බිංගිරිය වතු කලාපය
- නිකවැරටිය වතු කලාපය

ඉහත වතු කලාප වලට අමතරව පලෙයි, මුහමලෙයි, අයියනාන්කායි, විසුවලිංගම් සහ කාසිපල්ලයිකානි යන වතු කල්බදු පදනම යටතේ වසර 30 ක කාලයක් සඳහා හලාවත වැවිලි සමාගම වෙත පැවරී ඇත.

### ප්‍රධාන ක්‍රියාකාරකම්

හලාවත වැවිලි සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පොල්, කජු සහ වෙනත් කෘෂි භෝග වගා කිරීම, අනෙකුත් කෘෂි නිෂ්පාදනය, පශු සම්පත් හා ඒවා අලෙවි කිරීම දැක්විය හැක.

### මූල්‍ය වාර්තා

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/LKASs) අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද සමාගමෙහි මූල්‍ය වාර්තා වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 40 සිට 78 දක්වා ඇතුලත් කර ඇත.

### විගණන වාර්තා

සමාගමේ මූල්‍ය වාර්තා මත විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව පිටු අංක 36 සිට 39 දක්වා පිටු තුල අන්තර්ගතව ඇත.

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 44 සිට 55 දක්වා සඳහන්ව ඇති අතර, පසුගිය වසර හා සංසන්දනය කිරිමේදි ගිණුම් කරන ප්‍රතිපත්ති වල වෙනසක් සිදු කර නොමැත.

### අඛණ්ඩ පැවැත්ම

සමාගමේ කටයුතු පුරෝකථනය කල හැකි අනාගතයක් දක්වා ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහිමකට පත්ව ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන "අඛණ්ඩ බව" යන සංකල්පය මත සකසා ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

2023 වර්ෂයේ සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සංක්ෂිප්තව පහත පරිදි වේ.

### පෙර අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| **ආර්.ඩබ්.එම්.ජේ.එස්.ආර්. පෙරේරා මහතා** (2019/12/31 සිට) | සභාපති/ ප්‍රධාන විධායක නිළධාරී |
| **එච්.ජී. සුමනසිංහ මහතා** (2022/07/26 සිට 2023/12/28) | අධ්‍යක්ෂ/ මහා භාණ්ඩාගාර නියෝජිත |
| **අරුණි ශානිකා රණසිංහ මහත්මිය** (2022/10/26 සිට 2024/04/09) | අධ්‍යක්ෂ |
| **එන්.කේ.කේ. රාජසිංහ මහතා** (2020/02/05 සිට 2024/03/01) | අධ්‍යක්ෂ |
| **අජන්ත මූණමලේ මහතා** (2020/02/05 සිට 2024/03/01) | අධ්‍යක්ෂ |
| **අයි.එස්.ජේ.පී. ගුණවර්ධන මහතා** (2020/02/05 සිට 2024/03/01) | අධ්‍යක්ෂ |
| **ඩබ්.ඩබ්.ඒ.එන්.ටී.ඒ. ප්‍රනාන්දු මහතා** (2020/02/05 සිට 2024/03/01) | අධ්‍යක්ෂ |
| **කේ.පී.ජී.එස්. කුමාරරත්න මහතා** (2022/11/16 සිට 2024/03/01) | අධ්‍යක්ෂ |

### වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| **ආර්.ඩබ්.එම්.ජේ.එස්.ආර්. පෙරේරා මහතා** (2019/12/31 සිට) | සභාපති/ ප්‍රධාන විධායක නිළධාරී |
| **පී.එච්.ඒ.එස්. විජේරත්න මහතා** (2023/12/28 සිට) | අධ්‍යක්ෂ / මහා භාණ්ඩාගාර නියෝජිත |
| **එල්. වික්‍රමාරච්චි මහතා** (2024/04/09 සිට) | අධ්‍යක්ෂ |
| **කේ.එල්. විජයසිරි මහතා** (2024/03/01 සිට) | අධ්‍යක්ෂ |
| **එච්.වී.ඩබ්. රත්නපාල මහතා** (2024/03/01 සිට) | අධ්‍යක්ෂ |
| **ඩබ්.ආර්.පී. ජයරත්න මහතා** (2024/03/01 සිට) | අධ්‍යක්ෂ |
| **කේ.ජී.එස්.ඩබ්. බණ්ඩාර මහතා** (2024/03/01 සිට) | අධ්‍යක්ෂ |
| **එස්. අබේකෝන් මහතා** (2024/03/01 සිට) | අධ්‍යක්ෂ |

### විගණන කමිටුව

පහත සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන කමිටුව නියෝජනය කළ අතර වසර තුළ ඇගයීම් 3 ක් සිදු කර ඇත.

### විගණන කමිටුව - 2023

| | |
|---|---|
| **එච්.ජී. සුමනසිංහ මහතා** | සභාපති |
| **අරුණි ශානිකා රණසිංහ මහත්මිය** | සාමාජික |
| **එන්.කේ.කේ. රාජසිංහ මහතා** | සාමාජික |
| **සුසිලා විජේරත්න මහත්මිය** ජාතික විගණන කාර්යාලය) | නිරීක්ෂක |

### කාර්යය සාධනය

වර්ෂය තුල සමාගමේ කාර්ය සාධනය පිළිබඳව සහ වැදගත් කළමනාකරණ සහ සංවර්ධන වැඩසටහන් පිළිබඳව විශ්ලේෂණයක් සභාපතිතුමාගේ සමාලෝචනය තුල පිටු අංක 04 සිට 05 දක්වාත්, කළමනාකරණ හා මූල්‍ය සමාලෝචනය යටතේ පිටු අංක 10 සිට .25 දක්වාත් අන්තර්ගත වේ.

### අයභාරය

2023 වර්ෂයේ සමාගමේ මුළු අයභාරය රුපියල් මිලි. 899.7 කි. (2022 - රුපියල් මිලි. 975.1). එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 7% ක අඩුවීමකි. සමාලෝචිත වර්ෂයේ පොල් අස්වැන්න අඩුවීම මත පොල් වලින් ලද අයභාරයේ අඩුවීම මෙම අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත.

පසුගිය වර්ෂයේ වාර්තා වූ පොල් ගෙඩි 15,172,334 ක අස්වැන්නට සාපේක්ෂව 2023 වර්ෂයේ අස්වැන්න පොල් ගෙඩි 11,728,576 කි. එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 23% ක අඩුවීමකි. පොල් පර්යේෂණ ආයතනය විසින් ප්‍රකාශයට පත්කරන ලද වාර්තාවට අනුව 2023 වර්ෂයේ ජාතික පොල් නිෂ්පාදනයේ අඩුවීම 12% කි.

පසුගිය කාලයේ පැවති වියළි හා අසාමාන්‍ය කාලගුණික තත්ත්වය මෙම අස්වැන්නේ අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇති අතර හලාවත වැවිලි සමාගමේ බොහෝ වතු වියළි කෘෂි දේශගුණික කළාප තුළ පිහිටා ඇත.

පවතින දත්ත වලට අනුව සෑම වසර 05 කට වරක් පොල් අස්වැන්න අඩුවීමක් වාර්තා වන අතර 2023 වර්ෂයේ දී ද මෙම උච්චාවචනයට අනුව අස්වැන්නෙහි අඩුවීමක් සිදු වී ඇත. (සාමාන්‍යයෙන් පොල් අස්වැන්න අඩුවන අවස්ථා වලදී පොල් මිල වැඩි වේ. එහෙත් රටෙහි පැවති ආර්ථික තත්ත්වය හේතුවෙන් මෙම වර්ෂයේ දී මෙම තත්ත්වය නිරීක්ෂණය නොවීය).

අයභාරයෙහි සංයුතිය ගිණුම් වාර්තා සටහන් අංක 19 තුල ඉදිරිපත් කර ඇත.

### අනෙකුත් මෙහෙයුම් ආදායම්

වර්ෂය තුල අනෙකුත් මෙහෙයුම් ආදායම් තුලින් උපයන ලද ආදායම රුපියල් මිලි. 94 කි. (2022 - රුපියල් මිලි. 181.5). වැව් පතස් පුළුල් කිරීම තුලින් උපයන ලද ආදායම රුපියල් මිලි. 64.2 කින් පහත වැටීම, පොල් ගස් අලෙවි ආදායම රුපියල් මිලි. 10.2 කින් පහත වැටීම හා දැවගස් වලින් උපයන ලද ආදායම රුපියල් මිලි. 13 කින් අඩුවීම යන කරුණු අනෙකුත් ආදායම් වල අහිතකර විචලනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. රටෙහි පැවති අයහපත් ආර්ථික තත්ත්වය මෙම අඩුවීම් වලට බලපෑ ප්‍රධාන සාධකය විය.

අනෙකුත් මෙහෙයුම් ආදායම් වලට අදාල තොරතුරු ගිණුම් ප්‍රකාශන සටහන් අංක 21 යටතේ ඉදිරිපත් කර ඇත.

පසුගිය වර්ෂයේ ඉපැයූ රුපියල් මිලි. 135.9 ට සාපේක්ෂව 2023 වර්ෂයේ දී උපයන ලද පොලී ආදායම රුපියල් මිලි. 237.4 කි. ඉහළ මූල්‍ය කාර්ය සාධනය හේතුවෙන් කෙටිකාලීන තැන්පතු වර්ධනය වීම හා ස්ථාවර තැන්පතු මත වාර්ෂික පොලී අනුපාතය ඉහළ යාම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූල්‍ය ආදායමට අදාල තොරතුරු විගණනය කරන ලද ගිණුම් වාර්තා සටහන් අංක 23 යටතේ ඉදිරිපත් කර ඇත.

## මූල්‍ය ප්‍රතිඵල

පසුගිය වර්ෂයේ උපයන ලද රුපියල් මිලි. 513.9 ක බදු පෙර ලාභයට හා රුපියල් මිලි. 493.5 ක බදු පසු ලාභයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුල රුපියල් මිලි. 302.6 ක බදු පෙර ලාභයක් හා රුපියල් මිලි. 231.8 ක බදු පසු ලාභයක් වාර්තා කර ඇත. පොල් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම, පොල් වලින් උපයන ලද ලාභය පහත වැටීම සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් අඩුවීම බදුපෙර ලාභය අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත.

වර්ෂය තුල ආදායම් බදු වෙන් කිරීම් ඉහළ යාම බදු පසු ලාභය අඩුවීම කෙරෙහි බලපා ඇත.

2023 වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම (බදු පසු) රුපියල් මිලි. 209.5 ක් විය. (2022 - රුපියල් මිලි. 514).

ඊට අමතරව, අපගේ පාලනයෙන් පරිබාහිර සාධක හේතුවෙන් අපේක්ෂා කල පරිදි ඒකාබද්ධ පොල් සැකසුම් කර්මාන්ත ශාලාව ආරම්භ කිරීමට නොහැකි වූ අතර, ඒ තුලින් අපේක්ෂිත ලාභය ද ඉපයීමට නොහැකි විය.

විස්තරාත්මක මූල්‍ය ප්‍රතිඵල, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල ඉදිරිපත් කර ඇත.

## ස්ථාවර වත්කම්

2023 වර්ෂය තුල සමාගම රුපියල් මිලි. 69.3 (2022 වර්ෂයේ රුපියල් මිලි. 54.5) නව වගාවන්, යටි වගාවන් හා නොමේරූ වගාවන් නඩත්තුව වෙනුවෙන් ද, රුපියල් මිලි. 45.5 ක් දේපළ, පිරියත හා උපකරණ වෙනුවෙන් ද (2022 රුපියල් මිලි. 70.8) ආයෝජනය කර ඇත.

2023 වර්ෂයේ ශේෂ පත්‍ර දිනට ජංගම නොවන වත්කම් (දේපළ, පිරියත, උපකරණ, ජෛව වත්කම් හා කල්බදු වත්කම්) වල ශුද්ධ පොත් අගය රුපියල් මිලි. 1,591 කි. (2022 රුපියල් මිලි. 1,476.5 කි). ජංගම නොවන වත්කම් පිළිබඳව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 4 - 8 සහ 11.1 තුල ඉදිරිපත් කර ඇත.

## කෙටි කාලීන ආයෝජන

2022 වර්ෂයේ පැවති රුපියල් මිලි. 985.7 ට සාපේක්ෂව, 2023 වර්ෂය අවසනට සමාගමේ කෙටිකාලීන ආයෝජන රුපියල් මිලි. 1,090.2 කි. මූල්‍ය වාර්තා සටහන් අංක 12 තුල මීට අදාල තොරතුරු ඉදිරිපත් කර ඇත.

## සංචිත

2023 වර්ෂය අවසනට සමාගමේ සංචිත, නොබෙදූ ලාභ රුපියල් මිලි. 1,844.7 කින්, දැව සංචිත රුපියල් මිලි. 237.8 කින් සහ මෝටර් රථ ප්‍රත්‍යාගණන සංචිත 97.0 කින් සමන්විත වේ. සංචිත වල සංයුතිය හා වෙනස් වීම් විගණනය කරන ලද මූල්‍ය වාර්තාවන් හි ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය යටතේ අනාවරණය කර ඇත.

## බදුකරණය

සමාගමට අදාල වන බදු අනුපාතයන් හා ගිණුම්කරණ ලාභය බදු ගණනය කරනු ලබන ලාභය සමඟ සැසඳුම් ප්‍රකාශය ඇතුළු තොරතුරු මූල්‍ය වාර්තා සටහන් අංක 24 යටතේ පිටු අංක 72 තුල ඉදිරිපත් කර ඇත.

## කොටස් ප්‍රාග්ධනය

2023 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ සමස්ත කොටස් ප්‍රාග්ධනය රු. 200,000,010 ක් වන අතර එය ස්වර්ණමය කොටස ද ඇතුළුව සාමාන්‍ය කොටස් 20,000,001 කින් සමන්විත වේ. කිසිඳු ආකාරයක කොටස් නිකුත් කිරීමක් වර්ෂය තුල සිදු කර නොමැත.

## ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය වගකීම්

අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම් පිළිබඳ විගණනය කරන ලද මූල්‍ය වාර්තා සටහන් අංක 28 තුල අනාවරණය කර ඇත.

## මූල්‍ය වාර්තාව ඉදිරිපත් කරන දිනට පසු සිදුවීම්

මූල්‍ය වාර්තා සටහන් අංක 25.2 තුල හෙළිදරව් කර ඇති කරුණු හැර සමාගම කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් සිදු කල හැකි ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් හඳුනාගෙන නොමැත.

## අධ්‍යක්ෂකවරුන්ගේ බැඳීම්

සමාගමෙහි ගිණුම් වාර්තා සටහන් අංක 26 හි දක්වා ඇති කරුණු හැර අධ්‍යක්ෂවරුන්ගේ වෙනත් ඍජු හෝ වක්‍ර බැඳීම් සමාගම සමඟ නොමැත.

## අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම

සමාගමේ කිසිම අධ්‍යක්ෂවරයෙක් හෝ ඔහුගේ/ ඇයගේ කාලත්‍රයෙකු සමාගමේ කොටස් හිමිකමක් දරන්නේ නැත.

## සේවා නියුක්තිය

සමාගමේ තිරසාර උන්නතිය සදහා රජයේ නීති වලට අනුකූලව කටයුතු කරන අතර සේවකයින් සම්බන්ධයෙන් පුහුණුව, උසස්වීම්, විනයානුකූල තීරණ ආදි කරුණු සම්බන්ධව සියලුම සේවකයින්ට කුසලතාව පදනම්ව එක හා සමාන අවස්ථාවන් සලසනු ලබයි. එසේම සමාගම සේවකයන්ට සම තැන පදනම මූලික කර ගනිමින් සෑම සේවා නියුක්තිකයෙකු හටම ලිංග භේදය, ජාති භේදය, ආගම, විවාහක තත්වය, දේශපාලන පසු බිම හෝ කායික දුබලතාවයන් නොසලකා සම අවස්තාවන් ලබා දීමට කටයුතු කරනු ලබයි.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

සමාගම විසින් ශේෂ පත්‍ර දිනට ගෙවිය යුතු සියලුම බදු, ගාස්තු, සියලු දායක මුදල් සහ සමාගමේ සේවකයින්ට අදාලව සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු බදු, අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් හා සමාගම විසින් ගෙවිය යුතු ගෙවීම් ගෙවා ඇති බවට හෝ ගෙවීම් සිදුකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනීම අනුව තහවුරු කරනු ලබයි.

**විගණකවරු**

2023 වර්ෂයට අදාල ගිණුම් වාර්තා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරන ලදි. මූල්‍ය වාර්තා පිළිබඳව විගණන මතය පිටු අංක 36 සිට 39 දක්වා වූ පිටු තුල අන්තර්ගතව පවතී.

ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය ආරම්භ කිරීමෙන් පසු ප්‍රථමවරට 2023 වාර්ෂික ගිණුම් වාර්තා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා වෙතින් සත්‍ය හා සාධාරණ විගණන මතයක් ලබා ගැනීමට සමාගමට හැකි විය.

**වාර්ෂික මහා සභා රැස්වීම**

හලාවත වැවිලි සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම, 2024 අගෝස්තු මස 23 දින පෙ.ව. 11.00 ට නො. 55/78, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 හි පිහිටි ජනතා වතු සංවර්ධන මණ්ඩල ගොඩනැගිලි ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ.

මහා සභා රැස්වීමේ නිවේදනය සහ පෙරකලාසි පෝරමය පිටු අංක 80 සහ 81 යටතේ අමුණා ඇත.

මෙම වාර්තාව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදි.

**ආර්.ඩබ්.එම්.ජේ.එස්.ආර්. පෙරේරා**
සභාපති/ ප්‍රධාන විධායක නිළධාරී

CORPORATE ADVISORY SERVICES (PRIVATE) LIMITED
PV 3796
SEC/1017/93
Secretaries

කෝපරේට් ඇඩ්වයිසරි සර්විස් (පුද්) සමාගම
ලේකම්වරු, හලාවත වැවිලි සමාගම
කොළඹ

## අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් පිළිබඳ ප්‍රකාශය

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමේ මූල්‍ය වාර්තාකරනය පිළිබඳව වගකීම හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරයි. සමාගමේ විගණක වන විගණකාධිපතිතුමාගේ වගකීම පිළිබඳ සිය වාර්තාවෙන් සංක්ෂිප්තව දක්වා ඇත.

මෙම වාර්තාවේ ඇතුලත් කර ඇති 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර තොරතුරු එමගින් දක්වා ඇත.

සමාගම සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇති බවටත් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල සියළු ගිණුම්කරන ප්‍රමිතීන් භාවිත කල බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. මෙම ප්‍රමිතීන්ගෙන් ප්‍රමාණාත්මකව වෙනස් වන අවස්ථා ඇතොත්, ඒවා නිසි ආකාරයෙන් අනාවරණය කර ඇති අතර ඊට හේතු පැහැදිලි කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා භාවිත කරන ලද විනිශ්වයන් සහ ඇස්තමේන්තු සාධාරණ හා විචක්ෂණශීලි වෙයි. සමාගම තම මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් නිරවද්‍යතාවයන් හා සාධාරණ ලෙස නිර්වචනය කිරීම සඳහා නිසි ලෙස මූල්‍ය වාර්තා පවත්වාගෙන යාමේ වගකීම පිළිබඳ අධ්‍යක්ෂවරු සහතික වේ. වාර්ෂික වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන මගින් සමාගමේ කාර්යයන් පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් අන්තර්ගත වන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශ කර සිටී.

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති පිළබදව සමස්ථ වගකීම අධ්‍යක්ෂවරු වෙත පැවරේ. ප්‍රමාණාත්මක අවප්‍රකාශ හා වංචා වලක්වාලන අභ්‍යන්තර පාලන ක්‍රමවේද පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරමින් ඔවුන් විසින් ස්ථාපිත කරන ලද අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ගෙන් සමන්විත අභ්‍යන්තර පිරික්සුම්, අභ්‍යන්තර විගණන, මූල්‍ය හා වෙනත් පාලන ක්‍රමවේදයන් මගින් ගණුදෙනු නිසි අධිකාරියට අනුව සිදු වන බවට හා නිසි පරිදි වාර්තා වන බවටත් සියළු වත්කම් ආරක්ෂා විය හැකි ප්‍රමාණාත්මක අවප්‍රකාශ හා වංචා වලක්වා හෝ සධාරණ කාලයක් තුල දැන ගැනිමට හැකි වන පරිදි සකසා ඇති බව සනාථ කරයි.

ඉදිරි වසර ගණනාවක් පුරා අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණාත්මකව ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර මූල්‍ය ප්‍රකාශන සැකසීමේදි අඛණ්ඩ පැවැත්ම නොවෙනස්ව අනුගමනය කරනු ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරීක්ෂණයන් හා සමාලෝචනයන් කිරීමට සියළුම තොරතුරු සහ සහය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සියළුම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තා, අදාල දත්ත සමග පරීක්ෂා කර ඔවුන් ගේ නිදහස් අදහස් පළ කර ඇති අතර, එම වාර්තාද වාර්ෂික වාර්තාව තුල ඇතුලත් කර ඇත.

සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියළුම බදු හා සමාගමේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

CORPORATE ADVISORY SERVICES (PRIVATE) LIMITED
PV 3796
SEC/1017/93

Secretaries

සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්) සමාගම ලේකම්වරු, හලාවත වැවිලි සමාගම

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

**පීඒඑල්/සී/සීපීඑල්/01/2023/02** 2024 ජූලි 24 දින.

**සභාපති**
**විලව් ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ්**

**විලව් ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

විලව් ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් ("සමාගම") හි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුමට අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතු වේ. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, ප්‍රකාශයක් කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම හා සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

**(මෙය ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන ලද වාර්තාවේ සිංහල පරිවර්තනයකි.)**

හලාවත වැවිලි සමාගම

# විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා | සටහන | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| අයභාරය | **19** | 899,693,759 | 975,106,419 |
| විකුණුම් පිරිවැය | **20** | (671,910,856) | (520,940,365) |
| **දළ ලාභය** | | **227,782,903** | **454,166,053** |
| ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ වටිනාකම මත ලාභ/අලාභ | **7.3** | 10,145,544 | 15,025,382 |
| වෙනත් මෙහෙයුම් ආදායම් සහ ප්‍රතිලාභ | **21** | 94,014,156 | 181,535,982 |
| පරිපාලන සහ අනිකුත් වියදම් | **22** | (205,069,246) | (229,027,818) |
| මෙහෙයුම් තුලින් ජනනය වූ ලාභය | | 126,873,356 | 421,699,599 |
| මූල්‍ය ආදායම | **23** | 237,386,004 | 135,874,424 |
| මූල්‍ය වියදම | **23.1** | (61,652,953) | (43,693,022) |
| **බදු පෙර ලාභය** | | **302,606,407** | **513,881,001** |
| බදු වියදම් (වෙන්කිරීම්) /නැවත මාරු කිරීම් | | (70,868,847) | (20,411,125) |
| **වර්ෂය සඳහා ලාභය** | **24** | **231,737,560** | **493,469,876** |
| වෙනත් විස්තිර්ණ ආදායම් | | | |
| නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ආයුගණක ලාභය/(අලාභය) | **16** | (21,265,292) | 21,063,086 |
| වත්කම් නැවත තක්සේරු කිරීම මත කල් දැමූ බදු ගැලපීම | | (923,148) | (562,333) |
| **වර්ෂයට මුළු විස්තිර්ණ ආදායම බදු පසු** | | **209,549,120** | **513,970,629** |
| **කොටසක ඉපැයුම** | **25.1.2** | **11.59** | **24.67** |

වරහන් තුල ඇත්තේ අඩුකිරීම්ය

පිටු අංක 44 සිට 78 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

**හලාවත**
**2024, මාර්තු මස 21 වන දින**

**(මෙය ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන ලද වාර්තාවේ සිංහල පරිවර්ථනයකි.)**

හලාවත වැවිලි සමාගම

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා | සටහන | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ජනවසම වතුවල හිස් භූමි වල කල්බදු හිමිකම | 04 | 105,374,496 | 60,356,373 |
| ජනවසම කල්බදු දේපල පිරියත හා උපකරණ හිමිකම (භාවිතයට ගැනිමට අයිතියක් ඇති ඉඩම් කල්බදු ජෛව හිමිකම් හැර) | 05 | 769,468 | 769,468 |
| ජනවසම වතු යායන් වල ජෛව වත්කම් වල කල්බදු හිමිකම | 05.1 | 27,162,119 | 10,939,028 |
| කල්බදු දේපල සංවර්ධනය | 6 | 1,073,815,205 | 1,028,825,198 |
| ජෛව වත්කම් පශු සම්පත් | 7.1 | 25,544,815 | 25,779,100 |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම් | 7.2 | 139,297,920 | 138,313,825 |
| සින්නක්කර දේපල, පිරියත හා උපකරන හිමිකම | 08 | 201,427,046.0 | 193,729,753 |
| වෙනත් මූල්‍ය වත්කම් | 11.1 | 17,550,384 | 17,810,643 |
| විලම්භිත බඳු වත්කම් | 14 | | |
| | | 1,590,941,452 | 1,476,523,388 |
| **ජංගම වත්කම්** | | | |
| ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වල ඇති ඵලදාව | 9.1 | 25,993,440 | 30,194,568 |
| තොග | 9.2 | 148,934,886 | 195,288,282 |
| විකිණීම සදහා තබා ඇති වත්කම් | 9.3 | 16,004 | 4 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 10 | 139,052,094 | 127,630,321 |
| රාජ්‍ය ව්‍යවසායන් වලට සපයන ලද මූල්‍ය පහසුකම් | 11 | | |
| වෙනත් මූල්‍ය වත්කම් | 11.1 | 7,300,268 | 6,159,131 |
| වෙනත් ජංගම වත්කම් | | 1,316,343 | 1,226,458 |
| කෙටිකාලීන ආයෝජන | 12 | 1,090,243,489 | 985,660,947 |
| මුදල් හා බැංකු ශේෂයන් | | 43,794,899 | 67,349,035 |
| | | 1,456,651,425 | 1,413,508,745 |
| **මුළු වත්කම්** | | **3,047,592,877** | **2,890,032,133** |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| කොටස් ප්‍රාග්ධනය | 13 | 200,000,010 | 200,000,010 |
| රඳවා ගත් ඉපැයීම | | 1,844,717,949 | 1,833,592,353 |
| ප්‍රත්‍යාගණන සංචිත (දැව ප්‍රත්‍යාගණනය සහ මොටර් රථ ප්‍රත්‍යාගණනය) | | 334,884,314 | 321,460,790 |
| **මුළු ස්කන්ධය** | | **2,379,602,273** | **2,355,053,153** |
| **ජංගම නොවන වගකීම් සහ විලම්භිත ආදායම්** | | | |
| විලම්භිත බදු බැරකම | 14 | 93,175 | 314,474 |
| විලම්භිත ආදායම් - ප්‍රදාන හා අධාර | 15 | 10,088,526 | 9,775,811 |
| විශ්‍රාමික ප්‍රතිලාභ පාරිතෝෂිත බැදීම් | 16 | 92,025,543 | 69,807,963 |
| කල්බදු ගිවිසුම් යටතේ ඇති බැඳියාවන් - ජනවසම | 17 | 157,243,235 | 92,505,957 |
| | | 259,450,479 | 172,404,205 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිමට ඇති දෑ | 18 | 360,835,121 | 344,602,287 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 44,768,673 | 15,272,989 |
| පොලී සහිත ණය සහ ණය ගැනිම් | 18.1 | - | - |
| කල්බදු ගිවිසුම යටතේ ඇති බැඳියාවන් - ජනවසම | 17 | 2,936,331 | 2,699,498 |
| | | 408,540,125 | 362,574,774 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **3,047,592,877** | **2,890,032,133** |

**(වරහන් තුල ඇත්තේ අඩුකිරීම්ය)**

පිටු අංක. 44 සිට 78 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මුල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

**සනාථ කිරිම**

2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශය පිලියෙල කර ඇති බව සහතික කරමි.

.......................................................

**ආර්.එම්.ආර්.බී. රත්නායක මහතා**

සහකාර සාමාන්‍යාධිකාරී මූල්‍ය

මූල්‍ය වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබනු ලැබේ.

.......................................................

**ආර්.ඩබ්.එම්.ජේ.එස්.ආර්. පෙරේරා මහතා**

සභාපති/ප්‍රධාන විධායක නිලධාරි

.......................................................

**අරුණි එස්. රණසිංහ මහත්මිය**

අධ්‍යක්ෂ

**හලාවත - 2024, මාර්තු මස 21 වන දින**

**(මෙය ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන ලද වාර්තාවේ සිංහල පරිවර්ථනයකි.)**

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

| සටහන් | කොටස් ප්‍රාග්ධනය රු. | දැව සංචිත රු. | නැවත තක්සේරු කල සංචිත රු. | සමුච්චිත ලාභය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| 2022 ජනවාරි 01 වන දිනට ශේෂය | **200,000,010** | 204,901,015 | 98,523,971 | 1,417,657,528 | 1,921,082,524 |
| 2021 සඳහා ලාභාංශ | | | | (80,000,000) | (80,000,000) |
| වර්ෂයේ ලාභය | | | | 493,469,876 | 493,469,876 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | | - | 20,500,753 | 20,500,753 |
| දැව සංචිතයට මාරු කිරීම් (7.2) | - | 18,598,138 | | (18,598,138) | - |
| විලම්භිත බදු ගැලපුම මොටර් රථ නැවත තක්සේරු කිරීමේ සංචිතයට මාරු කිරීම | | | (562,333) | 562,333 | |
| **2022 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **200,000,010** | **223,499,152** | **97,961,638** | **1,833,592,353** | **2,355,053,153** |
| 2022 සඳහා ලාභාංශ | | | | (125,000,000) | (125,000,000) |
| 2023 වසර සඳහා අතුරු ලාභාංශ | - | | | (60,000,000) | (60,000,000) |
| වර්ෂයේ ලාභය | | | | 231,737,560 | 231,737,560 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | 14,346,672 | - | (22,188,440) | (22,188,440) |
| දැව සංචිතයට මාරු කිරීම | | | | (14,346,672) | - |
| විලම්භිත බදු ගැලපුම මොටර් රථ නැවත තක්සේරු කිරීමේ සංචිතයට මාරු කිරීම | | | (923,148) | 923,148 | - |
| මුළු විස්තීර්ණ ආදායම් | 200,000,010 | **237,845,824** | **97,038,490** | **1,844,717,949** | **2,379,602,273** |
| **2023 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **200,000,010** | **237,845,824** | **97,038,490** | **1,844,717,949** | **2,379,602,273** |

වරහන් තුල ඇත්තේ අඩුකිරීම්ය.

පිටු අංක 44 සිට 78 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

**හලාවත**
**2024, මාර්තු මස 21 වන දින**

හලාවත වැවිලි සමාගම

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා | සටහන | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වු / (යෙදවු) මුදල් ප්‍රවාහය** | | | |
| බදු පෙර ලාභය | | 302,606,407 | 513,881,001 |
| **ගැලපීම්:** | | | |
| - ක්ෂයවීම්/ක්‍රමක්ෂයවීම් | | 64,398,037 | 55,403,094 |
| - ප්‍රදාන සඳහා වු ක්‍රමක්ෂයවීම් | | (554,766) | (260,774) |
| - මූල්‍ය වියදම් | | 61,652,953 | 43,693,022 |
| - මූල්‍ය ආදායම් | | (237,386,004) | (135,874,424) |
| - නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය හා වෙන්කිරීම් | | 17,718,645 | 16,194,064 |
| - දේපල පිරියත හා උපකරණ අපහරණය කිරීමෙන් ලත් ලාභය | | (18,280) | |
| - ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගය මත ලාභ/(අලාභ) | | (10,145,544) | (15,025,382) |
| - දැව ගස් විකිණීමෙන් ලද ලාභය | | (13,120,109) | (26,136,409) |
| - පොල් ගස් විකිණීමෙන් ලද ලාභය | | (23,143,644) | (33,353,764) |
| - සේවක දිරි දීමනා සඳහා වෙන් කිරීම් | | 42,495,327 | 93,000,000 |
| - ප්‍රාග්ධන වත්කම් සඳහා හානි දීමනාව | | 3,657,715 | - |
| - නොනිමි වැඩ පිටතට ගලා යාම සහ වෙනත් ගැලපීම් | | 298,023 | 1,092,564 |
| | | 208,458,759 | 512,612,991 |
| **වෙනස්වීම්** | | | |
| - තොගවල වැඩිවීම්/(අඩුවීම්) | | 46,353,395 | (36,112,540) |
| - කිරි පශු සම්පත් | | 234,285 | (10,877,300) |
| - වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | | (1,711,944) | (114,360) |
| - වෙනත් ජංගම වත්කම් | | (89,885) | (444,690) |
| - වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | | 7,751,553 | (12,212,675) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වු මුදල් ප්‍රවාහය** | | 260,996,163 | 452,851,425 |
| - රාජ්‍ය කල්බදු මත ගෙවූ පොලිය | | (48,773,567) | (41,830,254) |
| - නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ගෙවීම | | (16,766,357) | (6,551,448) |
| - මූල්‍ය වියදම් ගෙවීම් | | (50,728) | (106,118) |
| - මූල්‍ය ආදායම් ලැබීම් | | 216,189,231 | 96,309,432 |
| - අදායම් බදු ගෙවීම් | | (34,602,322) | (5,123,325) |
| - කාර්ය මණ්ඩලයට සහ සේවකයින්ට දිරි දීමනා | | (93,000,000) | (92,985,110) |
| - දැවමය ගස් විකිණීමෙන් ලද මුදල් | | 27,837,885 | 29,086,906 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වු ශුද්ධ මුදල් ප්‍රවාහය** | | 311,830,306 | 431,651,508 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වු මුදල් ප්‍රවාහය** | | | |
| - දේපල පිරියත හා උපකරණ එකතු කිරීමෙන් | | (45,509,472) | (70,827,576) |
| - ක්ෂේත්‍ර සංවර්ධන වියදම් | | (69,376,432) | (54,549,180) |
| - පොල් ගස් විකිණීමෙන් ලද මුදල් | | 23,143,644 | 33,353,764 |
| - සේවක ණය ප්‍රදානයන් | | (9,381,800) | (14,619,000) |
| - සේවක ණය අය කර ගැනීම් | | 8,500,922 | 6,139,543 |
| - කෙටි කාලීන ආයෝජන | | (15,144,708) | (101,245,101) |
| - දේපල පිරියත හා උපකරණ අලෙවියෙන් ලද මුදල් | | 53,291 | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවු ශුද්ධ මුදල් ප්‍රවාහය** | | (107,714,556) | (201,747,549) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වු මූල්‍ය ප්‍රවාහය** | | | |
| - ලාභාංශ ගෙවීම් | | (130,000,000) | |
| - රජයේ හිඟ කල්බදු වාරික ගෙවීම | | (9,099,533) | (13,874,818) |
| -ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රදාන ලැබීම් | | 867,481 | 2,807,530 |
| - වර්ෂය තුල ණය ආපසු ගෙවීම් | | - | (5,794,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවු ශුද්ධ මුදල් ප්‍රවාහය** | | (138,232,052) | (16,861,288) |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්)** | | 65,883,699 | 213,042,671 |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම (සටහන අ) | | 536,595,722 | 323,553,051 |
| **වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම (සටහන ආ)** | | **602,479,421** | **536,595,722** |
| **සටහන අ** | | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වසර ආරම්භයේ | | | |
| - කෙටි කාලීන ආයෝජන | | 469,246,687 | 306,310,537 |
| - මුදල් හා බැංකු ශේෂය | | 67,349,035 | 17,242,514 |
| | | **536,595,722** | **323,553,051** |
| **සටහන ආ** | | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වසර අවසානයේ | | | |
| - කෙටි කාලීන ආයෝජන | | 558,684,521 | 469,246,687 |
| - මුදල් හා බැංකු ශේෂය | | 43,794,899 | 67,349,035 |
| | | **602,479,421** | **536,595,722** |

වරහන් තුල ඇත්තේ අඩුකිරීමය.

පිටු අංක 44 සිට 78 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

හලාවත - 2024, මාර්තු මස 21 වන දින

# මූල්‍ය ප්‍රකාශනවල සටහන්

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

## 1 සංස්ථාපිත තොරතුරු

### 1.1 වාර්ථාකරන ස්ථිතිය

#### 1.1.1 පිහිටුවීම සහ නෛතික ආකෘතිය

සීමාසහිත හලාවත වැවිලි සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ (සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කරන ලදි.) සහ 1987 අංක 23 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධි විධානයන්ට අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ වගකීමක් සහිත සීමාසහිත සමාගමක් වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම් පාර, අංක 165 යන ලිපිනයේ පිහිටා ඇති අතර වතුයායවල් පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්ක වල පිහිටා ඇත.

#### 1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

පොල් වගා කිරීම, කොප්පරා නිෂ්පාදනය හා අමු පොල් හා කොප්පරා අලෙවිය මගින් ආදායම් ඉපයීම වසර තුල සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

#### 1.1.3 පරිපාලකය සහ අවසන් පරිපාලකය

සමාගමේ පරිපාලකය වනුයේ ශ්‍රී ලංකා රජයයි.

### 1.2 නිකුත් කිරීම සඳහා බලය දීමේ දිනය

2024 මාර්තු මස 21 වන දින දරන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව අනුව 2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන ලදී.

## 2 සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරන හා විගණන ප්‍රමිතින් පිළිබඳ 1995 අංක 15 දරණ පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (CASL) විසින් නිකුත් කරන ලද ගිණුම්කරන ප්‍රමිත (SLFRS$LKAS) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව සකසා ඇත.

### 2.2 ඇගයීම් පදනම

මූල්‍ය ප්‍රකාශනවල අංක 04, 05 සහ 06 දරන සටහන්වල විස්තර කර ඇති පරිදි ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් එනම්, ජනවසම කල්බදු ගිවිසුම් යටතේ ඇති කල්බදු වත්කම් හැරුණු කොට ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. සුදුසු පරිදි විශේෂ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල විස්තර කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශන තුල උද්ධමනීය සාධක සඳහා ගැලපීමක් සිදු කර නැත.

### 2.3 භාවිත කරන සහ ඉදිරිපත් කරන මුදල් ඒකකය

සමාගමේ භාවිත කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් මගින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියළු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට දක්වා ඇත.

### 2.4 ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන් වලට අනුකූලවන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අදාල කර ගනු ලබන ගිණුම්කරන ප්‍රතිපත්ති සහ වාර්තා කර ඇති වත්කම්, බැරකම්, ආදයම් සහ වියදම් යනාදියට බලපාන ඇස්තමේන්තු විනිශ්චය සහ උපකල්පිතයන් තීරණය කිරීමට කළමනාකරණයට සිදු වේ. විනිශ්චයන් හා ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ වාතාවරණ යටතේ සාධාරණ වන බවට විශ්වාස කරන අපේක්ෂාවන් ඇතුළු ඓතිහාසික අත්දැකීම් හා අනෙක් සාධක මත පදනම්වය. එබැවින් සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන පවත්නා පදනම මත සමාලෝචනය කර ඇත. ඇස්තමේන්තු සංශෝධනය එම කාලපරිච්ඡේදයට හා අනාගත කාල වකවානුවට බලපාන්නේ නම් එම කාලපරිච්ඡේදය තුල ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනය ද සිදු කරනු ලැබේ.

### 2.5 අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමාගමේ හැකියාව සමාගමේ කළමනාකාරීත්වය විසින් ඇගයීමට ලක් කර ඇති අතර නුදුරු අනාගත කාලයක් දක්වා ව්‍යාපාර කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගමට තිබෙන බවට සෑහීමකට පත්විය. තව ද ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව කර ගෙන යාමේ සමාගමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු තරමේ සැකයක් ඇති කළ හැකි කිසියම් වැදගත් අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරීත්වයට වාර්තා

වී නොමැත. අඛණ්ඩ බව පිළිබඳ සංකල්පය පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිලියල කරනු ලැබේ.

## 2.6 සංසන්දනාත්මක තොරතුරු

ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වා ගෙන යන අතර ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට ගැලපෙන පරිදි අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂයේ සංඛ්‍යා නැවත පිළියෙල කර ඇත.

## 2.7 වාර්තාකරන දිනයෙන් පසු හටගත් සිද්ධින්

වාර්තාකරන දිනයෙන් පසු හටගත් සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම හෝ අනාවරණය කිරීම සිදු කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

## 3.1 වත්කම් හා ඒවායේ අගය කිරීම් සඳහා පදනම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ වත්කම් යනු මුදල් හා සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී හෝ වාර්තා කරන දිනයේ සිට වසරක කාල පරිච්ඡේදයක් ඇතුලත යන දෙකෙන් අඩු කාලය තුළ මුදල් බවට පත් කරනු ලබන වත්කම් වේ. වාර්තා කරන දිනයේ සිට වසරක කාලයකට වඩා වැඩි කාල පරිච්ඡේදයක් සඳහා සමාගමට රඳවා ගැනීමට සිදුවන වත්කම් ජංගම නොවන වත්කම් වේ.

### 3.1.1 දේපළ, පිරියත හා උපකරණ

### 3.1.1.1 හඳුනා ගැනීම සහ ඇගයීම

යම් වත්කමක පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි වන්නේ නම් හා වත්කම සම්බන්ධයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ හව්‍යතාවයක් පවතී නම් එම වත්කම් දේපළ පිරියත උපකරණ ලෙස හඳුනාගනී.

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැය මත (හෝ කල්බදු හිස් ඉඩම් නම් ඒවායේ තක්සේරු වටිනාකමට) සමුච්චිත ක්‍ෂය වෙන් කිරීම් හා අපහරණයන් සිදුවී ඇත්නම් එහි අලාභය අඩු කිරීමෙන් පසු දක්වයි.

**(අ) සන්තක දේපළ**

දේපළ, පිරියත හා උපකරණ ඒවා අත්පත් කර ගැනීමේ දී දැරූ සෘජු පිරිවැයයි. සමාගම විසින් ඉදිකරන ලද වත්කමක් නම් එම වත්කම අදාළ කාර්යයට සුදුසු තත්ත්වයට ගෙන ඒම දක්වා දැරූ සියළු පිරිවැය, එනම් ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය හා ඒ සදහා සෘජුව දායක විය හැකි වෙනත් වියදම් ඇතුලත් වේ. උපකරණ ක්‍රියාකාරීත්වයට අදාලව මිලදී ගත් මෘදුකාංග අදාල උපකරණයේ අඛණ්ඩ ක්‍රියාවලියේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

දේපළ, පිරියත හා උපකරණවල යම් කිසි සුවිශේෂ කොටස් යම් කාල සීමාවලදී මාරු කිරීම් සිදුකරන අවස්ථාවලදී පිළිවෙලින් එම කොටස් ඵලදායී ආයු කාලයක් හා ක්ෂය කල හැකි තනි ඒකක වශයෙන් සලකා කටයුතු කරයි. එසේම සැලකිය යුතු අන්දමින් පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවලදී හඳුනා ගැනීමේ නිර්ණායකයන් සපුරා ඇත්නම් එහි පිරිවැය දේපල පිරියත හා උපකරණ වල ප්‍රතිෂ්ඨාවක් ලෙස ධාරණ අගයට එකතු කිරිමක් ලෙස හඳුනා ගනු ලැබේ. අනිකුත් සියළුම අළුත්වැඩියා හා නඩත්තු විස්තීරණ ප්‍රකාශනයේ වියදම් ලෙස දැක්වේ. නොනිමි ප්‍රාග්ධනය, ඊට අදාල වත්කම් වලට මාරු කරනු ලබන්නේ එහි ප්‍රථම භාවිතයේදී හෝ වත්කම් ක්‍රියාත්මක කරන අවස්ථාවේදීමය. ප්‍රාග්ධන නොනිමි වැඩ පළමු උපයෝජනයේ දී හෝ වත්කම ආරම්භ කරන වේලාවේ දී එක් එක් වත්කම් ගිණුම්වලට මාරු කරනු ලැබේ.

යම් සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් වත්කමේ ධාරණ අගය අයකර ගැනීමේ හැකියාවක් නොමති බව හැගෙන අවස්ථා වලදී, හානිකරණය හේතුවෙන් එම දේපල පිරියත උපකරණය ධාරණ අගය යළි සමාලෝචනය කරනු ලබයි.

සියළු මෝටර් රථ පසුකාලීනව එනම් 2020 දෙසැම්බර් 31 ප්‍රත්‍යාගණිත, දිනට සාධාරණ අගයට ප්‍රත්‍යාගණනය කර ඇත.

ප්‍රත්‍යගණනය අගය වැඩි වීම් වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගෙන වත්කම් ප්‍රත්‍යාගණන සංචිත ශීර්ෂය යටතේ ස්කන්ධයෙහි සමූචය කර ඇත. කෙසේ වෙතත් ඊට පෙර එම වත්කමහි වියදමක් ලෙස හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්ත්‍ය කරනු ලබන අවස්තාවලදී එම ප්‍රමාණයට ප්‍රත්‍යාගණනය වැඩිවීම ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී. ප්‍රත්‍යාගණනය අඩුවීමක් වියදමක් ලෙස හඳුනාගනු ලබයි. කෙසේ වෙතත් ප්‍රත්‍යාගණනය අඩු විමක් එම වත්කම සම්බන්ධයෙන්ම පෙර පැවති ප්‍රත්‍යාගණන අතිරික්තයක අගය නොඉක්මවන ප්‍රමාණයම වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනාගනු ලබයි.

වත්කමක ධාරණ අගයෙන් සමුච්ත ක්ෂය අඩු කල ශුද්ධ අගය වත්කමෙහි ප්‍රත්‍යාගණිත දිනට ප්‍රත්‍යාගණිත වටිනාකමින් ප්‍රතිස්ථාපනය කරනු ලබයි. වත්කම් උපලබ්ධි කරන විට එම වත්කමට අදාල ප්‍රත්‍යාගණන සංචිත රඳවාගත් ඉපැයීම් වලට මාරු කල යුතුය.

තක්සේරු දෙපාර්තුමේන්තුව විසින් ඉදිරිපත් කරනලද තක්සේරු වාර්තාවට අනුව 2020 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රත්‍යාගණනය පහත පරිදි වේ.

| විස්තරය | 2020.12.31 දිනට ශුද්ධ ධාරණ අගය (රු.) | 2020.12.31 දිනට ප්‍රත්‍යාගණිත වටිනාකම (රු.) | ප්‍රත්‍යාගණිත ලාභ (රු.) |
|---|---|---|---|
| මෝටර් රථ (ප්‍රත්‍යාගණිත) | 4,987,021.00 | 103,875,000.00 | 98,887,979.00 |

ප්‍රත්‍යාගණනය කර ඇති ඉහත වත්කම් වල 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 8 තුල ඉදිරිපත් කර ඇත.

කෙසේ වෙතත් තක්සේරු කරනු ලැබූ දිනය වන විට පහතින් සඳහන් මෝටර් රථ අළුත්වැඩියා කරමින් පැවති බැවින් තක්සේරු දෙපාර්තුමේන්තුව විසින් එම මෝටර් රථ තක්සේරු කර නොමැත. එම නිසා එම මෝටර් රථ 2020.12.31 දිනට පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකල වටිනාකමට ගෙන ඇත.

| මෝටර් රථ අංකය | කාණ්ඩය | පිරිවැය (රු.) | සමුචිත ක්ෂය (රු.) | 2020.12.31 දිනට ශුද්ධ වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| ශ්‍රී 6018 | අත් ට්‍රැක්ටර් | 41,500.00 | 41,499.00 | 1/= |
| NW SC 1607 | අත් ට්‍රැක්ටර් | 104,000.00 | 103,999.00 | 1/= |
| 36 ශ්‍රී 5418 | ට්‍රැක්ටර් | 1,661,995.70 | 1,304,777.00 | 357,218.70 |
| 36 ශ්‍රී 3033 | ට්‍රැක්ටර් | 467,739.46 | 467,737.46 | 2/= |
| NWRV 0245 | ට්‍රැක්ටර් ට්‍රේලර් | 152,375.00 | 152,374.00 | 1/= |
| NW UZ 3922 | මෝටර් සයිකල් | 148,925.00 | 148,924.00 | 1/= |
| NW UZ 3655 | මෝටර් සයිකල් | 148,925.00 | 148,924.00 | 1/= |

**(ආ) කල්බදු වත්කම්**

මූල්‍ය කල්බදු යටතේ ලබාගත් දේපළ, පිරියත හා උපකරණ (බදු ගත් භාණ්ඩය හිමිකර ගැනීමෙන් සමාගමට අවධානමක් හෝ වාසියක් සෘජුවම ලැබෙන්නේ නම්) ඒවායේ සාධාරණ වටිනාකම හා අවම කල්බදු ගෙවීම් වල කල්බද්ද ආරම්භයේ තීරණය කරන ලද වර්ථමාන වටිනාකමට සමාන අගයන්ගෙන් අඩු අගය මත ප්‍රාග්ධනිතකරණය කර සමාගම විසින් එම වත්කම් භාවිතා කිරීමට අපේක්ෂා කරන කාලපරිච්ඡේදය පුරා ක්‍රමක්ෂය කර දක්වයි.

බදුකරුට ගෙවීමට ඇති ප්‍රාග්ධන වටිනාකමට සමාන ප්‍රමාණය වගකීම් ලෙස පෙන්වා ඇත. එක් එක් මූල්‍ය වර්ෂයේදී ගෙවන බදු වාරිකය තුළ අන්තර්ගත පොළී ප්‍රමාණය එක් එක් වර්ෂයේ වියදමක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුල දක්වයි. මෙයින් එකම අනුපාතයක් යටතේ සෑම වර්ෂයක් අවසානයේම පවතින බදු වගකීම් ශේෂයට පොළී ගණනය වීම සිදුවේ.

බදු දේපළ වැඩි දියුණු කිරීම සඳහා කරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කර ඉතිරි බදු කාලය හෝ ඇස්තමේන්තු කරන ලද ඵලදායී ජීවිත කාලය හෝ යන දෙකෙන් අඩු කාල පරිච්ඡේදය තුළ ක්ෂය කරනු ලබයි.

**3.1.1.2 පසුකාලීන පිරිවැය**

දේපළ, පිරියත හෝ උපකරණයක කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේදී දරණ පිරිවැය එම කොටස පවත්වාගෙන යන ප්‍රමාණය, එම කොටසෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා එනු ඇති බව සහ එය විශ්වාසනීය ලෙස මැනීමට හැකි නම් එය වත්කමක් ලෙස හඳුනා ගනු ලබයි. මෙලෙස ප්‍රතිෂ්ඨාපනය කරන ලද කොටස් වල ධාරණ අගය පහත දක්වා ඇති ප්‍රති හඳුනාගැනීම් ප්‍රතිපත්තීන්ට අනුව ප්‍රති හඳුනාගැනීම් සිදුකරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණ වලට දෛනිකව කරන නඩත්තු පිරිවැය වර්ෂයේ ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගැනේ.

**3.1.1.3 හඳුනා ගැනීම් ඉවත් කිරීම**

දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීමේ දී හෝ භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ නැතැයි හැගෙන අවස්ථාවලදී එය වත්කමක් ලෙස හඳුනා නොගනී. ඒ තුලින් ලැබෙන ලැබීම් හා පාඩු, ලාභ හෝ පාඩු වශයෙන් සළකන අතර ප්‍රතිලාභ අයභාරය ලෙස වර්ගීකරණය නොකරයි.

#### 3.1.1.4 ක්ෂයවීම සහ ක්‍රමක්ෂය

(අ) ක්ෂයවීම්

ක්ෂය විස්තීරණ අදායම් ප්‍රකාශය තුළ හඳුනා ගන්නා අතර දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය මත පදනම්ව ඒ එක් එක් දේපළ, පිරියත හා උපකරණවල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිතකාලය පුරා ක්ෂය ගණනය කරනු ලැබේ. වර්තමානයේ ඇස්තමේන්තු ගත ඵලදායී ජීවිත කාලය සංසන්දනාත්මකව පහත පරිදි වේ.

| | වසර ගණන | අනුපාතය % |
|---|---|---|
| ගොඩනැගිලි | 40 | 2.50 |
| පිරියත හා යන්ත්‍ර සූත්‍ර | 15 | 6.67 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10 | 10.00 |
| මෝටර් රථ | 05 | 20.00 |
| උපකරණ | 08 | 12.50 |
| ස්ථිර ඉඩම් සංවර්ධනය | 30 | 3.33 |
| වැටවල් | 03 | 33.33 |
| ජල සැපයුම | 20 | 5.00 |

වත්කම් ක්ෂයවීම එය භාවිතය සඳහා ගත් අවස්ථාවේ ආරම්භ වී එය අලෙවිය සඳහා තබා ඇති බවට හෝ වත්කමක් ලෙස හඳුනා නොගන්නා බවට වර්ගීකරණය කර ඇති දිනයේ දී අවසන් වේ. ක්ෂය ක්‍රමය ඵලදායී ජීවිත කාලය හා ශේෂ වටිනාකම් වාර්තාකරන දිනයේ දී අවශ්‍ය වන්නේ නම් නැවත තක්සේරු කරනු ලබයි.

(ආ) ක්‍රමක්ෂය

කල්බදු කාලය අවසන් වීමත් සමගම නිශ්චිතවම වත්කමේ හිමිකරු වන බව දැන්වූවිට හැරෙන්නට කල්බදු යටතේ ඇති වත්කම් කල්බදු කාලය හෝ ඵලදායී ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබයි. ජනවසමෙන් බදු ගත් වත්කම්වල බදු කාලය 2045 න් අවසන් වනු ඇත.

ජනවසම වෙතින් අත්කර ගත් කල්බදු වත්කම්වල බදු අයිතිය ඉතිරි බදු කාලය සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය යන දෙකෙන් අඩු කාලය තුළ සමාන කොටස්වලින් ක්‍රමක්ෂය කරනු ලබන අතර වර්තමාන ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය සංසන්දනාත්මකව පහත දැක්වෙන පරිදි වේ.

| | වසර ගණන | අනුපාතය % |
|---|---|---|
| හිස් ඉඩම් සඳහා කල් බදු අයිතිය | 53 | 1.89 |
| ඉඩම් වැඩි දියුණු කිරීම | 30 | 3.33 |
| වෙනත් පවරා ඇති වත්කම් | 30 | 3.33 |
| ගොඩනැගිලි | 25 | 4.00 |
| යන්ත්‍රසූත්‍ර | 15 | 6.67 |
| ජල සැපයුම | 20 | 5.00 |

### 3.1.2 ජීව විද්‍යාත්මක වත්කම්

#### 3.1.2.1 නොමේරූ හා මේරූ වගාවන්

**(අ) නිශ්චල කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් (නොමේරූ හා මේරූ වගා)**

වැවිලි වතු පෞද්ගලීකරණය කරන අවස්ථාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ UTTF රීති නියමයන්ට අනුව ජනවසම වතුයායවල මූල්‍ය කල්බදු යටතේ නිශ්චල කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් (නොමේරූ හා මේරූ වගාවන්) 1992 ජුනි 11 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමේ ගිණුම් වලට ගෙන ඇත.

කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් සරල මාර්ග පදනම යටතේ විස්තීරණ මූල්‍ය ප්‍රකාශනය තුළ වර්තමාන සහ ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය පුරා සංසන්දනාත්මකව පහත සඳහන් ආකාරයට ක්‍රමක්ෂය කර ඇත.

| | වසර ගණන | අනුපාතිකය % |
|---|---|---|
| මේරූ වගාව | 30 | 3.33 |

**(ආ) කල්බදු දේපළ සංවර්ධනය කිරීම (නොමේරූ හා මේරූ වගා)**

වගා කරන කාලය තුළ එනම්, භූමිය සකස් කිරීම, පුනරුත්ථාපනය, අළුත් වගා කිරීම, නැවත වගා කිරීම, අන්තර් වගා කිරීම් සහ නව වගා සඳහා පොහොර යෙදීම ආදියේ සිට අස්වැන්න නෙලීම දක්වා (වගා කර ඇති ප්‍රදේශ වසර 8 කට පසු මේරූ තත්වයට පත් වන තුරු) පිරිවැය නොමේරූ වගා යටතට ගැනේ. මෙම නොමේරූ වගා සෘජු පිරිවැය සහ අන්තර්ග්‍රහනය කරන ලද පොදු කාර්යය පිරිවැය වලින් සමන්විත වේ. පවත්වාගෙන යන ජීව විද්‍යාත්මක වත්කම් (උදා: පොල්) වෙනුවෙන් දරණ ලද වියදම ඵල දරණ බවට පත් වන වර්ෂයේදී මේරූ වගාවන්ට මාරු කරනු ලබයි.

කල්බදු ඉඩම් සංවර්ධනය ක්ෂයවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සරල මාර්ග පදනමට අනුකූලව බදු කාලය අවසන් වීමට ඇති කාලය හෝ සංවර්ධනයේ ඵලදායී ආයු කාල සීමාව හෝ, දෙකෙන් අඩු එක ලෙස හඳුනා ගනු ඇත.

වර්ෂය තුළ මේරූ වගා බවට පත්වන වගාවන් ඒවා නොමේරූ වගා ලෙස පැවති කාලය තුල ඒ වෙනුවෙන් දරණ ලද වියදම් වර්ෂය අවසානයේදී මේරූ වගා වෙත මාරු කර එහි ඵලදායී ජීවන කාලය පුරා පහත පරිදි ක්ෂය කරනු ලබයි.

නොමේරූ වගා කාලය වර්ථමාන හා විස්තීර්ණ ඇස්තමේන්තුගත ඵලදායී ආයුකාලය පහත පරිදි වේ.

(ඵලදායී ආයු කාලය නොමේරු කාලයෙන් පසුව ගණනය කරනු ලබයි)

| | නොමේරු කාලය වසර ගණන | ආයු කාලය වසර ගණන | අනුපාතය(%) ක්ෂයවීම |
|---|---|---|---|
| පොල් | 08 | 50 | 2% |
| කජු | 08 | 25 | 4% |
| ඩ්‍රැගන් ෆෲට් | 03 | 20 | 5% |
| කුරුඳු | 04 | 20 | 5% |
| ගම්මිරිස් | 06 | 20 | 5% |
| රඹුටන් | 06 | 20 | 5% |
| අඹ | 05 | 20 | 5% |

**(ඇ) පාරිභොජ්‍ය ජෛව වත්කම්**

පාරිභෝජ්‍ය ජෛව වත්කම් යටතේ ගැනෙන දැව ගස් මූලික ප්‍රභව හඳුනා ගැනිමේදි මිනුම් කරන අතර එක් එක් වාර්තා කරන කාල සිමාව අවසානයේ ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත 41 අනුව විකිණීමේ පිරිවැය අඩු කොට සාධාරණ අගයට ගණනය කරයි. දැව ගස් වල සාධාරණ වටිනාකම වර්තමාන දැව වල ගණන් හා එම දැව ගස් පරිනත තත්ත්වයට පත් වු විට එම දැව ගස් වලින් අපේක්ෂා කරන දැව පරිමාව සැලකිල්ලට ගනිමින් වට්ටම් කල මුදල් ප්‍රවාහ ක්‍රමය (DCF) යොදා ගෙන ගණනය කරනු ලබයි.

නොමේරු ගස් වල පිරිවැය සාධාරණ අගයට ආසන්න අගයක් ලෙස සලකා කටයුතු කරනු ලබයි. මෙම ගණනය කිරීම සුදුසුකම් ලත් ස්වාධීන තක්සේරු කරුවෙකු විසින් කරනු ලබයි.

පාරිභෝජ්‍ය ජෛව වත්කම් මූලික / ප්‍රථම හඳුනාගැනිමේ දි හඳුනාගනු ලබන ලාභ හෝ අලාභ සහ ඉන් පසුව එම වෙත්කම් වල සාධාරණ අගය වෙනස් වීම හේතු කොට ගෙන ඇතිවන්නා වු කාලච්ඡේදයට අදාල විස්තීරණ ආදායම් ප්‍රකාශ තුල හඳුනා ගනු ලබයි.

මේ හා සම්බන්ධ අනෙකුත් සියළුම උපකල්පන ගිණුම් සටහන් අංක 7.2 හි දක්වා ඇත.

වට්ටම් කල මුදල් ප්‍රවාහ ක්‍රමය/ ආකෘතිය (DCF) තුල අවධානය යොමු කොට ඇති ප්‍රධාන විචල්‍යයන්.

| විචල්‍ය | විස්තරය |
|---|---|
| **මුදල් ඒකකය** | ශ්‍රී ලංකා රුපියල් |
| **දැව පරිමාව** | උස හා වට ප්‍රමාණය භෞතිකව තහවුරු කර ගැනිමෙන් හා විවිධ භූගෝලීය ප්‍රදේශයන් තුල එක් එක් දැව වර්ගයෙහි වර්ධනය සැලකිල්ලට ගනිමින් ඇස්තමේන්තු සිදුකරයි මෙහිදි දැව හෙළීමට අදාල බලපවත්වනු ලබන සියළුම ව්‍යවස්ථාපිත විධි විධාන සැලකිල්ලට ගනු ලබයි. |
| **ආර්ථික ඵලදායි කාලය** | සමාගමේ වන වගා සැලසුම අනුව එක් එක් දැව විශේෂයන් හි සාමාන්‍ය ආයු කාලය තීරණය කරනු ලබයි. |
| **විකුණුම් මිල** | ශ්‍රි ලංකාවේ පවතින වෙළඳ පොල මිල අනුව ඇස්තමේන්තු සිදු කෙරේ. මෙහිදි දැවගස් විකුණුම් තත්වයට පත්කිරීම සඳහා සම්පුර්ණ කලයුතු සියළුම අවශ්‍යතා පිළිබඳව සලකා බලයි. |
| **වට්ටම් අනුපාතය** | අනාගත මුදල් ප්‍රවාහයන් පහත දැක්වෙන වට්ටම් අනුපාතයන් අනුව වට්ටම් ගත කෙරේ. |

- අස්වැන්න නෙලන වයස අවුරුදු 5 හෝ 5 ට අඩු 16%
- අස්වැන්න නෙලන වයස අවුරුදු 6 ත් 15 ත් අතර නම් 17%
- අස්වැන්න නෙලන වයස අවුරුදු 15 වැඩිනම් 18%

**3.1.2.2 ගව පශු සම්පත**

ගව පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙනි. ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව පශු සම්පත් සාධාරණ අගය තීරණය කරනු ලැබේ.

**3.1.3 විකිණීමට ඇති ජංගම නොවන වත්කම්**

අඛණ්ඩ භාවිතයට වඩා මූලිකව විකිණීම තුළින් අයකර ගැනීමට බලාපොරොත්තු වන ජංගම නොවන වත්කම් විකිණීම සඳහා වෙන්කර ඇති දෑ ලෙස වර්ගීකරණය කෙරේ. විකිණීමට තබා ඇති වත්කම් එසේ කිරීමට ආසන්නතම අවස්ථාවේ ඒවායේ ධාරණ අගය හෝ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කර ලැබෙන අගය යන දෙකෙන් අඩු අගය සේ සැලකේ. පවතින තත්ත්වයෙන්ම විකිණීමේ ඉහළ සම්භාවිතාවක් ඇති ජංගම නොවන වත්කම් විකිණීමට ඇති දෑ ලෙස වර්ගීකරණය කරනු ඇත.

"විකිණීමට වෙන්කර ඇති දෑ" ලෙස වර්ගීකරණය කළ දේපළ, පිරියත හෝ උපකරණ ක්ෂය කිරීමට හෝ ක්‍රමක්ෂය කිරීමකට භාජනය නොවේ.

#### 3.1.4 තොගය

තොග පිරිවැය හා ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි වටිනාකම මත යල්පැනුම් හා මන්දගාමීව අලෙවි වන ද්‍රව්‍ය සඳහා අවශ්‍ය වෙන් කිරීම් සිදු කිරීමෙන් පසුව අගයන්ගෙන් අඩු අගය මත ගණනය කර දක්වා ඇත. ශුද්ධ උපලබ්ධි අගය යනු උපලබ්ධි පිරිවැය ප්‍රතිපාදන සලසා හා/හෝ දැනට පවත්නා තත්ත්වයෙන් විකිණිය හැකි තත්ත්වයට පරිවර්තන සිදු කර සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රමවේදය අනුව තොග විකිණිය හැකි මිල ගණන්ය.

තොගය වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒම සඳහා දැරූ පිරිවැය පහත දැක්වෙන සූත්‍රය භාවිත කර ගණනය කරනු ලැබේ.

| | |
|---|---|
| පාරිභෝජන සහ අමතර ද්‍රව්‍ය යෙදවුම් | පෙර ලැබීම් පෙර නිකුත් පදනම මත සත්‍ය පිරිවැය |
| පැළ තවාන් සහ බෝග වැවීම | ඍජු ද්‍රව්‍ය, ඍජු ශ්‍රමය පිරිවැය හා ඍජුව ආරෝපණය කළ හැකි පොදු කාර්යය පිළිබඳ යෝග්‍ය සමානුපාතික පිරිවැය. |
| නෙලාගත් අස්වැන්න | ජීව විද්‍යාත්මක වත්කම් වලින් නෙලා ගත් කෘෂි නිෂ්පාදන ඒවායේ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කර නෙලාගත් අවස්ථාවේ අගය කරයි.<br>අර්ධ නිමි සහ නිමි කෘෂිකාර්මික තොග අගය කිරීමේදී කෘෂි නිෂ්පාදනවල සාධාරණ වටිනාකමට පරිවර්තනය කිරීමේ පිරිවැය එකතු කර අගය  කරයි. |
| පශු සම්පත් | කිරි පශු සම්පත් තොග මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කිරීමෙනි.<br>කිරි පශු සම්පත් සාධාරණ වටිනාකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුව තීරණය කරනු ලැබේ. |

#### 3.1.4.1 ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වල වැඩෙන නෙළාගත හැකි අස්වනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක (LKAS) 41 ට අනුව සමාගම ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වල වැඩෙන කෘෂි නිෂ්පාදන සාධාරණ අගයට විකුණුම් පිරිවැය අඩුකර හඳුනාගනී. සෑම ගිණුම්කරණ කාලපරිච්ජේද අවසානයේදී එම කෘෂි නිෂ්පාදනයේ සාධාරණ අගයෙහි වෙනස් වීම් ලාභ/අලාභ තුල හඳුනාගනී.

මෙම අරමුණින් එක් එක් බෝග කාණ්ඩයට අදාළ නෙළීමට ඇති කෘෂි නිෂ්පාදන අස්වනු ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා අවසන් වරට අස්වනු නෙලූ දිනයේ සිට එක් අස්වනු චක්‍රයක් පමණක් සැලකිල්ලට ගනු ලබයි. තවද එම අස්වනු චක්‍රයෙන් ලැබෙන අස්වැන්නෙන් 50% පමණක් අගය කිරීම සඳහා සලකා බලනු ලබයි. සමාගම විසින් නෙළීමට ඇති කෘෂි නිෂ්පාදන අගය කිරීම සඳහා පහත සඳහන් මිල සමීකරණය භාවිතා කරනු ලබයි.

**පොල්**
සාධාරණ වටිනාකම - (අස්වනු නෙළීම් පිරිවැය, ප්‍රවාහනය වැනි දෑ)

#### 3.1.5 මූල්‍ය උපකරණ

#### 3.1.5.1 හඳුනා ගැනීම සහ මූලික මිනුම්

වෙළඳ ලැබිය යුතු දේ මුලින්ම හඳුනාගනු ලබන්නේ ඒවායෙහි ආරම්භයේදීය. අනෙකුත් සියළුම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් මුලින්ම හඳුනාගනු ලබන්නේ සමාගම එම උපකරණයෙහි ගිවිසුම්ගත විධි විධාන වල පාර්ශවකරුවෙකු වන විටදීය.

මූල්‍ය වත්කමක් (එය සැළකිය යුතු මූල්‍ය දායකත්වයන් නොමැති වෙළඳ ලැබිය යුතු දෙයක් නොවන විට) හෝ මූල්‍ය වගකීමක් මුලින්ම මනිනු ලබන්නේ සාධාරණ අගය සමඟ වන අතර, FVTPL නොවන අයිතමයක් සඳහා එය අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට ඍජුවම ආරෝපනය වන ගණුදෙනු පිරිවැයෙන් වේ. සැළකිය යුතු මූල්‍ය දායකත්වයක් උපාංගයක් නොමැති වෙළඳ ලැබිය යුතු දෑ ආරම්භයේදී මනිනු ලබන්නේ ගණුදෙනුවෙහි මිලට ය.

### 3.1.5.2 වර්ගීකරණය සහ පසුකාලීන මැනීම

### 3.1.5.2.1 මූල්‍ය වත්කම්

**i) ප්‍රතිපත්තිය 2018 ජනවාරි 1 දින සිට අදාලවේ.**

මූල්‍ය වත්කමක ආරම්භක හඳුනා ගැනීම සිදු කරනුයේ, ක්‍රමක්ෂය පිරිවැය, FVOCI - ණය ආයෝජනය, FVOCI – ස්කන්ධ ආයෝජනය, හෝ FVTPL අනුව මැන වර්ගීකරණය කිරීමෙනි.

මූල්‍ය වත්කම් ඒවායෙහි හඳුනා ගැනීමට පසුව ප්‍රතිවර්ගීකරණය නොකරන විටදී සමාගම මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා ඔවුන්ගේ ව්‍යාපාරික ආකෘතිය වෙනස් නොකරන්නේ නම්, එම අවස්ථාවේදී බලපෑමට ලක්වූ සියළුම මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියේ වෙනස්වීමෙන් පසු එළඹෙන ප්‍රථම වාර්තාකරණ කාල පරිච්ඡේදයේ පළමුවන දිනයේ ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ එය FVTPLහි නම්කර නොමැති නම් ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා වත්කම් තබාගැනීම අරමුණු කරගත් ව්‍යාපාර ආකෘතියක් තුල එය පවත්වනු ලැබේ; සහ
- එහි ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දිනයන්හි මුදල් ප්‍රවාහයන්ට හුදෙක්ම බලපානු ලබන්නේ ගෙවිය යුතු මුල් මුදල සහ මුල් මුදල සඳහා වන පොළී මුදල් වේ.

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ එය FVTPLහි නම්කර නොමැති නම්, ණය ආයෝජනයක් FVTPL යටතේ මනිනු ලැබේ.

- එය පවත්වනු ලබන්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම යන දෙකෙන් අරමුණු සාක්ෂාත් කරගනු ලබන ව්‍යාපාරික ආකෘතියක් තුල සහ
- එහි ගිවිසුම්ගත නියමයන් මගින් නිශ්චිත දිනයන්හි මුදල් ප්‍රවාහයන් සඳහා හුදෙක්ම බලපානු ලබන්නේ ගෙවිය යුතු මුල් මුදල සහ මුල් මුදල සඳහා වන පොළී මුදල් වේ.

වෙළඳම සඳහා රඳවාගෙන නොමැති ස්කන්ධ ආයෝජනයක් ආරම්භක හඳුනා ගැනීම මත, OCI හි ආයෝජනයේ සාධාරණ අගයෙහි පසු කාලීන වෙනස්කම් ඉදිරිපත් කිරීමට සමාගම විසින් වෙනස් කළ නොහැකි ලෙස තෝරාගත හැකිය. මෙම තෝරා ගැනීම සිදුකරනු ලබන්නේ ආයෝජන - අනුව - ආයෝජන පදනම මතය.

ඉහත විස්තර කර ඇති පරිදි ක්‍රමක්ෂය පිරිවැයෙන් හෝ FVOCI අනුව මනිනු ලැබ වර්ගීකරණය නොකරන ලද සියළුම මූල්‍ය වත්කම් FVTPL අනුව මනිනු ලැබේ. සියළුම ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් මෙයට ඇතුලත් වේ. ආරම්භක හඳුනා ගැනීම මත, සමූහය විසින් අවලංගු කළ නොහැකි ලෙස මූල්‍ය වත්කම් නම් කරනු ලැබිය හැකිය. එසේ නොමැති නම්, ක්‍රමක්ෂය පිරිවැයෙන් හෝ FVOCI අනුව හෝ FVTPL අනුව මැනිය යුතු අවශ්‍යතා සපුරාලන විටදී, සමාගම විසින් එසේ කිරීමෙන් පැන නැගිය හැකි ගිණුම්කරණ නොගැලපීම් ඉවත්කිරීම හෝ සැළකිය යුතු ලෙස අඩුකිරීම සිදු කරයි.

#### අ) ව්‍යාපාර ආකෘති ඇගයීම

මූල්‍ය වත්කම් කළඹ මට්ටමක් ලෙස පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර ආකෘතියේ අරමුණු ඇගයීම සමාගම විසින් සිදුකරනු ලබන්නේ මෙමගින් ව්‍යාපාරය කළමනාකරණය කරන ආකාරය සහ කළමනාකරණයට තොරතුරු සපයන ආකාරය මනාව පිළිබිඹු කරන බැවිනි. සළකා බැලූ තොරතුරු වලට ඇතුලත් වන්නේ.

- කළඹ සඳහා ප්‍රකාශිත ප්‍රතිපත්ති හා අරමුණු සහ එම ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම. මෙයට ගිවිසුම්ගත පොළී ආදායම් උපයා ගැනීම සඳහා කළමනාකාරිත්වයේ උපාය මාර්ග යොමුවී තිබීම, විශේෂිත පොළී අනුපාත පැතිකඩක් පවත්වා ගැනීම, මූල්‍ය වත්කම්වල කාල සීමාව අදාල වගකීම්වල කාලයට ගැලපීම හෝ අපේක්ෂිත මුදල් පිටතට ගලායෑම හෝ වත්කම් විකිණීමෙන් මුදල් ප්‍රවාහයන් සාක්ෂාත් කර ගැනීම යන කරුණු ඇතුලත් වේ.
- කළඹෙහි ක්‍රියාකාරිත්වය ඇගයීමට ලක්කර සමාගමේ කළමනාකාරිත්වයට වාර්තා කරන්නේ කෙසේද?
- ව්‍යාපාර ආකෘතියේ කාර්ය සාධනයට බලපාන අවදානම් (සහ ව්‍යාපාර ආකෘතිය තුල ඇති මූල්‍ය වත්කම්) සහ එම අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේද?
- පූර්ව කාල පරිච්ඡේදයන්හි මූල්‍ය වත්කම් විකිණීමේ වාර ගණන, පරිමාව සහ වේලාවල එවැනි විකුණුම් සඳහා හේතුව සහ අනාගත විකුණුම් ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාව.

සමූහයේ වත්කම් අඛණ්ඩව හඳුනාගැනීමට අනුකූලව ප්‍රතිහඳුනාගැනීම සඳහා සුදුසුකම් නොලබන ගණුදෙනුවල මූල්‍ය වත්කම් තෙවන පාර්ශවයකට පැවරීම මෙම අරමුණු සඳහා විකුණුම් ලෙස නොසැළකේ.

වෙළඳාම සඳහා තබා ඇති හෝ කළමනාකරණය කරනු ලබන සහ සාධාරණ අගයක් මත කාර්ය සාධනය ඇගයීමට ලක් කරන මූල්‍ය වත්කම් FVTPLහි මනිනු ලැබේ.

ආ) **පසුකාලීන මිනුම් සහ ප්‍රතිලාභ හා අලාභ**

| | |
|---|---|
| FVTPLහි මූල්‍ය වත්කම් | මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයකින් මනිනු ලැබේ. ඕනෑම පොළියක් හෝ ලාභාංශ ආදායමක් ඇතුළුව ශුද්ධ ප්‍රතිලාභ සහ අලාභ, ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ. |
| ක්‍රමක්ෂය පිරිවැයට වූ මූල්‍ය වත්කම් | මෙම වත්කම් පසුකාලීනව සඵල පොළී ක්‍රමය භාවිතා කර ක්‍රම ක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ. හානිකරණ අලාභ හේතුවෙන් ක්‍රම ක්ෂය පිරිවැය අඩුවේ. පොළී ආදායම සහ හානිකරණය, ලාභය හෝ අලාභය ලෙස හඳුනාගෙන ඇත. ප්‍රතිහඳුනාගැනීමෙන් ලැබෙන ඕනෑම ලාභයක් හෝ අලාභයක්, ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ. |
| FVOCIහි ණය ආයෝජන | මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයකින් මනිනු ලැබේ. සඵල පොළී ක්‍රමය භාවිතා කර ගණනය කරනු ලබන පොළී ආදායම සහ හානිකරණය, ලාභය හෝ අලාභය ලෙස හඳුනාගැනේ. අනෙකුත් ශුද්ධ ප්‍රතිලාභ සහ අලාභ, OCIහි හඳුනාගෙන ඇත. ප්‍රතිහඳුනාගැනීමේදී OCIහි එකතුවී ඇති ප්‍රතිලාභ සහ අලාභ, ලාභය හෝ අලාභය ලෙස ප්‍රති වර්ගීකරණය කෙරේ. |
| FVOCIහි ස්කන්ධ ආයෝජන | මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයකින් මනිනු ලැබේ. ලාභාංශ පැහැදිලිවම ආයෝජන පිරිවැයෙන් කොටසක් අයකර ගැනීමක් නියෝජනය නොකරන්නේ නම් ලාභාංශ, ලාභයේ හෝ අලාභයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ. අනෙකුත් ශුද්ධ ප්‍රතිලාභ සහ අලාභ OCIහි හඳුනාගෙන ඇති අතර, ඒවා කිසි විටකත් ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකෙරේ. |

**3.1.5.2.2. මූල්‍ය වගකීම්**

**i) වර්ගීකරණය, පසුකාලීන මිනුම් සහ ප්‍රතිලාභ හා අලාභ**

මූල්‍ය වගකීම් FVTPLහි ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. මූල්‍ය වගකීමක් FVTPLහි වර්ගීකරණය කර තිබෙන විට එය වෙළඳාම සඳහා රඳවාගෙන ඇති ලෙසට වර්ගීකරණය කර ඇත්නම්, එය ව්‍යුත්පන්නයක් හෝ මූලික හඳුනාගැනීම මත එය නම්කර ඇත. FVTPL හි මූල්‍ය වගකීම් කිසියම් පොළී වියදම් ඇතුළුව ශුද්ධ ප්‍රතිලාභ සහ අලාභ සාධාරණ අගයකින් මනිනු ලබන අතර, ලාභය හෝ අලාභය ලෙසට හඳුනා ගෙන ඇත. වෙනත් මූල්‍ය වගකීම් පසුකාලීනව සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ. පොළී වියදම් සහ විදේශ විනිමය ප්‍රතිලාභ සහ අලාභ, ලාභය හෝ අලාභය ලෙස හඳුනාගැනේ. ප්‍රතිහඳුනාගැනීමෙන් ලැබෙන ඕනෑම ලාභයක් හෝ අලාභයක්, ලාභය හෝ අලාභය තුළද හඳුනාගැනේ.

**3.1.5.3 ප්‍රතිහඳුනාගැනීම**

**3.1.5.3.1 මූල්‍ය වත්කම්**

මූල්‍ය වත්කම් වලින් ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත්වූ විට හෝ මූල්‍ය වත්කම් වල හිමිකාරිත්වයෙහි සියළු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස මාරු කරනු ලබන ගණුදෙනුවකදී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය මාරු කරනවිට හෝ සමාගම විසින් එහි හිමිකාරිත්වයෙහි සියළු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස මාරු කිරීම හෝ රඳවා ගැනීම සිදු නොකරන අතර, මූල්‍ය වත්කම් පාලනය කිරීම ද රඳවා නොගන්නා විට සමාගම විසින් මූල්‍ය වත්කම් ඉවත් කිරීම සිදු කරනු ලැබේ.

සමාගම සිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වත්කම් ලෙසට හඳුනා ගෙන මාරු කරන ලද ගණුදෙනුවලට ඇතුලත් කරන නමුත් මාරු කරන ලද වත්කම් වල සියළු අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම රඳවා ගනී. මෙම අවස්ථාවලදී වත්කම් මාරු කරනු ලැබේ. මෙම අවස්ථාවලදී, මාරු කරන ලද වත්කම් ඉවත් කිරීම සිදු කරනු නොලැබේ.

**3.1.5.3.2 මූල්‍ය වගකීම්**

ගිවිසුම්ගත බැඳීම් නිදහස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත්වූ විට සමාගම මූල්‍ය වගකීමක් ඉවත්කරනු ලබයි. මූල්‍ය වගකීමක නියමයන් වෙනස් කරන විට සහ වෙනස් කරන ලද වගකීම්වල මුදල් ප්‍රවාහයන් සැළකිය යුතු ලෙස වෙනස් වන විටද සමාගම මූල්‍ය වගකීමක් ඉවත් කරන අතර, එම අවස්ථාවේදී වෙනස් කරන ලද නියමයන් මත පදනම්වූ නව මූල්‍ය වගකීමක් සාධාරණ අගයකින් හඳුනාගනී.

මූල්‍ය වගකීමක් ඉවත් කිරීමේදී නිරුද්ධවූ ධාරණ අගය සහ ගෙවූ ප්‍රතිශ්ඨාව අතර වෙනස ( මාරු කරන ලද උපකල්පිත යම් මුදල් නොවන වත්කම් හෝ වගකීම් ඇතුළුව) ලාභය හෝ අලාභය ලෙස හඳුනාගැනේ.

### 3.1.5.4 හිලව් කිරීම

සමාගමට දැනට මුදල් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක අයිතියක් තිබීම සහ එය ශුද්ධ පදනමක් මත පියවා දැමීමට හෝ වත්කම සාක්ෂාත් කර ගැනීමට සහ වගකීම එකවර පියවීමට අදහස් කරන්නේ කවර දිනකදීද, එදිනට මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් පියවා ඇති අතර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ශුද්ධ මුදල ඉදිරිපත් කර ඇත.

### 3.1.5.5 හානිකරණය - මූල්‍ය වත්කම්

**ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්**

### 3.1.5.5.1 මූල්‍ය උපකරණ සහ ගිවිසුම් වත්කම්

වෙළඳ ලැබිය යුතුදේ සඳහා වන අලාභ දීමනා සැම විටම මනිනු ලබන්නේ ජීවිත කාලීන අපේක්ෂිත ණය අලාභයට (ECL) සමාන මුදලකටය.

මූලික හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය වත්කමක ණය අවදානම සැළකිය යුතු ලෙස වැඩිවී තිබේද යන්න තීරණය කිරීමේදී සහ ECL තක්සේරු කිරීමේදී සමාගම අනවශ්‍ය පිරිවැයක් හෝ උත්සාහයක් නොමැතිව අදාල සහ ලබාගත හැකි සාධාරණ සහ සහාය තොරතුරු සළකා බලයි. සමාගමේ ඓතිහාසික අත්දැකීම් මත පදනම්ව සහ දැනුවත් ණය තක්සේරුව සහ ඉදිරි දැක්ම තොරතුරු ඇතුළුව ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සහ විශ්ලේෂණය මෙයට ඇතුලත්වේ.

නියමිත දිනට දින 365කට වඩා කල් ඉකුත්වී ඇත්නම් මූල්‍ය වත්කමක ණය අවදානම සැළකිය යුතු ලෙස වැඩිවී ඇති බවට සමාගම උපකල්පනය කරයි.

මූල්‍ය වත්කමක පැහැර හැරීමක් ඇති බවට සමාගම සළකනුයේ,

- ණයගැතියා හට සමාගමෙන් කිසිදු උපකාරයක් නොමැතිව සමාගම වෙත සිය ණය බැඳීම් සම්පූර්ණයෙන්ම ගෙවීමට අපහසු වනවිට, සමාගමට සුරකුම් උපලබ්ධි කිරීම වැනි ක්‍රියා රාශියක් ගැනීමට සිදුවේ (කිසියම් දෙයක් රඳවාගෙන ඇත්නම්) හෝ
- මූල්‍ය වත්කම දින 180කට වඩා කල් ඉකුත්වීම.

  ජීවිත කාලය පුරාවට ඇති ECL යනු මූල්‍ය උපකරණයක අපේක්ෂිත ආයු කාලය පුරාවටම සිදුවිය හැකි සියළු පැහැර හැරීමේ සිදුවීම්වල ප්‍රතිඵලයක් වන ECL ය.

මාස 12 ක ECL යනු ECL හි කොටසක් වන වාර්තා කළ දිනට පසුව වන මාස 12 ක් තුල සිදුවිය හැකි පැහැර හැරීම් සිදුවීම් වේ. (හෝ උපකරණයේ අපේක්ෂිත ආයු කාලය මාස 12ට වඩා අඩුනම්, කෙටි කාලයක්) ECL තක්සේරු කිරීමේදී සළකා බැලිය හැකි උපරිම කාල සීමාව වන්නේ සමාගම ණය අවදානමට අනාවරණය වන උපරිම ගිවිසුම් කාලයයි.

### 3.1.5.5.2. ECL මැනීම

ECL යනු ණය අලාභ පිළිබඳ - සම්භාවිතාවයෙහි බර තැබූ තක්සේරුවකි. ණය අලාභ මනිනු ලබන්නේ සියළුම මුදල් හිඟයන්හි වර්තමාන අගය ලෙසටය. (එනම්, ගිවිසුමට අනුකූලව අස්තිත්ත්වය විසින් ඇති කරන මුදල් ප්‍රවාහයන් සහ සමාගම ලැබීමට අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් අතර වෙනසයි)

ECL වට්ටම් කරනු ලබන්නේ මූල්‍ය වත්කම් වල සඵල පොළී අනුපාතයටය.

### 3.1.5.5.3 ණය - හානිවූ මූල්‍ය වත්කම්

සෑම වාර්තාකරණ දිනයකදීම, සමාගම විසින් මූල්‍ය වත්කම් ධාරණය කරනුයේ ක්‍රමක්ෂය පිරිවැය යටතේ ද සහ **FVOCI**හි ණය සුරකුම් පත් හානිවූ ණය අනුවද යන්න තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට අහිතකර ලෙස බලපාන සිදුවීම් එකක් හෝ කීපයක් සිදුවූ විට මූල්‍ය වත්කමක් ''හානිවූ ණය'' ලෙස සැළකේ.

මූල්‍ය වත්කමක් හානිවූ ණයක් බවට පත්වී ඇති බවට පහත දැක්වෙන දත්ත නිරීක්ෂණය කිරීමෙන් හැකි වේ.

- ණය ගැනුම්කරුගේ හෝ නිකුත් කරන්නාගේ සැළකිය යුතු මූල්‍ය දුෂ්කරතා
- පැහැර හැරීම හෝ දින 180කට වඩා කල් ඉකුත්වීම වැනි ගිවිසුම් කඩ කිරීම
- සමාගම වෙනත් ආකාරයකින් නොසළකන කොන්දේසි මත සමාගම විසින් ණයක් හෝ අත්තිකාරමක් ප්‍රතිව්‍යුහගත කිරීම
- ණය ගැනුම්කරු බුන්වත් භාවයට පත්වීම හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළුවීමට ඉඩ ඇතිබව හෝ
- මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ආරක්ෂාවීම සඳහා ක්‍රියාකාරී වෙළඳපලෙන් අතුරුදහන් වීම

### 3.1.5.5.4 මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී ECL සඳහා දීමනාවක් ඉදිරිපත් කිරීම

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා වන අලාභ දීමනාව වත්කම් වල දළ ධාරණ අගයේ ප්‍රමාණයෙන් අඩුකරනු ලැබේ.

### 3.1.5.5.5. ලියාහැරීම්

මූල්‍ය වත්කමක් සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් සමාගමට නොමැති විට මූල්‍ය වත්කමක දළ ධාරණ අගය ලියා හරිනු ලැබේ. එක් එක් ගණුදෙනුකරුවෙකුගෙන්, සමාන වත්කම් අයකර ගැනීමේ ඓතිහාසික අත්දැකීම්

මත පදනම්ව මූල්‍ය වත්කම් දින 180ක් ඉක්මවා කල් ඉකුත්වූ විට දළ ධාරණ අගය ලියා හැරීමේ ප්‍රතිපත්තියක් සමාගම සතුව ඇත. ආයතනික ගණුදෙනුකරුවන් සඳහා, අයකර ගැනීම පිළිබඳ සාධාරණ අපේක්ෂාවක් තිබේද යන්න මත පදනම්වල ලියාහැරීමේ කාලය හා මුදල සම්බන්ධයෙන් සමාගම විසින් තනි තනිව තක්සේරුවක් සිදුකරයි. ලියා හරින ලද මුදලින් සැළකිය යුතු අයකිරීමක් සමාගම අපේක්ෂා නොකරයි. කෙසේ වෙතත්, ගෙවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා සමාගමේ ක්‍රියා පටිපාටි වලට අනුකලවීම සඳහා ලියා හරින ලද මූල්‍ය වත්කම් තවදුරටත් බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් වලට යටත් විය හැකිය.

### 3.2.1. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති

සමාගමේ ප්‍රධාන මූල්‍ය වගකීම් සමන්විත වන්නේ වෙළඳාම සහ වෙනත් ගෙවියයුතු දේ, සහ ගෙවියයුතු ආදායම් බදු වලිනි. මෙම මූල්‍ය වගකීම් වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් සඳහා මුදල් යෙදවීමයි. සමාගමට රාජ්‍ය ව්‍යවසායයන් සහ වෙළඳාම හා වෙනත් ලැබියයුතු දේ සහ එහි මෙහෙයුම් වලින් සෘජුව ලැබෙන මුදල් සහ කෙටිකාලීන තැන්පතු සඳහා ණය ලබාදී ඇත. ඒ අනුව සමාගම එහි මූල්‍ය උපකරණ භාවිතා කරමින් ණය අවදානම, ද්‍රවශීලතා අවදානම, විනිමය අවදානම සහ පොළී අනුපාත අවදානමට නිරාවරණය වී ඇත. ඉහත සඳහන් එක් එක් අවදානම් වලට සමාගම නිරාවරණයවීම සමාගමේ අරමුණ, අවදානම් මැනීම සහ කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් පිළිබඳ තොරතුරු මෙම සටහන මඟින් ඉදිරිපත් කෙරේ.

#### 3.2.1.1. ණය අවදානම

ණය අවදානම යනු ගණුදෙනුකරුවෙකු හෝ මූල්‍ය උපකරණයක පාර්ශවකරුවෙකු එහි ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වුවහොත් සමාගමට මූල්‍යමය අලාභයක් වීමේ අවදානමක් ඇතිවන අතර, ප්‍රධාන වශයෙන් ඒවා පැන නඟින්නේ සමාගමට ලැබියයුතු ගණුදෙනුකරුවන්ගෙනි.

#### 3.2.1.2. ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබාදීමෙන් පියවා ඇති මූල්‍ය වගකීම් හා බැඳීම් ඉටු කිරීමේදී සමාගමට දුෂ්කරතා ඇතිවීමේ අවදානමයි.

ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය වන්නේ, පිළිගත නොහැකි අලාභයන් හෝ සමාගමේ කීර්තිනාමයට හානියක් නොවී, සාමාන්‍ය හා ආතති තත්ත්වයන් යටතේ නියමිත වේලාවට එහි වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ඇති බව සහතික කිරීමයි.

### 3.2.2. සේවක ප්‍රතිලාභ

**(අ) නිර්විචිත දායක සැලසුම් - අර්ථ සාධක අරමුදල සහ භාරකාර අරමුදල**

නිර්වචනය කරන ලද දායක සැලැස්ම යනු පශ්චාත් රැකියා සැලැස්මක් වන අතර, ඒ යටතේ අස්තිත්ත්වයක් විසින් වෙනත් අස්තිත්ත්වයකට ස්ථාවර දායක මුදල් ගෙවන අතර, ඊට වැඩි මුදලක් ගෙවීමට නීතිමය හෝ ව්‍යුහාත්මක බැඳීමක් නොමැත. සියළුම සේවකයින් ආවරණය වන අර්ථ සාධක සහ භාරකාර අරමුදල් සඳහා වන දායකත්වය සේවකයින් විසින් සේවා සපයනු ලබන කාල පරිච්ඡේදයන්හිදී ලාභ සහ අලාභයෙහි වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

සමාගම එවැනි සේයකයින්ගේ ඒකාබද්ධ වැටුපෙන් 12% ක් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) සහ එම සේවකයින්ගේ ඒකාබද්ධ වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට දායකවේ.

**(ආ) නිර්විචිත ප්‍රතිලාභ සැලැස්ම**

නිර්විචිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිර්වචනය කරන ලද දායක සැලැස්මක් හැරුණුවිට ඇති පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිර්විචිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය තීරණය වන්නේ ආයුගණන තක්සේරු කිරීම් භාවිතා කරමිනි. ආයුගණන තක්සේරුවට වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ කාර්ය මණ්ඩල පිරිවැටුම පිළිබඳ උපකල්පන ඇතුලත් වේ. එම බැඳීම්වල ඇති දිගුකාලීන ස්වභාවය නිසා එවැනි ඇස්තමේන්තු සැළකියයුතු අවිනිශ්චිතතාවයකට යටත්වේ. ඇස්තමේන්තුවල භාවිතාවන ප්‍රධාන උපකල්පන පිළිබඳ විස්තර සටහන 16 හි අඩංගුවේ.

ලංකා බැංකුවේ ඇති ස්ථාවර තැන්පත් මගින් අරමුදල් වෙන්කර ඇත.

## 3.3. විලම්බිත ආදායම්

**ප්‍රදාන සහ සහනාධාර**

ප්‍රදානය ලැබෙන බවට සහ අමුණා ඇති සියළුම කොන්දේසි වලට අනුකූලවීම පිළිබඳව සාධාරණ සහතිකයක් ලැබීම අනුව රජයේ ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයකට සම්බන්ධවූ විට, එය ප්‍රදාන ලබාදීමට අදහස් කරන පිරිවැයට ක්‍රමානුකූල පදනමක් මත ගැලපීමට අවශ්‍ය කාලසීමාව තුල ආදායමක් ලෙස හඳුනාගැනේ. ප්‍රදානය වත්කමකට සම්බන්ධ වනවිට, එය විලම්බිත ආදායමක් ලෙස හඳුනාගෙන අදාල වත්කම්වල අපේක්ෂිත ඵලදායි ජීවිත කාලයට සමාන ප්‍රමාණයකින් ආදායමට මුදාහරිනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ වලට අදාල ප්‍රදාන මුලින් විලම්බිත කරන අතර, අදාල දේපල, පිරියත සහ උපකරණ වල ඵලදායි ජීවිත කාලයට සමානව ක්‍රමානුකූල පදනමක් මත ආදායමට වෙන්කරනු ලැබේ.

වත්කම්, ඒවායෙහි ඵලදායි ජීවිත කාලය තුල හෝ කල් ඉකුත් නොවූ කල්බදු කාලසීමාව තුල යන ඒවායින් අඩු ප්‍රමාණයට පහත පරිදි ක්‍රම ක්ෂය කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 යි |
| ජල සම්පාදන | වසර 20 යි |
| මෝටර් රථ | වසර 05 යි |
| ලීබදු සහ සවිකිරීම් | වසර 10 යි |
| උපකරණ | වසර 08 යි |

### 3.4. ආදායම් සහ වියදම්

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණ ස`දහා වියදම් ශ්‍රිතය අනුගමනය කරනු ලබන්නේ, එමගින් සමාගමෙහි කාර්ය සාධනයේ මූලිකාංගයන් සාධාරණ ප්‍රමාණයෙන් ඉදිරිපත් කරන බැවිනි.

#### 3.4.1. ආදායම් හඳුනාගැනීම

SLFRS 15 මගින් කොපමණ ප්‍රමාණයකින්, කවදා ආදායම හඳුනාගෙන තිබේද යන්න තීරණය කිරීම සඳහා පුළුල් රාමුවක් සපයයි. එමගින් LKAS 18 ආදායම්ල LKAS 11 ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සහ අදාල අර්ථ නිරූපනයන් ආදේශ කළේය. SLFRS 15 යටතේ ගණුදෙනුකරුවෙකු විසින් භාණ්ඩ හෝ සේවා වල පාලනය ලබාගත් ආදායම් ලෙස හඳුනාගැනේ. පාලනය පැවරීමේ වේලාව තීරණය කිරීමේදී කාලයත් සමඟ - විනිශ්චය අවශ්‍යවේ.

ගණුදෙනුකරුවෙකු සමඟ ඇතිකර ගෙන ඇති ගිවිසුමක දක්වා ඇති ප්‍රතිශ්ඨාව මත පදනම්ව ආදායම මනිනු ලැබේ. අස්තිත්ත්වයක් විසින් භාණ්ඩ හෝ සේවා පාරිභෝගිකයෙකුට පවරනවිට හෝ ලැබියයුතු යැයි සමාගම අපේක්ෂා කරන ප්‍රමාණයට ආදායම හඳුනාගනී. ආදායම ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ පොල් සහ කොප්රා අලෙවියෙනි.

2018 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන SLFRS 15 ට අනුවල සමාගම විසින් ආදායම හඳුනාගැනීම සඳහා මූලධර්ම මත පදනම්වූ පියවරයන් පහක ආකෘතියක් අනුගමනය කරයි. ඒ අනුවල ආදායම හඳුනාගනු ලබන්නේ පහත සඳහන් සියළු නිර්නායක සපුරා ඇතිවිට පමණි.

- ගිවිසුමෙහි පාර්ශවයන් ගිවිසුම් අනුමත කරඇති බව,
- මාරු කළයුතු භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් එක් එක් පාර්ශවයේ අයිතිවාසිකම් හඳුනාගැනීමට අස්තිත්ත්වයට හැකිබව,
- පැවරිය යුතු භාණ්ඩ හෝ සේවා සඳහා වන ගෙවීම් නියමයන් අස්තිත්ත්වයට හඳුනාගත හැකිබව,
- ගිවිසුමට වාණිජමය හරයක් ඇතිබව,
- පාරිභෝගිකයා වෙත මාරුකරනු ලබන භාණ්ඩ හෝ සේවාවන් සඳහා ලැබියයුතු ප්‍රතිශ්ඨාව රැස් කිරීමට අස්තිත්ත්වයට හැකියාව ඇතිබව.

SLFRS 15 අදාල කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශයට සැළකිය යුතු බලපෑමක් ඇති නොවේ.

අ) දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේදී ලැබෙන ප්‍රතිලාභ හෝ අලාභ තීරණය වන්නේ දේපල, පිරියත සහ උපකරණ වල ශුද්ධ විකුණුම් ඉපැයීම් ඒවායෙහි ධාරණ අගයත් සමඟ සසඳා ආදායම් ප්‍රකාශ තුල හඳුනාගැනීමෙනි.

ආ) වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගැනේ.

#### 3.4.2. වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරණු ලබන සියළු වියදම් වර්ෂය සඳහාවූ ලාභය/(අලාභය) ලඟාකර ගැනීමේදී ආදායමෙන් අයකෙරේ.

### 3.5. ආදායම් බදු

ආදායම් බදු වියදම වර්තමාන සහ විලම්බිත බද්දෙන් සමන්විතවේ. ස්කන්ධය ලෙසට හඳුනාගන්නා අවස්ථාවේදී. ස්කන්ධයට ඍජුව අදාලව හඳුනාගන්නා අයිතමයන් හැර, ආදායම් බදු වියදම ලාභයෙන් හෝ අලාභයෙන් හඳුනාගනු ලැබේ.

#### අ) ප්‍රවර්තන බදු

වර්තමාන බද්ද යනු වර්ෂය මත ගෙවිය යුතු අපේක්ෂිත බද්ද වන අතර, වාර්තා කරන දිනට පනවන ලද බදු අනුපාත සහ ඊට පෙර වර්ෂ වලට අදාලව ගෙවිය යුතු බදු සංශෝධන භාවිතා කෙරේ.

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම් යන මූලිකාංග මත වන අතර, දේශීය ආදායම් පනතේ විධි විධාන වලට අනුකූලව ගණනය කරනු ලැබේ.

#### ආ) විලම්බිත බදු

ශේෂපත්‍ර ක්‍රමය භාවිතා කරමින් විලම්බිත බදු හඳුනාගෙන ඇති අතර, වත්කම් හා වගකීම්වල මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වන ධාරණ අගය සහ බදුකරණ අගය සඳහා භාවිතා කරන අගය අතර ඇති තාවකාලික වෙනස්කම් වේ. පහත දැක්වෙන තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බද්ද හඳුනාගනු නොලැබේ. ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගිණුම්කරණයට හෝ බදු ගෙවිය හැකි

ලාභයට බලපානු නොලබන වත්කම් හෝ වගකීම් මුලින් හඳුනාගැනීමේ දී, සහ අනාගතයේ දී ආපසු හැරවිය නොහැකි තරමට වන පරිපාලිත සමාගම්වල ආයෝජන සම්බන්ධ වෙනස්කම්ය. මෙයට අමතරව, කීර්ති නාමයේ මූලික හඳුනාගැනීම මත පැන නගින බදු අයකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බද්ද හඳුනාගෙන නොමැත. විලම්බිත බද්ද මනිනු ලබන්නේ වාර්තා කරන දිනයට බලාත්මක කර ඇති හෝ සැළකිය යුතු ලෙස බලාත්මක කරන ලද නීති මත පදනම්ව ආපසු හැරවීමේදී තාවකාලික වෙනස්කම් වලට අදාලවනු ඇතැයි අපේක්ෂා කරන බදු අනුපාතයන් මතය. වර්තමාන බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීම සඳහා නිත්‍යානුකූලව බලාත්මක කළහැකි අයිතියක් තිබේනම්, විලම්බිත බදු වගකීම් සහ වත්කම් හිලව් කරනු ලබන අතර, ඒවා එකම බදු අධිකාරිය විසින් එකම බදු අයකළ හැකි අස්තිත්ත්වයක් මත අයකරනු ලබන ආදායම් බදු හා සම්බන්ධ වේ.

විලම්බිත බදු වත්කමක් හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස උපයෝගී කරගත හැකි, අනාගත බදු අයකළ හැකි, ලාභ ලබාගත හැකි තරමට පමණි. විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කෙරෙන අතර, හඳුනාගනු ලබන අදාල බදු ප්‍රතිලාභය තවදුරටත් සිදුවිය නොහැකි බව සාක්ෂාත් වනවිට එම ප්‍රමාණයෙන් ඒවා අඩුකරනු ලැබේ.

ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පරිපාලිතයන්හි සහ ආශ්‍රිතයන්හි ලාභාංශ ආදායම මත රඳවාගෙන ඇති බදු අදාල ලාභාංශ ගෙවීමේ වගකීම හඳුනාගත් අවස්ථාවේදීම හඳුනාගනු ලැබේ.

### 3.6 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් හා අනාවරණය කිරීම්

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 41 සහ 16 අනුව සංශෝධන - ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වලින් නෙලීමට ඇති කෘෂි නිෂ්පාදන**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අංක 16 සංශෝධනයන්ට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අංක 41 කෘෂිකර්ම ප්‍රමිතයේ අවශ්‍යතාවයන්ට අනුව ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වල වැඩෙන නෙලීමට ඇති කෘෂි නිෂ්පාදන සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩුකර අස්වනු නෙලීමට පෙර වෙනම හඳුනා ගත යුතුය. මූලික හඳුනා ගැනීමෙන් පසු ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වල වැඩෙන එම කෘෂි නිෂ්පාදන වල සාධාරණ අගයෙහි වෙනස් වීම් සෑම වාර්තා කරන දිනයකදීම ලාභ හෝ අලාභ යටතේ හඳුනා ගනී. ඒ අනුව සමාගම මෙම සංශෝධන් අතීතයේ සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය වාර්තා තුල ගැලපුම් කර ඇත. යොමුව ගිණුම්කරණ සටහන් අංක 28.

### 3.7 බණ්ඩ වාර්තාකරණය

සමාගමේ විවිධ ව්‍යාපාරික බණ්ඩ සඳහා බණ්ඩ තොරතුරු සපයනු ලැබේ. ව්‍යාපාරික බණ්ඩනය තීරණය කිරීම වැවිලි වත්කම් ස්ථානගතවී ඇති භූගෝලීය ප්‍රදේශ මත පදනම්ව ඇත. මූල්‍ය ප්‍රකාශවල 25.1 වන සටහනෙහි බණ්ඩවල ක්‍රියාකාරකම් විස්තර කර ඇති අතර, වැවිලි කර්මාන්තයේ භූගෝලීය ප්‍රදේශ පහත පරිදි වේ.

**සමූහ I වතුයායයන්**

- හලාවත වතු කලාපය
- පලුගස්වැව වතු යාය
- මංගලඑළිය වතු කලාපය
- තම්බපණ්ණී වතු කලාපය

**සමූහ II වතුයායයන්**

- බිංගිරිය වතු කලාපය
- දිවුලපිටිය වතු කලාපය
- මාදම්පේ වතු කලාපය
- නිකවැරටිය වතු කලාපය

## 04. ජනවසම ඉඩම් වල කල්බදු අයිතිය

| | | 2023 Rs. | 2022 Rs. |
|---|---|---|---|
| ජනවසම ඉඩම් වල කල්බදු අයිතිය | 04.1 | 57,540,567 | 60,356,373 |
| ජනවසම පලෙයි ඉඩම් වල කල්බදු අයිතිය | 04.2 | 47,833,929 | |
| | | **105,374,496** | **60,356,373** |

## 04.1 ජනවසම ඉඩම් වල කල්බදු අයිතිය

සියළු වතු වලට අදාල වසර 53 කාලයක් සඳහා කල්බදු ගිවිසුම් අත්සන් කර ඇත. මෙම සියළු කල්බදු 1992 ජුනි 11 දින එනම්, සමාගම ආරම්භක දිනයේ සිට බලපැවැත්වෙන ලෙස ක්‍රියාත්මක වේ. මෙම සියළු වතු වලට අදාල කල්බදු අයිතිය 1992 ජුනි 11 දින සමාගම පිහිටුවන ලද අවස්ථාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හදිසි කරුණු කාර්ය බලකාය මේ සම්බන්ධයෙන් ලබා දෙන නියමයන්ට හා විධිවිධානයන්ට අනුව සමාගමේ පොත් වලට ගෙන ඇත. මේ සඳහා 1995 මාර්තු 08 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම හිස් ඉඩම් සමාගම පිහිටුවීමට පෙර විශේෂඥ ඩි.ආර්. වික්‍රමසිංහ සැකසූ වටිනාකම මත ප්‍රති ඇගයීමට තීරණය කර ඇත.

1992 ජුනි මස 11 දින මෙම වත්කම් ශේෂ පත්‍රයට ගෙන වසර 53 ක් පුරා සමාන වටිනාකමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. වාර්ථාකරන දිනට ඉතිරි කල්බදු කාලය වසර 22.5 ක් වේ.

| | දළ පවත්වාගෙනයාමේ අගය | | |
|---|---|---|---|
| | දිනට 31.12.2023 රු. | එකතු කිරීම්/ (ඉවත් කිරීම්) රු. | දිනට 31.12.2022 රු. |
| හිස් ඉඩම්වල කල්බදු අයිතිය | **142,188,257** | **(314,030.00)** | **142,502,287** |

| | ක්‍රමක්ෂය | | | |
|---|---|---|---|---|
| | දිනට 31.12.2023 රු. | වර්ෂය තුල ඉවත්කිරීම් රු. | වසර සඳහා රු. | දිනට 01.01.2023 රු. |
| හිස් ඉඩම්වල කල්බදු අයිතිය | **84,647,690** | **(182,904)** | **2,684,680** | **82,145,914** |

| | පවත්වාගෙන යාමේ අගය | |
|---|---|---|
| | දිනට 31.12.2023 රු. | දිනට 31.12.2022 රු. |
| හිස් ඉඩම්වල කල්බදු අයිතිය | **57,540,567** | **60,356,373** |

## 4.2 හිස් ඉඩම් වල කල්බදු අයිතිය ජනවසම පලෙයි වත්ත

(අ) පලෙයි වතු කලාපය වසර 30ක කාලයක් සඳහා කල්බදු ගිවිසුමට එලබී ඇත. පලෙයි වත්තේ කල්බදු අයිතිය 2023 පෙබරවාරි 09 දිනට සමාගමේ පොත් වලට ගෙන ඇත. මෙම වත්කම 2023 පෙබරවාරි 09 දිනට ශේෂ පත්‍රයට ගෙන වසර 30ක කල්බදු කාලය පුරා සමාන අගයන්ගෙන් ක්‍රමක්ෂය කරනු ලබයි.

(ආ) මුනමලෙයි අයියන්කල් වත්ත, විසුවලිංගම් තොට්ටම් වත්ත සහ කාසිපල්ල්ලයි කානි වත්ත වන වතු සඳහා වසර 30ක කල්බදු ගිවිසුමට එලබී ඇත. මෙම සියළු ඉඩම් වල කල්බදු අයිතිය 2023 අප්‍රේල් 26 දිනට සමාගමේ පොත්වලට ගෙන ඇත.

මෙම වත්කම් 2024 අප්‍රේල් 26 දිනට ශේෂ පත්‍රයට ගෙන වසර 30ක් පුරා සමාන අගයන්ගෙන් ක්‍රමක්ෂය කරනු ලබන අතර වාර්තාකරන දිනට ඉතිරිව ඇති කාලය වසර 29ක් හා මාස 4කි.

කෙසේ වෙතත් මෙම වත්කම් පවරන අවස්ථාව වන විට ගිණුම් වාර්තා වලට ගැනීම සඳහා එහි පොත් අගයක් නොපැවතුනි. එම නිසා පලෙයි, මුනමලෙයි අයියන්කල්, විසුවලිංගම් තොට්ටම් වතුවල සහ කාසි පල්ල්ලයි කානි වතු වල හිස් ඉඩම් වල වටිනාකම කල්බදු කුලිය හා 12.5% ක අනාගත වට්ටම් අනුපාතය පදනම් කර ගනිමින් තක්සේරු කරන ලදී.

| | දළ පවත්වාගෙනයාමේ අගය | |
|---|---|---|
| | දිනට 31.12.2023 රු. | දිනට 31.12.2022 රු. |
| වර්ෂය ආරම්භයට | - | - |
| එකතු කිරීම් | 49,101,423 | - |
| වර්ෂය අවසානයට | 49,101,423 | - |

| | ක්‍රමක්ෂය | | |
|---|---|---|---|
| | දිනට 31.12.2023 රු. | වසර සඳහා රු. | දිනට 01.01.2023 රු. |
| හිස් ඉඩම් වල කල්බදු අයිතිය | **1,267,494** | **1,267,494** | **-** |

| | පවත්වාගෙන යාමේ අගය | |
|---|---|---|
| | දිනට 31.12.2023 රු. | දිනට 31.12.2022 රු. |
| හිස් ඉඩම් වල කල්බදු අයිතිය | **47,833,929** | **-** |

### 05. ජනවසම වතුවල නිශ්චල කල්බදු වත්කම් (භාවිතයට අයිතිය ඇති ඉඩම් සහ කල්බදු ජෛව වත්කම් හැර)

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හදිසි කරුණු කාර්ය සාධක බලකායේ (UITF) නියමයට අනුව මෙම වතුවල ඇති මූල්‍ය කල්බදු යටතේ ඇති සියළුම නිශ්චල දේපල අතීතයේ සිට බලපවත්වන පරිදි 1992 ජුනි 22 වන දින සිට ක්‍රියාත්මක වනසේ සමාගමේ පොත් වලට ගෙන ඇත. වත්කම් ජනවසම පොත්වල සටහන් වටිනාකම් මත සමාගම ආරම්භ කළ දිනට පොත් වලට ගැනීමට 1995 මාර්තු 08 පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත. මෙම වත්කම් 1992 ජුනි 11 දින ශේෂ පත්‍රයට ගෙන ඇති අතර නිශ්චල වත්කම් හා ක්‍රමක්ෂය 2022 දෙසැම්බර් 31 වන දිනට පහත දක්වා ඇත.

| තක්සේරුවේදි | ඉඩම් සංවර්ධනය රු. | වෙනත් අයිති වූ වත්කම් රු. | ගොඩනැගිලි රු. | යන්ත්‍ර සූත්‍ර රු. | ජල සැපයුම රු. | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනිත වටිනාකම | 841,193 | 1,002,944 | 25,356,498 | 530 | 4,026,236 | 31,227,401 | 31,227,401 |
| ක්‍රමක්ෂය වීම | | | | | | | |
| ජනවාර් 01 දා ට | 71,725 | 987,195 | 25,356,498 | 530 | 4,026,236 | 30,457,933 | 30,441,110 |
| වර්ෂයට ක්‍රමක්ෂය වීම | - | 15,749 | | - | - | - | 16,823 |
| දෙසැම්බර් 31 ට | 71,725 | 1,002,944 | 25,356,498 | 530 | 4,026,236 | 30,457,933 | 30,457,933 |
| පවත්වාගෙන යන වටිනාකම | **769,467.50** | **-** | **-** | **-** | **-** | **769,468** | **769,468** |

### 05.1. කල්බදු යටතේ ඇති ජෛව වත්කම් (ජනවසම)

| | | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| 5.1.1 | ජනවසම ඉඩම් වල කල්බදු අයිතිය | 9,051,201 | 10,939,028 |
| 05.1.2 | ජනවසම පලෙයි ඉඩම් වල කල්බදු අයිතිය | 18,110,918 | - |
| | | **27,162,119** | **10,939,028** |

### 05.1. කල්බදු යටතේ ඇති ජෛව වත්කම් (ජනවසම)

| | 2023 රු. | 2022 රු. |
|---|---|---|
| ප්‍රත්‍යාගණිනය | | |
| මේරූ වගාවන් | 78,277,446 | 78,790,334 |
| ඉවත් කිරීම් සඳහා කරන ලද ගැලපීම් | (429,210.90) | (512,888) |
| | **77,848,235** | **78,277,446** |
| ජනවාරි 01 දා ට | 67,338,419 | 65,810,019 |
| වර්ෂයට ක්‍රමක්ෂය වීම | 1,887,827 | 2,041,287 |
| ඉවත් කිරීම් සඳහා කරන ලද ගැලපීම් | (429,211) | (512,888) |
| දෙසැම්බර් 31 දා ට | **68,797,035** | **67,338,419** |
| **පවත්වාගෙන යන වටිනාකම** | **9,051,201** | **10,939,028** |

වතු කල්බදු යටතේ සමාගමට භාර දෙන අවස්ථාවේ නොමේරූ වගාවන් සඳහා කළ ආයෝජනය (1992-06-11 දිනට ප්‍රත්‍යාගනිත) නොමේරූ වගා ලෙස දක්වා ඇති අතර වාර්තා කරන දින වන විට ඒවා සියල්ල මේරූ වගාවන්ට මාරු කර ඇත. තවද, සමාගම මේරූ සහ නොමේරූ වගාවන් වෙනුවෙන් සිදු කල ආයෝජනයන් කල්බදු දේපල සංවර්ධන සටහන් අංක 6 යටතේ දක්වා ඇත. මෙම මේරූ/නොමේරූ වගාවන් LKAS 41 කෘෂිකාර්ම නියමයන් යටතේ ජෛව වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

## ගිණුම්කරණ සටහන්

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

### 05.1.2. හිස් ඉඩම් වල කල්බදු අයිතිය ජනවසම පලෙයි වත්ත

පලෙයි වතු කලාපයේ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් (මේරූ වගා) 2023 පෙබරවාරි 09 දින සිට ජනවසම හා හලාවත වැවිලි සමාගම කල්බදු අත්සන් කල පසු සමාගමේ පොත් වලට ගෙන ඇත. මෙම වත්කම් වසර 30ක කාලයක් පුරා සමාන වටිනාකමින් ක්‍රමක්ෂය කරනු ලබයි.

කෙසේ වෙතත් මෙම වත්කම් පැවරෙන අවස්ථාව වන විට ගිණුම් වාර්තා වලට ගැනීම සඳහා එම වත්කම් වල පොත් අගය නොපවතී අතර වාර්ෂික බදු කුලිය හා 12.5% වූ ඇස්තමේන්තු ගත අනාගත වට්ටම් අනුපාතය පදනම් කරගන්මින් වත්කම් තක්සේරු කරන ලදී.

| පලෙයි පොල් ඉඩම් වටිනාකම | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ | - | - |
| එකතු කිරීම් | 18,666,656 | |
| **වසර අවසානයේදී** | **18,666,656** | **-** |
| ජනවාරි 1 දිනට | - | - |
| වර්ෂය සදහා ක්‍රමක්ෂය | 555,738 | - |
| ඉවත්කිරීම් සඳහා ගැලපුම් | | |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **555,738** | **-** |
| **පවත්වාගෙන යන වටිනාකම** | **18,110,918** | **-** |

## 06 කල්බදු දේපල සංවර්ධනය (ධාරක ජෛව වත්කම්)

| පිරිවැය | නොමේරූ වගා<br>රු. | මේරූ වගා<br>පොල්<br>රු. | මේරූ වගා<br>කජු<br>රු. | මේරූ වගා<br>වෙනත්<br>රු. | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|---|---|---|
| වර්ෂය ආරම්භයේදී | 237,365,906 | 811,456,212 | 100,026,612 | 7,968,053 | 1,156,816,784 | 1,102,278,731 |
| එකතු කිරීම් | 59,035,164 | | - | | 59,035,164 | 54,538,053 |
| නොමේරූ වලින් මාරු කිරීම් | | 55,790,869 | - | - | 55,790,869 | 109,982,407 |
| මේරූ වලට මාරු කිරීම | (55,790,869) | - | - | - | (55,790,869) | (109,982,407) |
| වත්කම් හානි වීම | - | (3,777,233) | - | - | (3,777,233) | - |
| **වර්ෂය අවසානයේදී** | **240,610,201** | **863,469,849** | **100,026,612** | **7,968,053** | **1,212,074,715** | **1,156,816,784** |
| ක්ෂයවීම | | | | | | |
| වර්ෂය ආරම්භයේදී | | 77,449,327 | 48,517,474 | 2,024,784 | 127,991,586 | 109,562,644 |
| වර්ෂය සඳහා | | 16,177,586 | 4,001,064 | 398,403 | 20,577,053 | 18,428,942 |
| වත්කම් හානි වීම | | (250,644) | | - | (250,644) | - |
| **වර්ෂය අවසානයේදී** | | **93,376,269** | **52,518,538** | **2,423,187** | **148,317,995** | **127,991,586** |
| **පවත්වාගෙන යන අගය** | **240,610,201** | **770,093,579** | **47,508,074** | **5,544,866** | **1,063,756,720** | **1,028,825,198** |
| **සිදුවෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු** | | | | | | |
| ජනවාරි 1 දිනට | | | | | - | - |
| වසර තුළ එකතු කිරීම් | | | | | 10,058,485 | - |
| වර්ෂය තුළ ප්‍රාග්ධනීකරණය සහ පිටතට මාරු කිරීම් | | | | | - | - |
| දෙසැම්බර් 31 දිනට | | | | | 10,058,485 | - |
| පවත්වාගෙන යන වටිනාකම | | | | | **1,073,815,205** | **1,028,825,198** |

## ගිණුම්කරණ සටහන්

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

සටහන:

මේවා සමාගම ස්ථාපිත කළ දින සිට මේරූ සහ නොමේරූ වගා සඳහා කළ ආයෝජනයි. කල්බදු යටතේ අත්පත් කර ගත් වත්කම් (වැවිලි වත්කම් ඇතුලත්ව) සටහන් අංක 4, සහ 5 යටතේ විදහා පෙන්වයි. තවදුරටත් කල්බදු පදනම යටතේ පවරාගත්නා ලද වත්කම් වල නොමේරූ වගාවන් වෙනුවෙන් කල ආයෝජනයන් මෙම සටහන තුල ඇතුලත් වේ. එවැනි වගා මේරූ තත්ත්වයට පැමිණි විට, මේරූ තත්වයට ගෙන ඒමට යෙදූ අමතර ආයෝජනය මෙම සටහන අනුව නොමේරූ සිට මේරූ කොටසට මාරු කර ඇත. ඒ අකාරයෙන්ම, ජනවසම කල්බදු පෙර කරන ලද ආයෝජනය වෙනුවෙන්ද නොමේරූ සිට මේරූ දක්වා මාරු වීම් වලට අදාල වෙනස්වීම සටහන් අංක 5.1 මගින් පෙන්වයි.

ජෛව වත්කම් ගිණුම්කරණ ප්‍රමිත අංක 41 හි දක්වා තිබූ පරිදි සාධාරන වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කර අගය හඳුනා ගැනීමේ අවශ්‍යතාවය 2012 මාර්තු 02 දින වරලත් ගණකාධිකාරි ආයතනයෙන් නිකුත් කළ නිර්දේශයන් හා නියමයන් මගින් අවලංගු වේ. ඒ අනුව සමාගම ජෛව වත්කම් අගය කිරීම සඳහා ගිණුම් කරන ප්‍රමිත අංක 16 -දේපල, පිරියත හා උපකරණ ප්‍රමිතයට අනුව පිරිවැය මත සිදු කරනු ලබයි.

වගා වියදම් මූල්‍යනය කිරීම සඳහා විශේෂිත ණය පහසුකම් ලබාගෙන නොමැත. එම නිසා ණය පිරිවැය වර්ෂය තුල නොමේරූ වගාවන් යටතේ ප්‍රාග්ධනිත කර නොමැත. (2023 නොමැත)

### 07.1 ජෛව වත්කම් - පශු සම්පත්

| | | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| කිරි පශු සම්පත් | 07.1.1 | 10,221,915 | 9,507,450 |
| වෙනත් පශු සම්පත් | 07.1.2 | 15,322,900 | 16,271,650 |
| | | **25,544,815** | **25,779,100** |

### 07.1.1 කිරි පශු සම්පත්

| | නොමේරූ දෙනුන්, පැටවු/ වැස්සියන්<br>රු. | මේරූ දෙනුන් (කිරි දෙන සහ නොදෙන දෙනුන්)<br>රු. | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|---|
| ජනවාරි 01 දා ට | 231,800 | 9,275,650 | 9,507,450 | 8,144,710 |
| වර්ෂය තුල එකතු වු | 166,000 | | 166,000 | 37,210 |
| වර්ෂය සාධාරණ අගයට ලද ලාභය/පාඩු | 912,888 | (112,189) | 800,699 | 3,371,630 |
| මාරු කිරීම් ඇතුළට / පිටතට | (30,468) | 200,779 | 170,311 | 149,672 |
| වෙනත් වතු වලින් මාරු කිරීම් | | 1,228,865 | 1,228,865 | (2,126,446) |
| මරණ / විකුණුම් | | (1,651,410) | (1,651,410) | (69,326) |
| දෙසැම්බර් 31 දා ට | **1,280,220** | **8,941,695** | **10,221,915** | **9,507,450** |

පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයෙන් විකුණුම් වියදම් අඩුකිරීමෙනි. පශු සම්පත් සාධාරණ වටිනාකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කළ චක්‍රලේඛයට අනුව තීරණය කරනු ලබයි.

### 07.1.2 වෙනත් පශු සම්පත් (ධාරක ජෛව වත්කම්)

| | මී හරක්<br>රු. | කරත්ත ගොන්නු<br>රු. | පට්ටි ගොන්නු<br>රු. | බැටළුවන්/ එළුවන්<br>රු. | එළ හරක්<br>රු. | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|---|---|---|---|
| | 8,100,000 | 3,172,150 | 299,700 | 4,522,000 | 177,800 | 16,271,650 | 6,757,090 |
| ජනවාරි 01 දා ට | 294,125 | | - | 251,200 | | 545,325 | 459,660 |
| | | | | | | 87,042 | |
| වර්ෂය තුල එකතු කිරිම් | 87,042 | | | | | | |
| මාරු කිරීම් ඇතුලට / පිටතට | (1,228,865) | | | - | | (1,228,865) | 2,126,446 |
| මරණ / විකුණුම් | (849,992) | (293,850) | | (1,024,300) | (13,000) | (2,181,142) | (1,814,938) |
| වර්ෂය තුල සාධාරණ අගය වැඩිවීම/(අඩුවීම) | 978,140 | (181,000) | 58,050 | 908,100 | 65,600 | 1,828,890 | 8,743,392 |
| | **7,380,450** | **2,697,300** | **357,750** | **4,657,000** | **230,400** | **15,322,900** | **16,271,650** |

### 7.2 පාරිභෝජ්‍ය ජෛව වත්කම් - දැව වගාව

| | 2023 රු. | | | 2022 රු. | | |
|---|---|---|---|---|---|---|
| | නොමේරූ | මේරූ | එකතුව | නොමේරූ | මේරූ | එකතුව |
| ජනවාරි 01 දිනට ශේෂය | 761,480 | 137,552,345 | 138,313,825 | 750,354 | 134,503,285 | 135,253,639 |
| සංවර්ධනය/ආයෝජනය මත සිදුවන වැඩිවීම | 282,784 | | 282,783.57 | 11,126 | | 11,126 |
| මාරු කිරීම් ඇතුළට / පිටතට | | - | - | | - | - |
| වටිනාකම අඩු වැඩිවීම තුල | | | | | | |
| හඳුනාගත් ලාභ හෝ අලාභ | | 14,346,672 | 14,346,672 | | 18,598,138 | 18,598,138 |
| දැව ගස් හෙළීම නිසා වූ වටිනාකමේ අඩුවීම | | (13,645,361) | (13,645,361) | | (15,549,078) | (15,549,078) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,044,263.91** | **138,253,656** | **139,297,920** | **761,480** | **137,552,345** | **138,313,825** |

ජෛව වත්කම් පරිවර්තනය මූල්‍යමය වටිනාකමක් දක්වා වර්ධනය වී නොමැති විට නොමේරූ දැව ගස් සඳහා වන පිරිවැය දළ සාධාරණ අගයක් වශයෙන් සැලකේ.

වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමවේදය යොදා ගනිමින් ඒ.ඒ.එම්. ෆර්තීහු මහතා විසින් අදාල තක්සේරුකරණය සිදු කර ඇත. දැව ගස් වල සාධාරණ අගය නිශ්චය කිරීමේදි සියළු වතු ආවරණය කරමින් භෞතික නිශ්චය කිරීමක් සිදු කරන ලදී.

තක්සේරුකරණයේදී යොදා ගැනුණ මූලික උපකල්පන

1. රාජ්‍ය දැව සංස්ථාවේ දැව මිල ලේඛණය පදනම් කරගෙන ඇත.

2. වියදම් අඩුකිරීමෙන් පසු ලැබෙන ශුද්ධ විකුණුම් මිල ගණනය කිරිම සඳහා යොදාගෙන ඇත.
3. වට්ටම් අනුපාතිකය
   - අස්වැන්න නෙලන වයස අවුරුදු 5 හෝ 5 ට අඩු 16%
   - අස්වැන්න නෙලන වයස අවුරුදු 6 ත් 15 ත් අතර 17%
   - අස්වැන්න නෙලන වයස අවුරුදු 15 හෝ ඊට වැඩි 18%
4. පරිනත වීමේ කාල සිමාව අවු 30 ක් ලෙස තක්සේරු කර ඇත.

ශුද්ධ වර්ථමාන වටිනාකම මත පදනම්ව බාහිර තක්සේරු කරණය දැව ගස් වල දිගු කාලින හානි වීම සැලකිල්ලට ගෙන ඇත. විචල්‍යන්ගේ වෙනස් වීම හේතුවෙන් සධාරණ අගය මත ජෛව වත්කම් තක්සේරු කිරීමේදී පවතින ඒ හා බැඳුනු අස්ථාවරත්වය හේතුවෙන් ඒවායේ පවතින වටිනාකම සත්‍ය වටිනාකමින් වෙනස්විය හැක.

සමාගම සිය දැව ගස් සම්බන්ධයෙන් පහත දැක්වෙන අවදානම් වලට නිරාවරණය වේ.

**නියාමන සහ පාරිසරික අවධානම**

සාමගම ශ්‍රී ලංකාවේ නීති රීති හා රෙගුලාසි වලට යටත්වේ. දේශිය පාරිසරික සහ වෙනත් නීති රීති වලට අනුකූලව කටයුතු කිරීම සඳහා සමාගම පාරිසරික ප්‍රතිපත්ති සහ ක්‍රියාදාමයන් පිහිටුවා ඇත. පාරිසරික අවදානම් හඳුනාගැනීම සඳහා කළමනාකාරිත්වය මගින් නිරන්තර විමර්ශනයන් සිදුකෙරේ.

**සැපයුම් සහ ඉල්ලුම් අවදානම**

දැව වල අලෙවි පරිමාවන් සහ මිල උච්චාවචනයන් සම්බන්ධ අවදානම් වලට සමාගම නිරාවරණය වේ. හැකි අවස්ථාවන්හිදී සමාගම මගින් සිය නිෂ්පාදන පරිමාව වෙළඳපොල ඉල්ලුම සහ සැපයුමට අනුව සකසමින් මෙම අවදානම කළමනාකරණය කරයි. සමාගමෙහි මිල ව්‍යුහය වෙළඳ පොළ මිල හා සමගාමී වන බවට සහ අපේක්ෂිත නිශ්පාදන පරිමාව වෙළඳපොල ඉල්ලුමට සරිලන පරිදි පවතින බව තහවුරු කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් විශ්ලේෂණාත්මක අධ්‍යනයෙන් සිදුකරනු ලබයි.

**දේශගුණ සහ වෙනත් අවදානම්**

සමාගමෙහි දැව ගස් කාලගුණ වෙනස්වීම්, රෝග සහ වෙනත් ස්වාභාවික ආපදාවන්ගේ අවදානමට ලක් වේ.

### 7.3 ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගය වෙනස් විම්

| | 2023 රු. | 2022 රු. |
|---|---|---|
| පාරිභෝජ්‍ය ජීවවිද්‍යාත්මක වත්කම් සාධාරණ අගය වෙනස් වීම් (සටහන් 7.2) | 14,346,672 | 18,598,138 |
| ධාරක ජීව විද්‍යාත්මක වත්කම් ඵලය නෙලීමට ඇති අස්වැන්නෙහි - සාධාරණ අගය වෙනස්වීම (සටහන් අංක 9.1) | (4,201,128) | (3,572,756) |
| | **10,145,544** | **15,025,382** |

## 08. සින්නක්කර දේපල, පිරියත හා උපකරණ

| | ගොඩනැගිලි රු. | පිරියත සහ යන්ත්‍ර රු. | මොටර් රථ රු. | උපකරණ රු. | ගෘහ භාණ්ඩ සහ මෙවලම් රු. | වැටවල් රු. | ජල සැපයුම් රු. | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය / තක්සේරුව** | | | | | | | | | |
| ජනවාරි 01 දා ට | 54,081,799 | 8,902,837 | 121,892,921 | 72,037,138 | 14,030,037 | 36,482,634 | 44,918,463 | 352,345,830 | 285,058,196 |
| එකතුකිරීම් | 1,063,996 | - | 3,399,000 | 5,735,685 | 705,840 | 6,446,925 | 30,508,653 | 47,860,099 | 67,287,635 |
| මාරු කිරීම්/ඉවත් කිරීම් | - | - | - | (71,800) | - | - | (21,800) | (93,600) | - |
| විකිණීම සඳහා රඳවා තබාගැනීම | | | (40,000) | | | | | (40,000) | - |
| නැවත ඇගයීම හේතුවෙන් මාරු කරන ලදී | | | - | | | | | - | - |
| නැවත ඇගයීම | | | - | | | | | - | - |
| දෙසැම්බර් 31 දා ට | 55,145,795 | 8,902,837 | 125,251,921 | 77,701,023 | 14,735,877 | 42,929,559 | 75,405,316 | 400,072,329 | 352,345,830 |
| **ක්ෂය වීම්** | | | | | | | | | |
| ජනවාරි 01 දා ට | 14,876,105 | 5,088,542 | 46,222,903 | 51,432,543 | 10,101,945 | 28,598,692 | 6,529,693 | 162,850,424 | 130,623,104 |
| වසරට අදාල වියදම් | 1,353,907 | 560,469 | 23,928,750 | 4,466,887 | 644,447 | 3,755,633 | 2,715,152 | 37,425,245 | 32,227,320 |
| මාරු කරීම්/ඉවත් කිරීම් | - | - | - | (18,509) | - | - | (2,180) | (20,689) | - |
| නැවත ඇගයීම හේතුවෙන් මාරු කරන ලදී | | | - | | | | | - | - |
| විකිණීම සඳහා රඳවා තබාගැනීම | | | (24,000) | | | | | (24,000) | - |
| දෙසැම්බර් 31 දා ට | 16,230,012 | 5,649,011 | 70,127,653 | 55,880,922 | 10,746,392 | 32,354,325 | 9,242,665 | 200,230,980 | 162,850,424 |
| **ශුද්ධ අගය** | | | | | | | | **199,841,349** | **189,495,407** |
| **ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ** | | | | | | | | | |
| ජනවාරි 01 දා ට | | | | | | | | 4,234,346 | 1,786,968 |
| වසර තුල එකතු කිරීම් | | | | | | | | 1,262,982 | 4,014,942 |
| වසර තුල ප්‍රාග්ධනිත කිරීම් / මාරු කිරීම් | | | | | | | | 3,911,631 | 1,567,564 |
| දෙසැම්බර් 31 දා ට | | | | | | | | 1,585,697 | 4,234,346 |
| පවත්වාගෙන යන වටිනාකම | | | | | | | | **201,427,046** | **193,729,753** |

**සටහන.**

ඉහත දක්වා ඇති වත්කම් යනු 1992 ජුනි මස 22 වන දින සමාගම අරඹන විට ගැසට් නිවේදනය මගින් සමාගමට පවරන ලද චංචල දේපල හා සමාගම ආරම්භයේ සිට ස්පෘශ්‍ය වත්කම් වලට සමාගම කරන ලද සියළු ආයෝජන වේ. වතු කල්බදු ක්‍රමය යටතේ පවරාගත් වත්කම් සටහන් අංක 4 සහ 5 හි දැක්වේ.

තවද මූල්‍ය කල්බදු යටතේ ජනවසම නිශ්චල වත්කම් සහ ස්පෘශ්‍ය වත්කම් මේරු සහ නොමේරු වගා හැර 1992 ජුනි මස 11 දිනට ජනවසම ශුද්ධ වටිනාකම මත පදනම්ව පොත් වලට ගෙන ඇත. මෙම වටිනාකම තනි තනි වත්කම් වලින් ලබා ගත නොහැක.

# ගිණුම්කරණ සටහන්

**දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

## 09. ධාරක ජෛව වත්කම් වලින් නෙලිමට ඇති අස්වනු හා තොග

### 09.1 ධාරක ජෛව වත්කම් වලින් නෙලිමට ඇති අස්වනු

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ වාර්ථා වී ඇති | 30,194,568 | 33,767,324 |
| සාධාරණ අගය වෙනස් වීම් විකුණුම් පිරිවැය අඩුකිරීමෙන් පසු | (4,201,128) | (3,572,756) |
| වර්ෂ අවසනට | **25,993,440** | **30,194,568** |

### 09.2 තොග

